# රණවිරුවා

2024 අගෝස්තු • 269 කලාපය




# CIMIC

## උද්‍යානය ජනතා අයිතියට

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.



# ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව

## අනුස්මරණ දේශනය





ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය මගින් සංවිධානය කරන ලද ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව අනුස්මරණ දේශනය ඉකුත් අගෝස්තු මස 09 වන දින එම බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පැවැත්විණ. සන්නාහ සන්නද්ධ බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව් එම් ප්‍රනාන්දු ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ගෞරවනීය ආරාධනයෙන් එම අවස්ථාවට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ දිවංගත ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ භාර්යාව වන ලලි කොබ්බෑකඩුව මහත්මිය ප්‍රධාන අමුත්තන් ලෙස එක්වූහ. එසේම, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ද ඊට විශේෂ ආරාධිතයකු ලෙස සහභාගී විය. එහිදී, ප්‍රධාන අමුත්තා විසින් රැස්ව සිටි පිරිස අමතමින් ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව යුද සෙන්පති මට්ටම වෙනුවෙන් සිදුකළ අසමසම මෙහෙවර පිළිබඳව අවධාරණය කළේය. පසුව දිවංගත ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සේවය සහ පරිත්‍යාගය සිහිගැන්වුණු විශේෂ වීඩියෝ පටයක් ද ප්‍රදර්ශනය කෙරුණු අතර, මේජර් ජෙනරාල් එන්ආර් මාරඹේ (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එහිදී දිවංගත ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ධෛර්යය සහ නායකත්වය පිළිබිඹු කරමින් අනුස්මරණ දේශනය සිදුකළේය.



# විරුවන් පෑ අභිමන් "මිත්‍ර ශක්ති"



ඉන්දු - ලංකා යුද්ධ හමුදාවන් අතර සුහදත්වය වර්ධනය කිරීම වෙනුවෙන් පැවැත්වූ "මිත්‍ර ශක්ති" 10 අදියර ඒකාබද්ධ යුද අභ්‍යාසයේ අවසන් අභ්‍යාසය මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසල් ක්‍රීඩාංගනයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු ගේ ප්‍රධානත්වයෙන් පසුගිය අගෝස්තු මස 23 වන දින පැවැත්විණි.





ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහ ඉන්දීය හමුදාව අතර සහයෝගීතාව ඇතිකිරීම හා බැඳීම ශක්තිමත් කිරීම සඳහා පවත්වන ලද මෙම අභ්‍යාසයේදී යුද බිමේ යොදාගත හැකි උපක්‍රම පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික පුහුණු පැවැත්විණ. මීට අමතරව, සහභාගී වූ දෙරටේ හමුදාවන් අතර මෙහෙයුම් හැකියාවන් ඉහළ නැංවීම සඳහා ද මෙම "මිත්‍ර ශක්ති" අභ්‍යාසය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ඒකාබද්ධ පුහුණුව තුළින් අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කරන අතර සාම්ප්‍රදායික යුද්ධයක ප්‍රතිත්‍රස්ත මෙහෙයුම් සිදුකිරීම පිළිබඳ හැකියාවන් ද වර්ධනය කරයි. මෙම අභ්‍යාස අතරතුරදී උපායශීලී දැනුම, උපායමාර්ගික අවබෝධය ලබාගැනීම සහ ඒවා හුවමාරු කර ගැනීමට ද අවස්ථාව හිමි වූ අතර, එමගින් හමුදාවන් අතර සූදානම සහ අනුවර්තනය වීමේ හැකියාව වැඩිදියුණු කිරීම රාජ්‍ය තාන්ත්‍රිකභාවය ශක්තිමත් කිරීම සහ ශක්තිමත් ආරක්ෂක සබඳතා ගොඩනැගීම සිදුකරනු ලබයි.



කර්නල් රවින්ද්‍ර අහ්ලාවට් ගේ නායකත්වයෙන් යුත් ඉන්දිය යුද්ධ හමුදා කණ්ඩායම මෙම අභ්‍යාසයට සහභාගී වූ අතර, ඊට සංස්කෘතික හා ක්‍රීඩා ඉසව් ද ඇතුළත් විය. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා සහභාගී වූ අතර, ඉන්දිය මහ කොමසාරිස්, සන්තෝෂ් ජා මහතා ඇතුළු නිලධාරීන් සහ සෙසු නිලයන් රැසක් ද සහභාගී වූහ.

# නොහැක්කක් නොමැති විරුවන්ගේ
# අභිමානවත් විසිරයාම







නිලධාරීන් 06 දෙනකු සහ සෙසුනිලයින් 125 දෙනකුගෙන් සමන්විත කමාන්ඩෝ පාඨමාලා අංක 51 හි විසිරයාම ඉකුත් අගෝස්තු මස 03 වන දින ඌව කුඩාඔය කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල් පරිශ්‍රයේ දී පැවැත්විණ. 1 බලකායේ බලකාධිපති සහ කමාන්ඩෝ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් පීජීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ ආරාධනයෙන් එම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය.










පාඨමාලාව සාර්ථකව අවසන් කළ නිලධාරීන් සහ සෙබළුන් හට ඔවුන්ගේ දෙමාපියන් සහ සමීපතම ඥාතීන් විසින් කමාන්ඩෝ නිල ලාංඡන පළඳවනු ලැබූහ. පසුව, යුද්ධ හමුදාධිපති, කමාන්ඩෝ රෙජිමේන්තු අධිපති ඇතුළු ආරාධිතයින් කිහිපදෙනකු විසින් විසිරයන නිලධාරීන් සහ සෙබළුන්ගේ අනන්‍යතාවය සහ වෘත්තීය ගරුත්වය සංකේතවත් කරමින් මෙරූන් හිස්වැසුම පළඳවනු ලැබූහ. එසේම, පාඨමාලාව පුරාවට සුවිශේෂී දක්ෂතා දැක්වූ අයවළුන් හට විශේෂ ත්‍යාග ප්‍රදානය කිරීම ද එහිදී සිදුවිය.

ඒ අනුව දක්ෂතම කමාන්ඩෝ භටයාට හිමි සම්මානය ලුතිනන් ජීසීඩී කාරියවසම් විසින් ද දක්ෂතම වෙඩික්කරුට හිමි සම්මානය ලුතිනන් ඊඩීසී ද සොයිසා විසින් ද හොඳම ශාරීරික යෝග්‍යතාවයෙන් යුතු සෙබළාට හිමි සම්මානය සාමාන්‍ය සෙබළ කුමාර පීකේකේඑස් විසින් ද හිමිකරගනු ලැබූහ.

විසිරයාමේ පෙළපාලියෙන් පසුව උත්සවය වර්ණවත් කරමින් තූර්ය වාදක සංදර්ශනයක් සහ රැප්ලිං සංදර්ශනයක් ද පැවැත්විණ. එම පුහුණු පාසල් පරිශ්‍රයේ පිහිටි පැරෂුට් පතිත කලාපයේදී කමාන්ඩෝ සාමාජිකයන් ඔවුන් සතු අසීමිත ශක්තිමත්භාවය, උපායමාර්ගික කුසලතාවයන් හා ප්‍රහාරක හැකියාවන් මනාව පිළිබිඹු කරමින් සැඟවුණු වෙඩික්කරුවන්ගේ ඉලක්කගත කිරීම, කමාන්ඩෝ භටයින් හසුරවන විශේෂ ආයුධ මගින් වෙඩි තැබීම්, ඔවුන්ගේ සැබෑ ආත්ම ආරක්ෂක සටන් ක්‍රම, වැදගත් පුද්ගලයින් ආරක්ෂා කිරීම, ත්‍රස්ත මර්ධන ක්‍රියාන්විත නිදසුන්, කමාන්ඩෝ සුනඛ (*K9*) සංදර්ශන සහ නිදහස් ආර පැරෂුට් සංදර්ශන ආදී අංග රැසකින් ද එම අභිමානවත් අවස්ථාව විචිත්‍රවත් විය.




අනතුරුව යුද්ධ හමුදාධිපති විසිරගිය කමාන්ඩෝ භටයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සමඟ සුහද කථාබහක නිරතව කමාන්ඩෝ විශ්වාසනීය පැනීමේ පුහුණු ප්‍රදේශයේ ඉදිකිරීම් ස්ථානය ද නිරීක්ෂණය කළේය.



මෙම අවස්ථාවට යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී සහ ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී, පූජ්‍ය පක්ෂය, ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්, ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන්, සිවිල් ප්‍රධානීන්, විසිරගිය භටයින්ගේ ඥාතීහු ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.









# කාන්තා ක්‍රිකට් ක්‍රීඩිකාවන් යුද්ධ හමුදාධිපතිගේ පැසසුමට

ආසියානු කුසලාන ක්‍රිකට් තරගාවලිය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කළ ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ සාමාජිකාවෝ පසුගියදා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු හමුවූහ. ඉකුත් අගෝස්තු මස 05 වන දින යුද්ධ හමුදාධිපති කාර්යාලයට පැමිණි එම පිරිස හමුවූ යුද්ධ හමුදාධිපති ආසියානු කුසලාන ක්‍රිකට් තරගාවලියේ දී දැක්වූ සුවිශේෂී දක්ෂතා වෙනුවෙන් ඔවුන් වෙත සිය සුභාශිංසන පුදකළේය.

2 ශ්‍රී ලංකා කාන්තා බලකායේ මාණ්ඩලික සැරයන් දසනායක ඩීඑම්එස්එම්කේ, මාණ්ඩලික සැරයන් කුලසූරිය ඩබ්ලිව්ජීජ්කේ, මාණ්ඩලික සැරයන් සිල්වා එන්එන්ඩී සහ 3 ශ්‍රී ලංකා කාන්තා බලකායේ කෝප්‍රල් සංජීවනී එම්ජ්ජ් එලෙස යුද්ධ හමුදාධිපති හමු වූ ක්‍රීඩිකාවෝ වූහ. එහිදී, ඔවුන්ගේ කැපවීම සහ නොපසුබට උත්සාහය නිසා ක්‍රිකට් ලෝලීන්ගේ ප්‍රසාදයට පමණක් නොව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට සහ මව්බිමට ද අභිමානයක් ගෙනදීම පිළිබඳ සිය ගෞරවය පිරිනැමූ යුද්ධ හමුදාධිපති එම කණ්ඩායම දිරිමත් කිරීම සඳහා මූල්‍ය පරිත්‍යාග සහ සමරු ඵලක ප්‍රදානයක් ද සිදුකරනු ලැබීය.



# නව ගෘහස්ත ක්‍රීඩාගාරයක් විවෘත කෙරේ

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 75 වන සංවත්සරයට සමගාමීව 553 වන පාබල බලසේනා පරිශ්‍රයේ ඉදිකළ නව ගෘහස්ත ක්‍රීඩාගාරය යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු ගේ සුරතින් ඉකුත් අගෝස්තු මස 25 වන දින විවෘත කෙරිණ.



යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු පීඑස්සී මගපෙන්වීම යටතේ 55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්කේඑන්සී ජයවර්ධන ආර්එස්පී එන්ඩීසී සහ 553 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ඩබ්ලිව්ජ්අයිඑස් මෙන්ඩිස් ආර්එස්පී යූඑස්පී විසින් මෙම ව්‍යාපෘතිය අධීක්ෂණය කරනු ලැබූහ. බලසේනාවේ සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයින්ගේ යහපැවැත්ම සහ ශාරීරික යෝග්‍යතාවය ඉහළ නැංවීම වෙනුවෙන් මෙම නව ගෘහස්ත ක්‍රීඩාගාරය ඉදිකෙරුණි.

# යුද්ධ හමුදාවේ වාර්ෂික "කොප්පරා" පූජාව මෙවරත්













ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සම්ප්‍රදායානුකූලව සිදුකරන කොප්පරා පූජාව අඛණ්ඩව 11 වෙනි වරටත් පසුගිය අගෝස්තු මස 01 වන දින පැවැත්විණ. එහිදී, කොප්පරා ටොන් 16 ක ප්‍රමාණයක් මහනුවර ශ්‍රී දළදා මාලිගාව මගින් වාර්ෂිකව පවත්වන ඇසළ පෙරහැර මංගල්‍යය ආලෝකමත් කිරීම සඳහා ප්‍රදානය කෙරිණ. යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ විජයබාහු පාබල රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එස්ආර්බී අළුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ උපදෙස් මත එම රෙජිමේන්තුවේ ප්‍රධානත්වයෙන් වාර්ෂිකව සිදුකෙරන මෙම මාහැඟි කටයුත්තට අනෙකුත් රෙජිමේන්තු වල සහාය ද හිමි වේ. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් එම කොප්පරා තොගය දියවඩන නිලමේ තුමන් වෙත සංකේතාත්මකව එහිදී භාරදෙන ලද අතර, එම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මිය සහ ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී ඇතුළු පිරිසක්ද සහභාගී වූහ.




# යුද්ධ හමුදාධිපති උතුරේ වැඩසටහන් රැසකට එක්වෙයි








ඉකුත් අගෝස්තු මස 25 වන දින යාපනය මධ්‍ය මහා විද්‍යාලයීය ක්‍රීඩාංගණයේ පැවති ක්‍රිකට් කුසලාන තරගාවලියේ දෙවන ලීග් තරගය සඳහා ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් එම්ජ්ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ ආරාධනයෙන් ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති, ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය. යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සහයෝගීතාවයෙන් යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ සම්බන්ධීකරණයෙන් මෙම තරගාවලිය සංවිධානය කෙරුණු අතර, සිවිල් ජනතාව අතර සුහදත්වය වර්ධනය කිරීම මෙහි අරමුණ විය.

එහිදී, තරගයේ ජයග්‍රහණය කිලිනොච්චි Geniuses කණ්ඩායමට හිමි වූ අතර ඔවුන් වෙත යුද්ධ හමුදාපතිවරයා විසින් ත්‍යාග සහ "පැල්මයිරා සමාජ අභියෝගතා කුසලානය" ප්‍රදානය කරන ලදී. ආඥාපති - උතුරු නාවික විධානය, උතුරු පළාත්භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ඇතුළු ආරාධිතයින් ද යුද්ධ හමුදා සහ සිවිල් ජනතාව විශාල පිරිසක් ද මෙම තරගාවලිය නැරඹීමට එක්වූහ. අනතුරුව, 51 වන පාබල සේනාංකය විසින් සංවිධානය කරන ලද දිවා භෝජන සංග්‍රහයකින් තරගයේ අවසානය සනිටුහන් විය.

එසේම, පලාලි ප්‍රදේශයේ අභිනවයෙන් ඉදිකරන ලද දැල්පන්දු සහ පාපන්දු තරග සඳහා පහසුකම් ඇතුළත් බහුවිධ ක්‍රීඩා පිටිය (CIMIC උද්‍යානය) විවෘත කිරීමට ද යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය එක්වූහ. එහිදී, යුද්ධ හමුදාධිපති එම උද්‍යානයේ නිරීක්ෂණ චාරිකාවක ද නිරත වූ අතර, සේවා වනිතා සභාපතිනි විසින් එහි සිසුන් සඳහා පාසල් උපකරණ ලබාදීමට ද කටයුතු කළාය.



# විරු දිරියෙන් නව සෙවණක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් යාපනයේ ඊව්නෙයි ප්‍රදේශයේ අභිනවයෙන් ඉදිකරන ලද නිවසක් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් ඉකුත් අගෝස්තු මස 25 වන දින නිවාසලාභීන් වෙත පවරාදෙන ලදී.

15 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ ශ්‍රම දායකත්වය මත ඉදිකරන ලද මෙම නව නිවස වෙනුවෙන් සුමි සින්නයියා මහතා ඇතුළු ඔහුගේ පවුලේ සාමාජිකයින් සහ Wanni Aid Canada සංගමය මූල්‍ය දායකත්වය ලබාදෙනු ලැබූහ. මෙම ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කරන ලද්දේ මේජර් ජෙනරාල් රවී රත්නසිංගම් (විශ්‍රාමික) විසිනි.



මෙම අවස්ථාවට ආරක්‍ෂක සේනා (යාපනය) ආඥාපති, 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 511 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ඇතුළු නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන් සහ සිවිල් වැසියෝ රැසක් ද එක්වූහ.

# කිලිනොච්චියේ CIMIC උද්‍යානය විවෘත කෙරේ





55 වන පාබල සේනාංකයේ සම්බන්ධීකරණයෙන් ඉදිකරන ලද කිලිනොච්චි CIMIC උද්‍යානය යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් ඉකුත් අගෝස්තු මස 25 වන දින නිල වශයෙන් විවෘත කරන ලදී. කිලිනොච්චිය ජනතාවගේ අධ්‍යාපන සහ සමාජයීය අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම පහසුකම ස්ථාපිත කර ඇති අතර, සිසුන්ගේ අධ්‍යාපනයට සහ අධ්‍යාපන ආයතනවලට අත්‍යවශ්‍ය සහයෝගය ලබාදීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය.

මෙම උද්‍යානයේ නොමිලේ Wi-Fi පහසුකම්, අධ්‍යයන කලාප, සනීපාරක්‍ෂක පහසුකම්, පිරිපහදු කරන ලද ජලය වැනි පහසුකම් වලින් සමන්විත වන අතර, මෙය ප්‍රදේශයේ දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය වර්ධනය කිරීම වෙනුවෙන්ම නිර්මාණය කර ඇති මහගු තෝතැන්නකි. උත්සවයේ සමාරම්භක අවස්ථාවෙන් පසුව අනෙකුත් සම්භාවනීය ආරාධිතයින් සමඟ යුද්ධ හමුදාපති එම පරිශ්‍රයේ නිරීක්ෂණ සංචාරයක නිරත වෙමින් එහි පැමිණ සිටි දරු දැරියන් සමග සුහද පිළිසඳරක නිරත වන්නට ද අමතක නොකළේය. අනතුරුව, යුද්ධ හමුදාධිපති විසින් දරු දැරියන් වෙත ත්‍යාග පාර්සල් ද බෙදාදෙන ලදී.

ආරක්‍ෂක සේනා ආඥාපති - යාපනය මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ අදහසකට අනුව මෙම CIMIC උද්‍යාන ව්‍යාපෘතිය ඉදිකරනු ලැබූ අතර, 55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්කේඑන්සී ජයවර්ධන ආර්එස්පී එන්ඩීසී ගේ මඟපෙන්වීම යටතේ 551 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ඩීකේසීඑල් පෙරේරා ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී ගේ අධීක්‍ෂණයෙන් එහි කටයුතු අවසන් කෙරිණ. 7 ශ්‍රී ලංකා පාබල හමුදාව, 11 ඉංජිනේරු සේවා රෙජිමේන්තුව සහ 11 (ස්වේච්ඡා) ගජබා රෙජිමේන්තුවේ භට පිරිස් මෙය ඉදිකිරීම සඳහා ශ්‍රම දායකත්වය සහ තාක්ෂණය ලබාදුන්හ. මෙම සමාරම්භක උත්සවයට 1 බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් පීජීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, නිලධාරීන්, සෙසුනිලයන්, ගුරුවරුන්, දරු දැරියන් සහ ප්‍රාදේශීය ප්‍රජා නියෝජිතයින් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

# කිලිනොච්චියේ නිවාස අවශ්‍යතා ඇති පවුලක් වෙනුවෙන් නව නිවසක්



කිලිනොච්චියේ ධර්මපුරම් ප්‍රදේශයේ නිවාස අවශ්‍යතා ඇති පවුලක් වෙනුවෙන් අභිනවයෙන් ඉදිකරන ලද නිවසක් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අගෝස්තු මස 25 වන දින එම නිවාසලාභීන් වෙත ප්‍රදානය කරන ලදී.

යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු පීඑස්සී ගේ මඟපෙන්වීම මත 55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්කේඑන්සී ජයවර්ධන ආර්එස්පී එන්ඩීසී ගේ අධීක්ෂණයෙන් ඉදිකළ මෙම නිවස සඳහා 6 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සහ 14 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ හටපිරිස් ශ්‍රම දායකත්වය සහ තාක්ෂණික සහය ලබාදුන්හ.



මෙහි ඉදිකිරීම් කටයුතුවලදී 553 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ඩබ්ලිව්ජ්අයිඑස් මෙන්ඩිස් ආර්එස්පී යූඑස්පී විසින් එම ව්‍යාපෘතිය සඳහා හටපිරිස් යොමුකරමින් නියමිත කාලසීමාව තුළ නිවාසයේ වැඩකටයුතු අවසන් කරගැනීමට කටයුතු සලසා තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය අනුග්‍රාහක දායකත්වය නිහාල් ධර්මබන්දු මහතා ඇතුළු පවුලේ සාමාජිකයින් විසින් ලබාදෙන ලදී.

# ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු සැසියක්



අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එස්ජ්එන්ඩී එදිරිසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එච්ඩීඑම්සී පීඑස්සීගේ මඟපෙන්වීම යටතේ පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය, යුධෝපකරණ සේවා අධ්‍යක්ෂක මණ්ඩලය හා යුධෝපකරණ පුහුණු පාසල සම්බන්ධීකරණයෙන් සංවිධානය කළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු සැසියක් ඉකුත් ජූලි 24 හා 25 යන දෙදින තුළ යුද්ධ හමුදා මූලස්ථානයේදී පවත්වන ලදී. මෙහි ආරම්භක දේශනය යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එස්ආර්බී අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු පීඑස්සී විසින් සිදුකළ අතර, එහි අරමුණ පිළිබඳව යුධෝපකරණ සේවා අධ්‍යක්ෂක බ්‍රිගේඩියර් බීආර්ජ් ජයරත්න යූඑස්පී ඒට්ඕ විසින් පැහැදිලි කරන ලදී.



මෙම පුහුණු සැසියේ දේශනයන් කර්නල් ඩීඩී වරුෂවිතාන, ලුතිනන් කර්නල් ඩබ්ලිව් එස්ඩී ප්‍රනාන්දු එල්එස්සී ඒට්ඕ, ලුතිනන් කර්නල් එස්ඩී රංගේ යූඑස්පී එල්එස්සී ඒජ්ට්ඕ සහ මේජර් කේඑම්ටීආර් උලපනේ යූඑස්පී පීඑස්සී ඒට්ඕ විසින් සිදුකළ අතර යුද්ධ හමුදා මූලස්ථානයෙහි රාජකාරී සිදුකරනු ලබන මානි 1 සහ මානි 2 නිලධාරීන් 96 දෙනෙක් මේ සඳහා සහභාගී වූහ. මෙම පුහුණු සැසිය තුළින් ප්‍රසම්පාදන ක්‍රියා පිළිවෙත හැඳින්වීම, මිල ගණන් කැඳවීමේ දැන්වීම/ මිල ගණන් පත් හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශය, මිල ගණන් පත් විවෘත කිරීම, නියැදියන් ලබාගැනීම, කාර්මික ඇගයීම් කමිටු පත්කිරීම හා එහි කාර්යභාරය, මුදල් ප්‍රතිපාදන සීමාවන්, භාණ්ඩ සැපයීම, මිල ගණන් නැවත කැඳවීම හා විද්‍යුත් ප්‍රසම්පාදන පිළිවෙත පිළිබඳ හඳුන්වාදෙන ලදී.



# මොන්ටානා ප්‍රාන්ත ජාතික ආරක්ෂක බලකායේ ජ්‍යෙෂ්ඨ නායකයින්ගේ හමුවක්



එක්සත් ජනපදයේ මොන්ටානා ප්‍රාන්ත ජාතික ආරක්ෂක බලකායේ විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් පීටර් ජේ හොනෙක් ගේ ප්‍රධානත්වයෙන් යුත් දූත පිරිසක් ඉකුත් අගෝස්තු මස 07 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවූහ. ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සිව් දෙනකුගෙන් සමන්විත එම දූත පිරිස, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සමඟ එක්ව මානුෂීය ආධාර සහ ආපදා සහන සැලසීමේ සැලසුම් සකස් කිරීම ඇතුළුව හමුදා සබඳතා සහ අන්‍යෝන්‍ය ආරක්ෂක සහයෝගීතාවයන් වැඩිදියුණු කිරීම පිළිබඳව යුද්ධ හමුදාධිපති සමඟ සාකච්ඡා කළහ.





# කොරියානු ආරක්ෂක උපදේශක යුද්ධ හමුදාධිපති හමුවෙයි



ශ්‍රී ලංකාවේ කොරියානු ජනරජයේ තානාපති කාර්යාලයේ නව ආරක්ෂක උපදේශක ලුතිනන් කර්නල් හැන් ජොං හුන් ඉකුත් අගෝස්තු මස 07 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවිය. යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදු වූ මෙම සුහද පිළිසඳරේදී රටේ යහපත වෙනුවෙන් රට පුරා යුද්ධ හමුදාව විසින් ඉටුකරනු ලබන මෙහෙවරට ආරක්ෂක උපදේශකතුමන් සිය ප්‍රසාදය පළ කළේය. එහිදී, දෙරට අතර වසර ගණනාවක් තිස්සේ පවතින යහපත් සබඳතා සිහිපත් කළ යුද්ධ හමුදාධිපති ඉදිරියේදී එම සහයෝගීතාවන් තවදුරටත් වර්ධනය කර ගැනීමේ අවශ්‍යතාවය ද අවධාරණය කළේය.

# ගලබොඩ ඥාණිස්සර නාහිමියන්ගේ දේහයට අවසන් ගෞරව



ගංගාරාමයේ පොඩි හාමුදුරුවෝ නමින් ප්‍රසිද්ධව සිට, වසර 81 ක් ආයු වළඳා ඉකුත් අගෝස්තු මස 04 දින අපවත් වී වදාළ පූජ්‍ය ගලබොඩ ඥාණිස්සර නාහිමියන්ගේ දේහයට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මිය සිය අවසන් ගෞරව දැක්වූහ.

# යාපනය ආරක්ෂක සේනා ආඥාපති හමු වූ කීර්තිමත් ගායිකාව



කීර්තිමත් ගායිකාවක වන ආචාර්ය සුජාතා අත්තනායක මහත්මිය ඉකුත් අගෝස්තු 04 වන දින පලාලි CIMIC උද්‍යානයේදී පැවති සංගීත සන්ද්‍යාවකට සහභාගී වූ අතරතුර යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්ජ්ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී සිය කාර්යාලයේදී හමුවූවාය. මෙම සංගීත වැඩසටහන ඇයගේ පුතණුවන් වූ ශ්‍රී ලංකා පාබල හමුදාවේ දිවංගත කපිතාන් ඒඑම්සීඑස් අත්තානයක වෙත උපහාර දැක්වීම සඳහා සංවිධානය කර තිබුණි. එම සංචාරය සංකේතවත් කරමින් ආඥාපති විසින් එතුමිය වෙත විශේෂ සමරු තිළිණයක් ද ප්‍රදානය කරන ලදී.

# ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව යුධ සෙන්පතියාගේ 32 වැනි ගුණ සැමරුම





ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී සෙන්පතිදුන්ගේ 32 වැනි ගුණානුස්මරණය කයිට්ස් හි අරාලි තුඩුවේ පිහිටි ස්මාරකය අසලදී ඉකුත් අගෝස්තු මස 08 වන දින පැවැත්විණ.

යාපනය ආරක්ෂක සේනා ආඥාපති ප්‍රධාන අමුත්තා ලෙස එක්වූ මෙම අභිමානවත් උත්සවය 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීජේකේ විමලරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ සංවිධානය කෙරිණ.

1992 අගෝස්තු මස 08 වන දින යාපනය අරාලි තුඩුවේදී බිම් බෝම්බයකට හසුවීමෙන් මේජර් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී, මේජර් ජෙනරාල් විජය විමලරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී ඇතුළු විරුවන් පිරිසක් ඉතා අවාසනාවන්ත ලෙස ජීවිතක්ෂයට පත්විය. එම සිද්ධිය සිදුවූ තැන ඉදිකොට ඇති රණවිරු ස්මාරකය අභියස මෙම සැමරුම් උත්සවය වාර්ෂිකව සිදුකරනු ලබයි.



# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සහකාර ආරක්ෂක උපදේශක සමඟ හමුවක්



ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලයේ සහකාර ආරක්ෂක උපදේශක ලුතිනන් කර්නල් මන්දීප් සිං නේගි ඉකුත් අගෝස්තු මස 01 වන දින ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ජ් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී හමුවිය. එහිදී දෙරට අතර බැඳීම වැඩිදියුණු කිරීම සඳහා ද්විපාර්ශ්වික සබඳතා සහ හමුදා රාජ්‍ය තාන්ත්‍රිකභාවය ශක්තිමත් කිරීමේ වැදගත්කම පිළිබඳව ද සිවිල් හමුදා සහයෝගීතාවය, සමාජ සුබසාධන ව්‍යාපෘති සහ නැගෙනහිර ප්‍රදේශයේ සංවර්ධනය පිළිබඳව ද සාකච්ඡා කළහ.

## පාසල් උපකරණ පරිත්‍යාගයක්








ආර්ථික දුෂ්කරතාවන්ට මුහුණදෙන සිසු සිසුවියන්ට උපකාර කිරීමේ අරමුණින් 12 ගැමුණු හේවා බලකායේ හටපිරිස් ඉකුත් ජූලි මස 19 වන දින අරලගංවිල මහවැලි ප්‍රතිභා රංග ශාලාවේ දී පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් පවත්වනු ලැබිය. මෙම වැඩසටහනේදී සිසුන් 165 දෙනකුට පාසල් පොත්පත් බෙදාදීමට අමතරව යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාව විසින් ගුරු භවතුන්, දෙමව්පියන් සහ සිසු සිසුවියන් සඳහා දිවා භෝජන සංග්‍රහයක් ද පවත්වන ලදී.

මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ජ් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී සහභාගි වූ අතර, ආචාර්ය සංජීව රාජපක්ෂ, ජාලිය බෝදින්නාගොඩ, හිරන්ද සිල්වා සහ විපුල පෙරේරා යන මහත්වරු එම සත්කාරය සඳහා මූල්‍ය දායකත්වය දැක්වූහ.



# සංචාර සටහන්

ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ඉකුත් අගෝස්තු මස 05 වන දින මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංචාරයක නිරත විය. එහිදී, දිස්ත්‍රික් ලේකම් ඒ උමා මහේෂ්වරන් මහතා හමුවී සුහද කතාබහක ද නිරත වූ හෙතෙම කුරුඳුමලේ ප්‍රදේශයේ පිහිටි පුරාවිද්‍යා භූමිය නැරඹීමට ද එක්විය.









වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී තම ධුරයෙහි රාජකාරී භාර ගැනීමෙන් පසු ඉකුත් අගෝස්තු 06 වන දින ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) හා ඒ යටතේ පාලනය වන භකාස ඒකක, යුද්ධ හමුදා රෝහල (මුලතිව්) ඇතුළු ස්ථාන රැසක සංචාරය කළේය. එහිදී, ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) වැඩබලන ආඥාපති කර්නල් ඩීබීසී ජයසිංහ ආර්එස්පී පීඑස්සී ඇතුළුව මාණ්ඩලික නිලධාරීන් සහ ඒකක අණදෙන නිලධාරීන් ආඥාපති පිළිගනු ලැබූහ. අනතුරුව එහි නිලධාරීන් සමඟ සාකච්ඡාවක නිරත වූ ආඥාපති එම භටපිරිස් අමතන්නටද කටයුතු කළේය.





ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී ඉකුත් අගෝස්තු මස 06 සහ 07 යන දිනවල 12 වන පාබල සේනාංකයේ සංචාරයක නිරතවිය. එහිදී, එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීකේඩබ්ලිව්ඩබ්ලිව්එම්ජේඑස්බීඩබ්ලිව් පල්ලෙකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී. විසින් ආඥාපති උණුසුම් අයුරින් පිළිගනු ලැබූ අතර, 12 බලඇණිය ගජබා රෙජිමේන්තුවේ හටපිරිස් එතුමන් වෙත හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ ගෞරවාචාරය ද පුදකළහ. අනතුරුව ආඥාපති එහි හටපිරිස් ඇමතීමෙන් පසු සියලු නිල තේ පැන් සංග්‍රහයකට ද සහභාගී වී ඔවුන් හා සුහද කතාබහක ද නිරතවූහ.

සිය සංචාරයේ දී වැඩසිටිකන්ද විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ ද බැහැදුටු ආඥාපති අනතුරුව, 121 හා 122 වන පාබල බලසේනාවල මෙන්ම 20 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ හටපිරිස්වල රාජකාරී ස්වභාවය හා ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳව ද සොයාබැලීය.



1 බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් පීජීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී 58 වන පාබල සේනාංකයේ ස්ථාපිත 583 වන පාබල බලසේනාවේ සහ 1 බළඇණිය ගජබා රෙජිමේන්තුවේ සංචාරයක නිරතවිය. එහිදී, බලකාධිපති හටපිරිස් අමතමින් ඔවුනගේ පුහුණුව සහ විනය පවත්වාගැනීම සාමය ආරක්ෂා කිරීම සහ උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීමේ වැදගත්කම අවධාරණය කළේය. තවද, සෙබළුන්ගේ පාලන කටයුතු නිසි ලෙස සිදුකරන ලෙස එහි බලධාරීන් වෙත උපදෙස් ලබාදුන් හෙතෙම බලසේනාවේ කැරලි මර්දන කණ්ඩායම් සහ ඊට අදාල උපකරණවල තත්ත්වය ද පරීක්ෂා කළේය.







# අසමසම සෙන්පතිගේ අභිමානවත් ගුණ සැමරේ

ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව යුද සෙන්පතියාගේ 32 වැනි ගුණානුස්මරණය අනුරාධපුර ස්ථාපිත කොට ඇති එතුමන්ගේ පිළිරුව අභියසදී ඉකුත් අගෝස්තු මස 08 වන දින ආරක්‍ෂක සේනා (බටහිර) ආඥාපති සහ සන්නාහ සන්නද්ධ බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්එම් ප්‍රනාන්දු ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. බෞද්ධ ආගමික වතාවත් මධ්‍යයේ පැවති මෙම සැමරුම් උත්සවයට ලලී කොබ්බෑකඩුව මහත්මිය ඇතුළු පවුලේ සාමාජිකයින් සමගින් නිලධාරීන්, සෙසුනිලයින් රැසක් ද එක්වූහ.

# සුහද හමුවක්



බදුල්ල දිසාව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සුජිත් වෙදමුල්ල ඉකුත් ජූලි 23 වන දින ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී හමුවිය. එම ආරක්‍ෂක සේනා මූලස්ථානයේදී සිදුවූ මෙම හමුවේදී ප්‍රදේශයේ ආරක්‍ෂක තත්ත්වය හා ජන ජීවිතය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට අදාල කරුණු රැසක් පිළිබඳ දෙදෙනා සුහද පිළිසඳරක නිරතවූහ.

# හබරකඩ "ක්‍රියේටර්ස් ෆෝජ්" නැවත ආරම්භ කෙරේ






හබරකඩ ඉංජිනේරු සේවා මධ්‍යම වැඩපලෙහි සිහිවටන සහ කලා නිර්මාණ ප්‍රදර්ශනාගාරයක් වන "*Creators Forge*" ප්‍රදර්ශනාගාරය නැවත එළිදැක්වීම ඉකුත් අගෝස්තු 15 වන දිනට යෙදුණු සුබ මොහොතින් සිදුකෙරිණ. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා වශයෙන් යුද සේවා ලේකම් සහ ඉංජිනේරු බලකා කර්නල් සේනාධිනායක මේජර් ජෙනරාල් අයිඑන්බී පෙරේරා ආර්ඩබ්ලිව්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී සහභාගී විය.

# "වෙස්ට් කොටේජ්" නිවාඩු නිකේතනය විවෘත කෙරේ





පාලින්දනුවර "පර්ල් එජ්" නිවාඩු නිකේතනයෙහි "වෙස්ට් කොටේජ්" කොටස ඉකුත් අගෝස්තු 15 වන දින යුද සේවා ලේකම් සහ ඉංජිනේරු සේවා බලකා කර්නල් සේනාධිනායක මේජර් ජෙනරාල් අයිඑන්බී පෙරේරා ආර්ඩබ්ලිව්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරිණ. 4(සේවා) ඉංජිනේරු සේවා රෙජිමේන්තු භටපිරිස් මෙම නිවාඩු නිකේතනයේ ඉදිකිරීම් කටයුතු සඳහා ශ්‍රම දායකත්වය ලබාදුන්හ.

# නව ජල පිරිපහදු යන්ත්‍රය ජනතා අයිතියට





223 වන පාබල බලසේනාධිපතිගේ උපදෙස් මත 6 සන්නාහ සන්නද්ධ බලකා අණදෙන නිලධාරීගේ අධීක්ෂණය යටතේ නවීකරණය වූ තාවුල්වැව යුද්ධ හමුදා කඳවුරේ ජල පිරිපහදු යන්ත්‍රය ඉකුත් අගෝස්තු මස 17 වන දිනට යෙදුණු සුබ මොහොතින් විවෘත කෙරිණ. බම්බලපිටිය රාජා ජුවලර්ස් කළමනාකරණ අධ්‍යක්ෂක අතුල එලියපුර මහතාගේ සහ එහි කාර්ය මණ්ඩලයේ මූල්‍ය පරිත්‍යාගයෙන්, ශ්‍රී ලංකා නාවික හමුදාවේ තාක්ෂණික දායකත්වය මත ඉදිවූ මෙම ජල පිරිපහදු යන්ත්‍රය විවෘත කිරීමේ අවස්ථාවට 22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීඑච්එම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී, බම්බලපිටිය රාජා ජුවලර්ස් කළමනාකරණ අධ්‍යක්ෂ ඇතුළු යුද්ධ හමුදා සාමාජිකයින් පිරිසක් සහභාගී වූහ.

# සංචාරයක මතක සටහන්




21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්එස්සීකේ වනසිංහ ආර්එස්පී යූඑස්පී ඉකුත් ජූලි 15 වන දින 212 වන පාබල බලසේනාව යටතේ ඇති 7 (සෙව්) සන්නාහ සන්නද්ධ බළඇණිය සහ 4 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ සංචාරයක නිරත විය. මෙම අවස්ථාවට 212 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ආර්එම්සී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, ඒ යටතේ ඇති ඒකක අණදෙන නිලධාරීවරු, අනෙකුත් නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# නිරීක්ෂණ චාරිකාවක මතක සටහන්




ශ්‍රී ලංකා යුද්ධ හමුදා හටකාර්ය සම්පාදක අණසක මූලස්ථානයේ ආඥාපති මේජර් ජෙනරාල් ඊඑම්එම් ප්‍රනාන්දු එච්ඩීඑම්සී එල්එස්සී ඒඒට්ඕ ඉකුත් අගෝස්තු මස 07 වන දින ඉංජිනේරු සේවා බලකායේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය. සිය සංචාරයේදී එම බලකායේ වත්මන් සහ ඉදිරි මෙහෙයුම් පිළිබඳව ඇති සූදානම සොයාබැලූ හෙතෙම සැපයුම් සහ ඉංජිනේරු මෙහෙයුම් අංශයේ මෑත කාලීනව සිදු වූ වර්ධනය සහ ඊහා සම්බන්ධ ගැටලු විසඳීම පිළිබඳව ද නිලධාරීන් සහ සෙසු නිලයන් සමඟ සාකච්ඡා කළේය.

# මූලික ආපදා ප්‍රතිචාර පුහුණු පාඨමාලා අංක 23 සාර්ථකව අවසන්




මූලික ආපදා ප්‍රතිචාර පුහුණු පාඨමාලා අංක - 23, ගම්පොල ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආපදා ප්‍රතිචාර පුහුණු මධ්‍යස්ථානයේදී ඉකුත් අගෝස්තු මස 14 වන දින අවසන් විය. මෙම පුහුණු පාඨමාලාව ඉකුත් ජූලි මස 08 වන දින සිට අගෝස්තු මස 14 වන දින දක්වා නිලධාරීන් 06 දෙනකු සහ සෙසුනිලයින් 197 දෙනකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලද අතර, පාඨමාලාවේ පළමු ස්ථානය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ 2/ලුතිනන් ජේඑල්පී ඉරුන්දික වෙත හිමිවිය. මෙම පාඨමාලාවේ සමාප්ති දේශනය එම පුහුණු පාසලේ සේනාවිධායක කර්නල් ආර්එම්එච්පීකේ රත්නායක විසින් සිදුකරන ලදී.





# අභිමන් මෙහෙයකට විරුවන් පෙරට











ප්‍රතිත්‍රස්ත යුද උපක්‍රම හා කැලෑබද සටන් පුහුණු පාඨමාලා නිලධාරි අංක - 34, සෙසුනිල අංක - 37 සහ විශේෂ පාබල ක්‍රියාන්විත පාඨමාලාව අංක -76 යන පාඨමාලා හැදෑරූ නිලධාරීන් 56 දෙනකු සහ සෙසුනිලයන් 246 දෙනකුගේ විසිර යාමේ පෙළපාලිය ඉකුත් ජූලි මස 31 වන දින මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේ දී පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස අධ්‍යක්ෂ ජෙනරාල් පාබල සහ ගැමුණු හේවා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්බී වෙලගෙදර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී සහභාගී විය.

# "කනිෂ්ඨ උපදේශක පාඨමාලා අංක - 104" සමාප්තිය





අම්පාර සටන් පුහුණු පාසලේ දී පැවති "කනිෂ්ඨ උපදේශක පාඨමාලා අංක - 104" සහතිකපත් ප්‍රදානය කිරීමේ උත්සවය ඉකුත් අගෝස්තු මස 05 වන දින පැවැත්විණි. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස සටන් පුහුණු පාසලේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහභාගී විය. යුද්ධ හමුදාවේ විවිධ රෙජිමේන්තුවලට අයත් කොමිෂන් නොලත් නිලධාරීන් 44 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මාස තුනක කාලයක් පුරා මෙම පාඨමාලාව පැවැත්විණි. එහිදී, පාඨමාලාවේ දක්ෂතම ශිෂ්‍යාව ලෙස 1 වන යුද්ධ හමුදා කාන්තා බලකායේ කෝප්‍රල් කරුණාධිපති කේකේඑම්ඒඑන් විසින් සහතික හිමිකරගන්නා ලදී.

# අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලයේ හටපිරිස් හමුව



අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ සහ ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් අගෝස්තු 21 දින අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය. එහිදී, අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන වරලත් ගණකාධිකාරී කර්නල් ඕආර් රාජසිංහ විසින් අනුමත වාර්ෂික විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ ඉදිරි සැලසුම් සම්බන්ධයෙන් ද කරුණු පැහැදිලි කරන ලදී.

# රණවිරු දැනුමට හරවත් දේශනයක්





කාන්තාවන්ට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය අවම කිරීම පිළිබඳ දේශනයක් ඉකුත් ජූලි මස 31 වන දින 2 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකායේදී පැවැත්විණ. රාජ්‍ය ආයතන තුළ සමානාත්මතාවය සහ යුක්තිය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන අතුරුගිරිය පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිනි ප්‍රධාන පොලිස් පරීක්ෂක යෙස්මින් රානි මහත්මිය විසින් පවත්වනු ලැබුවාය. මෙම වැඩමුළුව සඳහා නිලධාරීන් 06 දෙනෙක් සහ සෙසු නිලයෝ 89 දෙනෙක් සහභාගී වූහ.

# කාලීනව මතුවන අභියෝග පිළිබඳ දැනුවත් කිරීමක්





ආරක්ෂක සේනා (බටහිර) ආඥාපතිගේ මඟපෙන්වීම යටතේ නීති සේවා, මානව හිමිකම් සහ මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙය වූ දේශනයක් ඉකුත් අගෝස්තු මස 16 වන දින පනාගොඩ, යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගනයේ දී පැවැත්විණ. කාලීනව මතුවන අභියෝග, උපාය මාර්ගිකව ජයගැනීම, මැතිවරණ කාලසීමාව තුළදී යුද්ධ හමුදා සාමාජිකයින්ගේ වගකීම් සහ නීති විරෝධී මත්ද්‍රව්‍ය හා ඒ සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳ ගැටලු ඇතුළු විවිධ මාතෘකා ඔස්සේ නීතිඥ කේඑස් හර්ෂාන් පෙරේරා මහතා විසින් එම වැඩසටහන මෙහෙයවන ලදී. මෙම දේශනය සඳහා පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ නිලධාරීන් 50 දෙනකු සහ සෙසුනිලයෝ 1400 ක් සහභාගී වූහ.





## ඉංජිනේරු සේවා බලකායට අභිමානවත් ඇරඹුමක්

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ ජෙනරාල් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මාධ්‍ය ප්‍රකාශක මේජර් ජෙනරාල් කේඑන් රසික කුමාර එන්ඩීසී පීඑස්සී, ඉංජිනේරු සේවා බලකායේ 16 වන කර්නල් සේනාවිධායක ලෙස ඉකුත් අගෝස්තු 20 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී වැඩ භාරගනු ලැබීය. මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් කේවල් මුණසිංහ යූඑස්පී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ රෙජිමේන්තුව වෙත සපැමිණි නව කර්නල් සේනාවිධායක වෙත කඳවුරු සම්මාන මුරයක්ද පිරිනැමිණ. එහිදී, ඉංජිනේරු සේවා බලකායේ දිවිපිදූ අභීත රණවිරුවන්ට උපහාර දක්වමින් රණවිරු ස්මාරකය අභියස පුෂ්පෝපහාරය පුදකළ හෙතෙම ආගමික වතාවත් මධ්‍යයේ සිය තනතුරේ රාජකාරී භාරගත්තේය. අනතුරුව උත්සවයට සහභාගී වූ නිලධාරීන් සමග සමූහ ඡායාරූපයකට ද පෙනීසිටි කර්නල් සේනාවිධායක එහි නිලධාරීන් සහ සෙසුනිලයින් අමතමින් තම ඉදිරි සැලසුම් සහ රාජකාරී පිළිබඳව දැනුවත් කරන්නට ද කටයුතු කළේය. තවද, තේ පැන් සංග්‍රහයකට සහභාගී වෙමින් ඔහු හටපිරිස් සමග සුහද කතාබහක නියැලෙන්නට ද අමතක නොකළේය.

## විශේෂ මූලික යාන්ත්‍රික බෝට්ටු සහ ඔරු පුහුණු පාඨමාලාවක්



61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑච්එම්එස් වික්‍රමරත්න ආර්එස්පී ගේ මගපෙන්වීම යටතේ නිලධාරීන් සහ සෙසු නිලයන් 68 දෙනකු සඳහා විශේෂ මූලික යාන්ත්‍රික බෝට්ටු සහ ඔරු පුහුණු පාඨමාලාවක් පැවැත්විණ. ඉකුත් අගෝස්තු මස 5 වන දින සිට 13 වන දින දක්වා ඇඹිලිපිටිය යුද්ධ හමුදා ඉංජිනේරු පුහුණු පාසලේදී පැවති මෙම පුහුණුව අදියර දෙකකින් සමන්විත විය. ගංවතුර සහ ස්වභාවික විපත්වලදී පීඩාවට පත්වූවන් සොයාගැනීමේ සහ ගලවා ගැනීමේ මෙහෙයුම් සඳහා සහය වීම, අත්‍යවශ්‍ය මෝටර් බෝට්ටු මෙහෙයුම් දක්ෂතා වැඩිදියුණු කිරීම මෙම පාඨමාලාවේ අරමුණවිය. පාඨමාලාව සඳහා සහභාගීවූවන් හට සහතික පත්‍ර පිරිනැමීමට ද කටයුතු කෙරිණ.

## අභිමානවත් 143 වන සංවත්සරය සමරා





2(සේවා) යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ 143 වන සංවත්සරය එම බලකායේ අණදෙන නිලධාරිනි ලුතිනන් කර්නල් කේඩීපී ද ඒ විජේසිංහ ගේ ප්‍රධානත්වයෙන් අති උත්කර්ශවත් අන්දමින් පැවැත්විණ. එහිදී, අණදෙන නිලධාරිනිය වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර පුදකිරීම, හටපිරිස් ඇමතීම, රුක් රෝපණය, සියලු නිල දිවා භෝජනය, බෝධිපූජා පිංකම සහ මීගොඩ පිහිටි බෝසත් ළමා නිවාසයේ දූ දරුවන් සඳහා පාසල් උපකරණ සහ දිවා ආහාරය පිරිනැමීම සංවත්සර දින වැඩසටහන් අතර විශේෂ මතක සටහන් විය.

# දහම් පාසල් සිසුන් වෙනුවෙන් දිවා ආහාර වේලක්





6 වන (ආධාරක) රෙජිමේන්තුව ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා සාමාජිකයින්ගේ ශ්‍රමදායකත්වයෙන් ගල්කඩවල ආනන්ද විහාරස්ථානයේ දහම් පාසල් සිසුන් වෙත දිවා භෝජන සංග්‍රහයක් ඉකුත් අගෝස්තු 11 වන දින පිරිනැමිණ. 22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීඑච්එම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී සහ ඔහුගේ පවුලේ සාමාජික සාමාජිකාවන්ගේ පූර්ණ දායකත්වය මෙම සත්කාරය සඳහා හිමිවූහ. එහිදී, එම දහම් පාසල් සිසුන් සඳහා පාසල් උපකරණ බෙදාදීමටද කටයුතු කෙරිණ. මෙම අවස්ථාවට 223 වන පාබල බලසේනාවේ බලසේනාධිපති හා 6 (ආධාරක) රෙජිමේන්තුව ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ අණදෙන නිලධාරී ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# ශිෂ්‍ය නායක නිල ලාංඡන පැළඳවීමේ උත්සවයක්





සෙවනපිටිය නෙළුම්වැව මහා විද්‍යාලයේ පැවති ශිෂ්‍ය නායක නායිකාවන් සඳහා නිල ලාංඡන පැළඳවීමේ උත්සවයක් ඉකුත් අගෝස්තු 09 වන දින පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ව්‍යාපෘති නිලධාරී බ්‍රිගේඩියර් එල්එච්එම් රාජපක්ෂ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගී විය. එහිදී, සිසුන් 45 දෙනකු හට ශිෂ්‍ය නායක ලාංඡන ප්‍රදානය කෙරුණු අතර, මෙම අවස්ථාවට ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) රාජකාරී නියුතු නිලධාරීන් පිරිසක් ද, සිසු සිසුවියන්ගේ දෙමාපියෝ ද සහභාගී වූහ.



# පෙර පාසල් දරුවන් සඳහා පරිත්‍යාගයක්

11 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් කේජීසීකේ කුඩාගමගේ ගේ මඟපෙන්වීම යටතේ එම ඒකකයේ හට පිරිස් ඉකුත් ජූලි මස 25 වන දින නාවට්කුලි ලක්දරු පෙර පාසලේ දරුදැරියන් සඳහා දිවා භෝජන සංග්‍රහයක් පිරිනැමූහ. කාලීන අවශ්‍යතාවයක් වූ මෙම වැඩසටහන එම පෙර පාසලේ ළමුන්, ගුරුභවතුන් සහ දෙමාපියන් විසින් මහත් සේ අගයනු ලැබූ අතර, එම ප්‍රජා සත්කාරය පැවැත්වීම වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ඔවුහු සිය කෘතඥතාව පළ කළහ.

# බේස්බෝල් පුහුණු කඳවුරක්





24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා බේස්බෝල් කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්ජ්සී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ මඟපෙන්වීම යටතේ බේස්බෝල් ක්‍රීඩාවේ නිපුණතාව සහ දැනුම වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් ඉකුත් අගෝස්තු මස 16 වන දින විශේෂ පුහුණු කඳවුරක් අම්පාර ප්‍රදේශයේදී පැවැත්විණ. ආසියානු බේස්බෝල් සම්මේලනයේ නියෝජ්‍ය විනිසුරු අධ්‍යක්ෂ සහ ජපානයේ ජාත්‍යන්තර සංවර්ධන බේස්බෝල් සම්මේලනයේ ප්‍රධානී සුජීව විජයනායක මහතා විසින් මෙම වැඩසටහන මෙහෙයවන ලදී. තවද, සමාප්ති උත්සවයේදී ඊට සහභාගී වූ පාසල් උපදේශකයින් සඳහා රුපියල් මිලියනයකට අධික බේස්බෝල් උපකරණ ප්‍රදානය කිරීමද බේස්බෝල් සම්මේලනයේ ප්‍රධානීගේ සුරතින් සිදුවිය. අම්පාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ එස්.ආර්. හසන්ති මහත්මිය, අම්පාර අධ්‍යාපන කලාපයේ තෝරාගත් පාසල්වල ශාරීරික පුහුණු උපදේශකවරු ඇතුළු පුහුණුකරුවෝ 30 කට අධික පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

# නායකත්ව වැඩසටහනක්





අම්පාර/උහන ප්‍රාථමික පාසලේ සහ අම්පාර/ශ්‍රී සුමංගල විද්‍යාලයේ සිසුන් 96 දෙනෙක් සඳහා නායකත්ව වැඩසටහනක් ඉකුත් අගෝස්තු මස 15 වන දින පැවැත්විණ. මූලික නායකත්ව ගුණාංග වර්ධනය කිරීම, විශ්වාසනීයත්වය, වගකීම් දැරීමේ හැකියාව සහ ඵලදායීතාවයෙන් යුතු අනාගත නායකයින් බිහිකිරීම වෙනුවෙන් පාසල් සිසුන් සවිබල ගැන්වීම මෙම වැඩසටහනේ මූලික අරමුණ විය. මෙම අවස්ථාවට 24 වන පාබල සේනාංකයේ නිලධාරීන්, සෙසුනිලයන් ඇතුළු අදාළ පාසල්වල විදුහල්පතිවරු සහ ආචාර්ය මණ්ඩලයද සහභාගී වූහ.

# දූ දරුවන් උදෙසා වෛද්‍ය සායනයක්





ත්‍රිකුණාමලයේ රේවත ළමා නිවාසයේ නේවාසික දැරියන් සහ පාලිකාවන්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම වෙනුවෙන් සංවිධානය කෙරුණු වෛද්‍ය සායනයක් ඉකුත් අගෝස්තු මස 18 වන දින පැවැත්විණ. 22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ මඟපෙන්වීම යටතේ එම සේනාංකයේ ස්ථාපිත ක්ෂේත්‍ර රෝහලේ කාර්ය මණ්ඩලයේ සහයෝගය මත සායනයට සහභාගී වූ සියලු දෙනාට එහිදී ප්‍රණීත ආහාරපාන ලබාදීමටද කටයුතු සලසා තිබිණි.





# සොඳුරු සිතුවිලි

## බැඳීමක අරුමය...



බැඳීම් ලුහුබඳින තරමට
දුක අපිව ලුහුබඳින්න පටන්ගනී
කෙසේ හෝ බැඳීම් ඇතිකර ගත්තොත්
සංසාර දුක පසුපස ඒමට පටන් ගනී
එම බැඳීම් මගහැර ගත්තොත්
සංසාර දුක හෙමිහිට අපව මගහැර යයි

සෙ/417558
කෝප්‍රල් ධර්මපාල ඩබ්ලිවවම්ඩී
5 ගැහේබ

## ප්‍රේමය නම්......

හද තුළ ජනිත වන බලගතු හැඟීමකි
සසරේ හුරු පුරුදු ලෙස ආ බැඳීමකි
සුන්දර දිවි මගේ මිහිරිම වින්දමකි
"ප්‍රේමය" කියන්නෙම සැබවින් නිවිමකි

ලෝකය පුරා අපමණ කවි ගී ලිවුව
කවියන් හිඳී ආදරයෙහි රස මැවුව
විරහව නිසා ජීවිතයට තිත තිවුව
මිනිසුන් වදත් සිටියා කඳුළැලි බිවුව

පාරමී බණ්ඩාර
බලන්ගොඩ

## වියවුල් සිතුවිලි....



ඔයාගෙ HANDFREE එකත්
ඔයාගෙ කොණ්ඩෙ වගේ
හැම වෙලාවකම
අවුල් වෙලා...
ඒ විතරද...
මගේ මනස,
මගේ හදවත,
උඹලා හැමදාමත් දැක්කෙ
පිටට පේන දේ විතරයි...
මම එහෙම හිතලා,
"ඒක නම් ඇත්ත,
ඔයා ඉතින් දන්නවනෙ
මං ගැන..."
පවසා හිනැහුනෙමි...

කපිතාන් සුමුදුනී පෙරේරා
1 ශ්‍රීලයුකාබ



## ජීවිතයට ඔවදනක්...

තමන්ට තමන් අවංක වන්න
ස්වභාව ධර්මය පවා ඔබව
ආරක්ෂා කරනු ඇත
ඔබ අන් අයට වඩා වෙනස්
ඒ වෙනසට ඔබ ඔබටම ආදරය වන්න
බොහෝ දේවල් තේරුම් ගත්ත මිනිස්සු
අවසානයේ නිහඬයි
සෑම හමුවීමක් ඇතුලෙම
ආදරණීය සිහිවටනයක්
ඉතිරි කරන සුන්දර මනුස්සයෙක් වන්න
බලාපොරොත්තුවක් නොමැතිව වුවද
අනුන්ට උපකාර කරන කෙනෙක් වන්න
සෑම හිත් රිදීමක් නිසාම
අලුත් පාඩමක් ඉගෙන ගනියි
සෑම අලුත් පාඩමක් තුළින්ම
වෙනස් මිනිසකු නිර්මාණය කරයි
බොහෝ විඩා දැනුණද
හැරයා නොහැක්කකි "ජීවිතය"

සෙ/2එල්00815
සැරයන් චතුර කුමාර පීරිවන්
2(සෙවී) ශ්‍රීලයුවෙබ

## බොඳ වූ සිහිනය...

රෝස පෙති තැවරුණු
පාට සළුපිලි බල බල
සුවය විඳිති ඈ
සේද සාප්පුවල

සිව් වසරක සිහින
පොදි බැඳ ගෙන
රෝස පෙත්තකින්
යහන සරසන්නට

රතට හැරුණු දහදිය
කැටිති සැඟවී හිඳ
රෝස පෙති දියලයි
යහන තෙත් කොට

කෝප්‍රල් ඉසුර මධුසංඛ ඩබ්ලිවකේ
12 ගැහේබ





# සේවා වනිතා සේවා













# අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාගයක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ උපදෙස් හා අධීක්ෂණයෙන් වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් පසුගිය අගෝස්තු මස 05 වන දින එම සේවා වනිතා කාර්යාලයේදී පැවැත්විණ. ආසේමු (යාපනය), ආසේමු (වන්නි), ආසේමු (නැගෙනහිර), ආසේමු (බටහිර) හා ආසේමු (මධ්‍යම) බලප්‍රදේශ තුළ රාජකාරී නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් හා සිවිල් සේවක මහත්ම මහත්මීන් 500 දෙනකු සඳහා එලෙස වියළි සලාක මළු බෙදාදීම සිදුකෙරිණ.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට නිලධාරීන්, නිලධාරිනියන් සහ සෙසුනිලයින් පිරිසක් ද සහභාගී වූහ.

# වාර්ෂික මහාසභා රැස්වීමේදී පරිත්‍යාග රැසක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 40 වන වාර්ෂික මහා සභා රැස්වීම පසුගිය අගෝස්තු මස 21 වන දින එම ඒකක සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ.

එහිදී, සභාපතිනිය විසින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ඉදිරි සැලසුම් සහ යෝජිත ව්‍යාපෘතීන් පිළිබඳව දැනුවත් කරන ලදී. ඉන් අනතුරුව 12 ගැමුණු ඒකකයට අයත් ලුතිනන් ආර්ජීඩීජී මාගන්දන ආර්එස්පී (විශ්‍රාමික) ගේ ආබාධිත තත්ත්වයේ පසුවන දරුවාට හා කෝප්‍රල් කුමාරසිංහ එන්එම්ඒඩී යන කොනොනිගේ අසනීප තත්ත්වයෙන් පසුවන මවට රෝදපුටුවක් පිරිනැමීමත් මා/සැරයන් හේමන්ත කුමාර එච්ආර් යන ජ්‍යෙකොනොනිගේ බිරිඳ වෙත ස්වයං රැකියා කටයුතු සඳහා ජුකි මහන මැෂිමක් පරිත්‍යාග කිරීමත් සිදුකෙරිණ.




තවද, සේවා බලකා සේවා වනිතා ශාඛාව විසින් පවත්වාගෙන යනු ලබන යෝගට් ව්‍යාපෘතියෙහි ලාභාංශයෙන් රුපියල් 200,000.00 ක මුදලක් යුද්ධ හමුදා සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි චන්දි රාජපක්ෂ මහත්මිය විසින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය වෙත පිරිනැමීම ද එහිදී සිදුකරනු ලැබුවාය. මෙම අවස්ථාවට සේවා වනිතා ශාඛාවන්හි සභාපතිනියන් සහ සාමාජිකාවෝ රැසක් එක්වූහ.



# රණවිරු දිරිය වෙනුවෙන් වැඩසටහන් රැසක්



ගජබා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහා සභා රැස්වීම පසුගිය අගෝස්තු මස 07 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සහ ගජබා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම හමුවේදී එම රෙජිමේන්තු සාමාජිකයන්ගේ පවුල්වල සුභසාධන ගැටළු සහ ඔවුන්ගේ පවුල්වල යහපැවැත්ම පිළිබඳව සාකච්ඡා කිරීම මූලික විය. මීට අමතරව එම පවුල්වලට තවදුරටත් උපකාර කිරීම් සඳහා අනාගත සැලසුම් සකස්කිරීම පිළිබඳව ද මෙහිදී අවධානය යොමු කෙරිණ. මේ සඳහා එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ රැසක් සහභාගී වූහ.

## ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහක්







ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි උදිතා පෙරේරා මහත්මියගේ මඟපෙන්වීම සහ අධීක්ෂණය යටතේ එම රෙජිමේන්තු මූලස්ථානයේදී ඉකුත් අගෝස්තු මස 08 වන දින ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහනක් පැවැත්විණි.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහනේදී 2022 සහ 2023 උසස් පෙළ විභාගවලින් විශිෂ්ට දස්කම් දැක්වූ සිසුන් 34 දෙනකුට ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරිණ. එමෙන්ම ගැබිණි මව්වරුන් 118 දෙනකුට අත්‍යවශ්‍ය උපකරණ බෙදාදීම ද පාසල් ළමුන් වෙනුවෙන් පාසල් උපකරණ බෙදාදීම ද එම වැඩසටහනට ඇතුළත් විය.

## රණ්‍යක්ෂිත විරුවන්ගේ සුවදුක් විමසමින්



රාගම රණවිරු සෙවණ පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි රණ්‍යක්ෂිතයට පත් රණවිරුවන්ගේ සුබසාධනය සොයා බැලීමේ අරමුණින් ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි සමන්කා ප්‍රනාන්දු මහත්මියගේ ප්‍රධානත්වයෙන් එහි සාමාජිකාවෝ පසුගිය අගෝස්තු මස 06 වන දින සංචාරයක නිරතවූහ. එහිදී, රණ්‍යක්ෂිත විරුවන් වෙත උදෑසන කෙටි ආහාර වේලක් ලබාදීම ද ඔවුන්ගේ සනීපාරක්ෂක කටයුතු සඳහා අවශ්‍ය උපකරණ ලබාදීම ද සිදුකෙරිණ.

## ක්‍රීඩා කුසලතා සංවර්ධනයට අතහිත



ශ්‍රී ලංකා යුද්ධ හමුදා උපකරණ මාස්ටර් ජෙනරාල් හා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ හා එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වජිරා පෙරේරා මහත්මියගේ ප්‍රධානත්වයෙන් ක්‍රීඩා භාණ්ඩ බෙදාදීමේ වැඩසටහනක් පසුගිය අගෝස්තු මස 10 වන දින පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථාන දේශනශාලාවේදී සිදුකෙරිණි. සක්‍රිය සේවයේ යෙදී සිටින රණවිරුවන්ගේ ක්‍රීඩා කුසලතාවන් වර්ධනය කිරීම සහ මනා සෞඛ්‍ය තත්ත්වයකින් පිරිපුන් රණවිරුවන් පිරිසක් බිහි කිරීමේ අදිටනින් යුතුව ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් සියලු ඒකක වෙත ක්‍රීඩා උපකරණ බෙදාදීමත් ඊට සමගාමීව වකුගඩු රෝගයකට ලක්ව ඇති මේජර් ඩීඩීඑන් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී (විශ්‍රාමික) ගේ බිරිඳගේ වකුගඩුවක් බද්ධ කිරීමේ ශල්‍ය කර්මය වෙනුවෙන් රුපියල් 200,000.00 ක වෛද්‍යාධාර මුදලක් පිරිනැමීමත් එහිදී සිදුකෙරුණි. මෙම අවස්ථාව සඳහා එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්, රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

## සිංහ රෙජිමේන්තු සේවා වනිතාවෙන් සත්කාර රැසක්



සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ මහ සභා රැස්වීම ඉකුත් අගෝස්තු මස 18 වන දින එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නෙලූකා නානායක්කාර මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එහිදී, රණවිරුවන් රැසකට නිවාස ආධාර සහ වෛද්‍යාධාර පිරිනැමීම ද සිදුකෙරිණ. මෙම අවස්ථාවට එම සේවා වනිතා සාමාජිකාවන් ඇතුළු සෙසුනිල භාර්යාවෝ 150 දෙනකු පමණ සහභාගී වූහ.

## අපේක්ෂා රෝහලට මාහැඟි පරිත්‍යාගයක්



ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි වෙලගෙදර මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම සේවා වනිතා සාමාජිකාවෝ පසුගිය ජූලි මස 27 වන දින මහරගම අපේක්ෂා රෝහලෙහි සංචාරයක නිරත වූහ. එහිදී, එම රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් සඳහා රුපියල් 500,000.00 ක් වටිනා ඖෂධ සහ ආහාර ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමට ද කටයුතු කෙරිණ.

## ගැබිණි මාතාවන්ට පරිත්‍යාගයක්



යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ සේවයේ නියුතු රණවිරුවන්ගේ ගැබිණි බිරින්දෑවරු 28 දෙනකු සඳහා රුපියල් 7,500.00 ක් බැගින් වූ මූලික ප්‍රසූත ද්‍රව්‍යමය කට්ටල ප්‍රදානය කිරීම ඉකුත් ජූලි 31 වන දින එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ප්‍රියංගා වික්‍රමසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. මෙම අවස්ථාව සඳහා යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්, නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

## විශේෂ බලකා සේවා වනිතා ශාඛාව



විශේෂ බලකා සේවා වනිතා ශාඛාවේ 2024 වර්ෂයේ 2 වන අර්ධය සඳහා වූ මහාසභා රැස්වීම පසුගිය අගෝස්තු මස 11 වන දින එම රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ දී පැවැත්විණි. එහිදී, එම සේවා වනිතා ශාඛාව සඳහා නව විධායක සාමාජිකයින් පත් කරනු ලැබූ අතර, විශේෂ බලකා සෙබළුන් සහ සිවිල් සේවක කාර්ය මණ්ඩලයට සම්බන්ධ මාතෘ කාන්තාවන් සඳහා අත්‍යවශ්‍ය වියළි ආහාර පරිත්‍යාග කිරීම ද සිදුකෙරිණ. 4ever skin naturals (PVT) Ltd හි සභාපතිනි චාන්දනි බණ්ඩාර මහත්මිය විසින් සේවා වනිතා සාමාජිකාවන් සඳහා රූපලාවන්‍ය වැඩමුළුවක් ද එහිදී පවත්වනු ලැබුවාය.

## රණකෂිත විරුවන්ගේ සුවදුක් විමසමින්



සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ප්‍රසාදනී රණසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් මහනුවර රෝහලේ පිළිකා සඳහා ප්‍රතිකාර ලබාගැනීමට පැමිණෙන රෝගීන් සහ කිමෝ තෙරපි රෝගීන් 350 දෙනකු සඳහා කෙටි ආහාර ලබාදීම පසුගිය අගෝස්තු මස 08 වන දින සිදුකෙරිණ. තවද, වත්තේගම බාලිකා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ දියණියන් 27 දෙනකු සඳහා රාත්‍රී ආහාර වේලක් පිරිනමමින් ඔවුන්ගේ සුවදුක් බැලීමට ද සේවා වනිතා සාමාජිකාවෝ එක්වූහ.

## සේවා බලකා සේවා වනිතාවෙන් සත්කාර රැසක්



සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි චන්දි රාජපක්ෂ මහත්මියගේ මගපෙන්වීම යටතේ එම සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහා සභා රැස්වීම පසුගිය අගෝස්තු මස 03 වන දින සේවා බලකා පාසල තිසාවැව හීදී පැවැත්විණි. 5 යුද්ධ හමුදා සේවා බලකායේ රාජකාරී නියුතු සෙබළුන්ගේ දරුවන් හට පාසල් උපකරණ බෙදාදීම සහ සිවිල් කාර්ය මණ්ඩලය සඳහා වියළි සලාක ප්‍රදානය කිරීම ද එහිදී සිදුකෙරිණ. තවද, එම වැඩසටහන අතරතුර සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවක් වන රසායනික විද්‍යාවේදී වැඩබලන විශේෂඥ වෛද්‍ය මේජර් ශානිකා හලංගොඩ මහත්මිය විසින් "පෝෂණය සහ ළමා සංවර්ධනය" පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයක් ද පවත්වනු ලැබුවාය.

# නව තනතුරෙහි රාජකාරි අරඹමින්




ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස අනුපමා රත්නායක මහත්මිය ඉකුත් අගෝස්තු මස 22 වන දිනට යෙදුණු සුබ මොහොතින් සිය තනතුරේ රාජකාරි අරඹනු ලැබුවාය.

# නව ව්‍යාපෘති ආරම්භය



යුද්ධ හමුදා යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ කමිටු රැස්වීම එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉරේෂා ප්‍රනාන්දු මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූලි 27 වන දින පැවැත්විණ. එම අවස්ථාවට සමගාමීව යුධෝපකරණ බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඊඑම්එම් ප්‍රනාන්දු එච්ඩීඑම්සී එල්එස්සී ඒජීටීම සමග එහි සේවා වනිතා ශාඛා සභාපතිනියගේ සුරතින් කුරුඳු තෙල් නිස්සාරණ ව්‍යාපෘතියේ සමාරම්භය ද සිදුවුනු. එම සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ සමග නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් ද ඊට සහභාගී වූහ.

# රාගම රණවිරු සෙවණේ සංචාරයක්



යුද්ධ හමුදා පොලිස් සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනීෂා කොතලාවල මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම බලකා සාමාජිකාවෝ ඉකුත් ජූලි මස 16 වන දින 1 යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය සමග එක්ව රාගම රණවිරු සෙවණේ දී පරිත්‍යාග වැඩසටහනක් පවත්වන ලදී. මේ යටතේ නේවාසික රණවිරුවන් වෙත අත්‍යවශ්‍ය සනීපාරක්‍ෂක ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම ද රණක්ෂිතයට පත් රණවිරුවන් වෙනුවෙන් ප්‍රණීත දිවා ආහාර වේලක් පිරිනැමීම ද අනතුරුව රණවිරුවන්ගේ රසාස්වාදය වෙනුවෙන් කැලිප්සෝ සංගීත වැඩසටහනක් පැවැත්වීමට ද කටයුතු කෙරිණ.

# සුබ මොහොතින් රාජකාරි අරඹමින්




යුද්ධ හමුදා පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනි ලෙස තුෂාරි අබේසිංහ මහත්මිය ඉකුත් ජූලි මස 15 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී ආගමික වතාවත් මධ්‍යයේ සිය ධුරයේ රාජකාරි භාර ගනු ලැබුවාය.

## කෘත්‍රිම අත් පා බෙදාදීමේ වැඩසටහනක්



යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශුසම්පත් බලකා සේවා වනිතා ශාඛාව විසින් කෘත්‍රිම අත් පා ප්‍රදානය කිරීමේ වැඩසටහනක් ඉකුත් ජූලි මස 28 වන දින වැලිකන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වරුණි කුලතුංග මහත්මියගේ මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක මෙම ප්‍රජා වැඩසටහනට ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර), 23 වන පාබල සේනාංකය සහ 7 බලඇණිය ගැමුණු හේවා බලකායේ සහාය ද හිමි විය.

මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශුසම්පත් බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්ජ් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විඑස්වී යූඑස්පී පීඑස්සී සහභාගී විය.

කොක්කඩිචෝලෙයි, මඩකලපුව, අම්පාර, පදියතලාව, වැලිකන්ද, සිංහපුර, පූනානි සහ පොළොන්නරුව යන ප්‍රදේශවල පදිංචිව සිටි පුනරුත්ථාපනය වූ හිටපු එල්.ටී.ටී.ඊ සාමාජිකයින් 5 දෙනකු ඇතුළුව ආබාධිත පුද්ගලයන් 26 දෙනකුට මෙම වැඩසටහනේ දී ප්‍රතිලාභ හිමි විය. "*Colombo Friends in need*" සමිතියේ මූල්‍ය අනුග්‍රහය ඇතිව මෙම සත්කාරය ක්‍රියාත්මක කෙරිණ.

## වැඩිහිටි නිවාසයේ සංචාරය



වෛද්‍ය බලකා සේවා වනිතා සභාපතිනි ඩබ්ලිව්ඩීපී ලිලන්ති දොලගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ ඉකුත් අගෝස්තු මස 10 වන දින කවුඩෙල විල්බට් පෙරේරා අනුස්මරණ වැඩිහිටි නිවාසයේ සංචාරයක නිරත වූහ. එහිදී, එම වැඩහිටි නිවාසය පිරිසිදු කිරීමත් ඔවුන්ට අවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍ය හා තිළිණ ලබාදීමත් ඔවුන් හට දිවා ආහාර වේලක් ලබාදීමත් සිදුකෙරිණ.

## කාන්තා බලකා සේවා වනිතාවෙන් සත්කාරයක්




යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහා සභා රැස්වීම එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි උදුලා කස්තුරිමුදලි මහත්මියගේ මගපෙන්වීම යටතේ පසුගිය ජූලි මස 26 වන දින පැවැත්විණ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ මේජර් එස්වීආර්ජ් ද සිල්වා යන නිලධාරී විසින් එහිදී "හැඟීම් සහ හැඟීම් පාලනය කිරීමේ හැකියාව වැඩිදියුණු කරගන්නේ කෙසේද" යන තේමාව ඔස්සේ යුද්ධ හමුදා වෘත්තිය සහ පවුල් ජීවිතය සමතුලිත කරගැනීම පිළිබඳ කරුණු ඇතුළත් පුළුල් දේශනයක් පවත්වන ලදී. වැඩසටහනේ තවත් අංගයක් ලෙස එම රෙජිමේන්තුවේ සෙසුනිලයන් සහ සිවිල් කාර්ය මණ්ඩලය වෙනුවෙන් ඇස් කණ්ණාඩි ප්‍රදානයක් ද එහිදී සිදුකෙරිණ.

## අධ්‍යාපනයට අත්වැලක්



යුද්ධ හමුදා පුරෝගාමී බලකායට අයත් සාමාජිකයින්ගේ 1 ශ්‍රේණියට ඇතුළත් වන දරු දැරියන් වෙනුවෙන් අධ්‍යාපනික උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ජූලි මස 27 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි එච්ජී ස්වර්ණලතා මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට සේවා වනිතා ශාඛා සාමාජිකාවන්, නිලධාරීන් සහ සෙසුනිලයන් රැසක් ද සහභාගී වූහ.



# මහාවංශය හා දමිළයින්



■ ලාන්ස් කෝප්‍රල්
රාධිකා සීවලි
*Ambassodor of Education (Spelized in Translation) Sworn Translator, Language Facilitator, Justice of Peare (WI)*

ඉතිහාසය යනු ලිඛිතව හෝ වාචිකව විස්තර කරන ලද, ස්වකීය අතීත අධ්‍යනයක් ලෙස අපට සරලව තේරුම් ගත හැකිය. ඕනෑම පුරවැසියකු තම දේශයේ ඉතිහාසය හා එයින් ගොඩනැගුණු ප්‍රෞඪත්වය දැනගෙන සහ අවබෝධ කොට විසීම එම දේශයේ භාග්‍යයකි. ලක්වාසී අප ද පුරාවිද්‍යාත්මකව සනාථ කළ හැකි ප්‍රෞඪත්වයකින් යුතු පෞරාණික ඉතිහාසයකට උරුමකම් කියන්නෝ වෙමු.

මහවංශය, ථූපවංශය, චූල වංශය, රාජාවලිය, පූජාවලිය ආදී බොහෝ මූලාශ්‍රයන්ගෙන් අප ලක් ඉතිහාසය අනූන වේ. විවිධ මතිමතාන්තර හා විවිධ කාලපරාසයන්හි ලියවුණු මේ සියලු ග්‍රන්ථ තුළින් අප ලක් ඉතිහාසයේ විවිධ පැතිකඩ මනාව පිළිබිඹු වන බව මාගේ විශ්වාසයයි. මෙම ග්‍රන්ථ අතුරින් මා මුලින්ම සඳහන් කළ මහාවංශය අප සියලුදෙනාම නොකියවූවද අසා දැන ඇති ග්‍රන්ථයකි. මෙම ග්‍රන්ථය, රටක අඛණ්ඩ ඉතිහාසය කියාපාන සහ ඒ බැවි පුරාවිද්‍යාත්මකව ඔප්පු වන ලොව එකම ග්‍රන්ථය යැයි කීවොත් එය අතිශෝක්තියක් නොවනු ඇත. තවද, මහාවංශය යනු ශ්‍රී ලංකාවේ රජවරුන් පිළිබඳව පාලි භාෂාවෙන් ලියවුණු වීර කාව්‍යක් ලෙසද සැළකිය හැකිය. මහාවංශයේ ප්‍රථම භාගය තුළින් ලක් ඉතිහාසයේ ක්‍රි.පූ. 543 සිට මහසෙන් රජුගේ කාල වකවානුව තෙක් ආවරණය වේ. මහා විහාරවාසී මහානාම නම් බෞද්ධ භික්ෂුව විසින් ලියන ලද මෙම මහාවංශය ඓතිහාසික වශයෙන්ද, වීර කාව්‍යක් ලෙස ගත් කළ සාහිත්‍යමය වශයෙන් ද අසිරිමත් ග්‍රන්ථයකි.

එක් එක් මතිමතාන්තර හා නොයෙක් පටු අරමුණුවලින් යුක්ත පුද්ගලයින් තම වාසි තකා මෙම ග්‍රන්ථයේ පාඨ අසම්පූර්ණව උධෘත කොට දක්වමින් කලින් කලට සමාජයේ විවිධ කැළඹිලි ඇතිකරති. 'මහාවංශය වනාහී එක් ජාතියකට විරුද්ධව තවත් ජාතියක පිරිසක් විසින් කරනා ලද මහා සංග්‍රාමයක් පිළිබඳව කළ වර්ණනාත්මක පක්ෂපාති ග්‍රන්ථයක්' යන්න ඔවුන්ගේ ප්‍රධානතම චෝදනාවයි. එවන් අර්බුද මතුකරන පුද්ගලයින්ගෙන් එකදු පුද්ගලයකු හෝ මෙම මහාවංශය සම්පූර්ණ වශයෙන් නොකියවූවන් බැවි මෙම ලිපිය අවසන තීරණය කිරීම පාඨක ඔබට භාර කරමි.

මහාවංශය වීර කාව්‍යක් වශයෙන් ගත්කළ, කාව්‍ය නායකයා වන දුටුගැමුණු රජුන් පිළිබඳව සඳහන් කිරීමට මුල්වන ඔහුගේ සතුරු රජුන් පිළිබඳව එනම් එළාරයින් පිළිබඳව මහාවංශ කතුවරයා කුමක් සඳහන් කළේදැයි විමසා බලනු වටී. අප අද මෙම ලිපිය තුළින් පරිච්ඡේද 37 කින් සමන්විත මහාවංශ පළමු කොටසෙහි 21 වන පරිච්ඡේදයේ 13-34 ගාථාව තෙක් ධීර ගති ඇති සෘජු ස්වභාව ඇති අපගේ දෙමළ එළාර මහරජු පිළිබඳ මහාවංශය කුමක් සඳහන් කර ඇද්දැයි විමසා බලමු.

'චෝලරට්ඨා ඉදාගම්ම' යන පාලි පාඨයෙන් ආරම්භ වී 'උජුජාතිකො' සෘජු ගති ඇත්තෙක් ලෙස එළාර රජුන් හඳුන්වා දෙන මහාවංශය, එකල අගනුවර පාලනය කළ අසේල රජුව 'ගහෙත්වා සේල භූපතිං' ජීවග්‍රහයෝ අල්ලාගත්තේය, යැයි සඳහන් කිරීම තුළින් තරුණ එළාරයන්ගේ වීරත්වය විදහා පෑමට අමතක නොකරයි.

"ලක් රාජ්‍යය අල්ලා ගැනීමට සොළී රටෙහි සිට ලංකාවට ආ සෘජු ස්වභාව ඇති එළාර නම් සෙන්පතියෙක් අසේල රජුව ජීවග්‍රහයෙන් අල්ලා ගත්තේය. ඔහු සතළිස් සතර අවුරුද්දක් ලංකා රාජ්‍යය පාලනය කළේය. එළාර රජු නඩු විසඳන අවස්ථාවේ දී සතුරන් කෙරෙහිත් මිතුරන් කෙරෙහිත් මධ්‍යස්ථව තීන්දු තීරණ දුන්නේය.

රජු තමන් සැතපෙන ඇඳට ඉහළින් ඉතා දිග ලණුවක් ඇතිව සණ්ඨාරයක් එල්ලා තිබුණි. ඒ සාධාරණ විනිශ්චය කැමති අයට නාද කරනු පිණිසය. එළාර රජු හට එක් පුත්‍රයෙක් ද දුවක් ද සිටියහ. රජුගේ පුත්‍රයා රථයෙන් තිසා වැවට යද්දී, අලුත උපන් වසු පැටියෙක් තමන්ගේ මව්දෙන සමඟ පාරේ ලඟ සිටියේය. පුත් කුමාරයාගේ නොසැලකිලිලෙන්, රථයෙන් යද්දී රථ රෝදයට බෙල්ල හසුවී වසුපැටියා මිය ගියේය. ගවදෙන, පුත්‍ර ශෝකයෙන් හඬාගෙන ගොස් ලණුවෙන් ඇද සණ්ඨාරය නාද කළාය. රජු ඒ රථ රෝදයෙන්ම සිය පුත්‍රයාගේ හිස සින්දවීය.

දිනක්, එක්තරා සර්පයෙක් තල් ගසක සිටි කුරුලු පැටියකුව ගිල දැම්මේය. මව් කිරිල්ලි ගොස් ඒ සණ්ඨාරය නාද කළාය. රජු සර්පයා අල්ලාගෙන කුස පලවා කුරුලු පැටියාව ඉවත් කළේය. යකඩ උලකින් පෙණය විද තල් ගසේ එල්ලීය.

තවත් දිනක, රජු මිහින්තලේ සෑගිරියට ගොස් භික්ෂු සංඝයාට දන් පිළිගන්වා ආපසු රථයෙන් එද්දී රථයේ වියගසේ කොණක්, භාග්‍යවතුන් වහන්සේගේ ස්ථූපයේ වැදීමෙන් ඒ ස්ථූපයේ කොටසක් කැඩී ගියේය. එවිට රජුගේ අමාත්‍යවරයා 'දේවයන් වහන්ස, ඔබවහන්සේ විසින් අපගේ භාග්‍යවතුන් වහන්සේගේ සෑය බිඳින ලද්දේය' යි කීය. එකල්හි එළාර රජු තමන් නොදැන කළ දෙයක් වුවද රථයෙන් බැස, 'ඔය රථ රෝදයෙන් මගේ හිස සිඳිව්' කියා මාවතෙහි දිගා වුනේය. 'මහරජුනි, අනුන්ට හිංසා කිරීමට අපගේ ශාස්තෘන් වහන්සේ කිසිසේත් නොකැමති සේක. එනිසා ස්ථූපය ප්‍රකෘතිමත් කොට බුදුරජාණන් වහන්සේ ගෙන් සමාව ගනු මැනව' යැයි කීවේය. රජු ඒ චෛත්‍යයේ කඩා වැටුනු ගල් පේළි පසළොසක් නියමාකාරයෙන් තැන්පත් කරවා කහවණු පසළොස් දහසක් වැය කොට එය පිළිසකර කරවීය.

එක් මැහැල්ලක් වී වේලාගන්ට අව්වේ වී දැම්මාය. එකල්හි අකල් වැස්සක් ඇදහැලී ඇගේ වී ගොඩ තෙමුණි. ඒ මැහැල්ල තෙමුණ වී ගෙන ගොස් සණ්ඨාරය නාද කළාය. අකලට වැසි ඇද හැලීමෙන් වී තෙමී ගිය බව අසා ඒ ස්ත්‍රිය පිටත් කොට යැවූ රජු, 'ධර්මයෙහි පිහිටා සිටින්නේ නම් කලට වැසි ලැබෙන්නේය' යන වචනයට අනුව කටයුතු කළේය. රජු ලුණු නැති බත් අනුභව කොට කොළ අතු අතුරා බිම සැතපී වාසය කිරීමේ උපවාසයක් පටන් ගත්තේය. රජුගෙන් බලි පූජා ලබන දේවපුත්‍රයෙක් රජුගේ තේජසින් තැතිගෙන සතර වරම් දෙවි මහරජවරුන් වෙත ගොස් මේ කාරණය දැනුම් දුන්නේය. සතර වරම් දෙවි මහරජවරු ඒ දේවපුත්‍රයා කැඳවාගෙන ගොස් ශක්‍ර දේවේන්ද්‍රයාට දක්වා සිටියහ. සක් දෙවිඳු පර්ජුන්‍ය නමැති වැස්ස වළාහක දෙවියන් කැඳවා කලට වැසි වස්සවන්න යැයි අණ කළේය. බලි පූජාවන් ගන්නා දිව්‍ය පුත්‍රයා රජු හට ඒ කාරණය දැනුම් දුන්නේය. එදායින් පසු ඒ රාජ්‍යයේ දහවල් කාලයෙහි වැසි නොවැස්සේය. (21 වන පරිච්ඡේදයේ 13-34 ගාථා විස්තරය)

මෙම උපුටාගැනීම හා විමසන කල්හි එම ධීරවත් රජ හට කාලගුණය පවා තම ධර්මිශ්ටභාවයෙන් පාලනය කරගත හැකිවී ඇත. තම අතින් නොදැන කළ වරදට තම ජීවිතය පවා පූජා කිරීමට සූදානම් වීම, කිරිල්ලියටත් යුක්තිය ඉටුකිරීම යන මේ සියලුම පුවත් තුළින් දමිළ එළාරයන්ගේ ජීවිත වර්ණනාව නොවේදෝ එලිවනුයේ උක්ත පුවත ද්‍රවිඩ සංගම් සාහිත්‍යයේ ඇතුළත් මනුනීදි චෝළ රජුගේ කථාවට සමානය. මෙපරිද්දෙන් එළාර රජුගේ ධාර්මික ක්‍රියාවන් රැසක් නොපැකිලිව ද්‍රවිඩ සාහිත්‍යයේ දී ජනශ්‍රැති එකතු කරමින් රචනාකොට තිබීමෙන් පැහැදිලි වන්නේ වංසකථාකරු දෙමළ විරෝධියෙක් හෝ සිංහල අන්තවාදියකු නොවන බව නොවේද ? ලොව මෙතෙක් නිර්මිත කලා කෘතීන් වේවා එසේ නොමැතිනම් අද නිර්මාණය වන චිත්‍රපටි වේවා මේ සියලු නිර්මාණ තුළින් කියවෙන සංසිද්ධීන් තුළ වීරයාගේ වීරත්වය, ධීරත්වය, ශූරත්වය ආදිය ඉස්මතු කිරීමෙහිලා එහි එන සතුරු චරිතයට සුවිශාල කාර්යභාරයක් පවරනු ලබනවා. සතුරු චරිතයේ ඇති දුර්දාන්ත, දුෂ්ට, තිරශ්චීන විෂමචාරී ජීවිතය ඉස්මතුකොට වීරයාගේ දුර්වල ක්‍රියා පවා සාධාරණය කිරීමේ ලක්ෂණ සුලබය. එනමුදු ක්‍රි.ව 5 සියවසෙහි පමණ ලියවුනු මෙම මහාවංශය තුළ එවැනි ලක්ෂණ දක්නට නොලැබේ .

එපමණක් නොව වෙනත් කිසිදු ඉතිහාස මූලාශ්‍රයක හෝ දක්නට නොලැබෙන අවම වශයෙන් දමිළ සාහිත්‍යක හෝ අසන්නට හෝ නොලැබෙන දමිළ රජවරුන් පිළිබඳ තොරතුරු මහාවංශය පුරාවට දැකිය හැක. "අශ්ව නාවිකයකුගේ සේන ගුත්තික නමින් දෙමළ පුතුන් දෙදෙනෙක් සිටියා. මහා බලසම්පන්න ඔවුන් ඒ සූරතිස්ස රජ්ජුරුවන්ව ජීවග්‍රහයෙන් අල්ලාගත්තා. ඔවුන් දෙන්නා අවුරුදු විසි දෙකක් ධාර්මිකව රාජ්‍ය පාලනය කළා..." (21 පරිච්චේදය 10,11 ගාථා)

අනුරපුර පාලනය කළ සේන රජු, ගුත්තික රජු, අනුලා බිසවගේ වල්ලභයන් වන වඩුග රජුන්, නීලිය රජුන්, පණ්ඩු, පාරින්ද, ඛුද්ද පාරින්ද තිරිතර, දාඨිය, පීඨිය වැනි උදවිය පිළිබඳව මහාවංශය හැරුණු කොට වෙනත් කිසිදු මූලාශ්‍රයකින් මෙතෙක් දැනගත නොහැකි බව ඉතිහාසය දත් සියල්ලෝ දනිති. මේ සියලු පුවත් සඳහන් වනුයේ මහානාම නම් බෞද්ධ භික්ෂුව පාලි බසෙන් ලියන ලද මහා වංශයේය. පුදුමය නම් මෙම පුවත කිසිදා දෙමළ සාහිත්‍යක හෝ ඉතිහාස ග්‍රන්ථයක සඳහන් නොවීම ය. මහාවංශය පක්ෂපාති ලෙස ලියවුණු ග්‍රන්ථයක් විනි නම්, එම ග්‍රන්ථයෙන් මෙවන් පුවතක් කිසිවිටෙක බලාපොරොත්තු විය නොහැක.

එළාර රජු ගැන එකදු වරදක්, අවප්‍රවෘත්තියක් හෝ දෝෂයක් මහාවංශයෙන් සොයාගත නොහැකිය. සෘජුවම මහාවංශය පුන පුනා ප්‍රකාශ කරන්නේ රජුගේ සෘජු ක්‍රියා පිළිවෙතයි. ඔහුගේ ධර්මිෂ්ටභාවයයි. රාෂ්ට්‍ර පාලනයෙහිලා සහනශීලී භාවයයි. ඔහුගේ චරණ ගුණ ස්වභාවයයි. වසර 44 ක් පුරා වෙනත් ජන කණ්ඩායමක් දිනාගනිමින් ඔවුන් අතර කිසිදු ප්‍රතිරෝධයකින් තොරව මනා ලෙස පාලනය ගෙනගිය අති දක්ෂ, තීක්ෂණ, උපායශීලී නායකත්වයයි. සැබැවින්ම ඔහු අපූරු රජ කෙනෙක් විය. එහෙත්, ලැබූ බලයෙන් මත්ව ගිය ප්‍රවේසම්

වීරහිත ඔහුගේ සහචර කැල මේ මහා පාලකයාගේ ශෝකාන්තය ලියමින් සිටියහ. බලකාමයෙන් මත්වගිය අවශේෂ රාජ්‍ය බලය ඇති පාලකාධිකාරීහු බහුතර ජනයා පෙළන සුළු විෂමචරියාවෙන් යුක්ත වූහ. එළාර රජුගේ කල්පනාකාරී හා ප්‍රවේසම් සහගත බව නොසලකා ඔවුන් කෙතරම් අමනෝඥ ලෙස කටයුතු කළේද යැයි කිවහොත් බොහෝ ජනයා විසින් පූජාමානන කරන්නා වූ අගනගරයේ පිහිටි ප්‍රධාන ආගමික ස්ථානයන් පවා කෙළෙසන්නට ද ඔවුන් පෙළඹුනහ. මෙය රුහුණේ සිටි රාජකීය තරුණයා වූ ගාමිණී අභය ප්‍රමුඛ පිරිසට පැවති රාජ තන්ත්‍රයට එරෙහිව නැගී සිටීමට අවැසි පසුබිම සකසන්නට විය. සැබැවින්ම මෙය ජාතිවාදී හෝ ආගම්වාදී යුද්ධයක් නොවේ. එය එසේනම් එළාරයන්ගේ සේනාවේ කෙසේ නම් සිංහල නායකයින් සේනාපතීන් ලෙස සිටීද්ද. එපමණක් නොව මහා විහාරය, මහා බෝධිය, ථූපාරාමය, මිහින්තලය ආදී ආගමික මධ්‍යස්ථානවලින් සපිරි සංඝයාද සහිත අගනුවර තුළ හිඳිමින් 44 වසරක් පාලනය කිරීම තුළින්ම එය වනාහි ජාතීන් අතර ඇතිවූ යුද්ධයක් නොවේය යන්න අපට අවබෝධ කරගත හැක. එළාර රජු යටතේ සේවය කළ පිරිස් අතර බෞද්ධයන් බොහෝ විය. කොටින්ම කිවහොත් රජුගේ රථාචාරියා  සහ ඇමතිවරයා පවා බෞද්ධයන් බව යට කී සැගිරියේ සැය බිඳීමේ කතා වස්තුවෙන්ම වටහාගත හැක.

වීර කාව්‍යන් පිලිබඳව සඳහන් කරන විට ඓතිහාසික වටිනාකමින් යුක්ත ලොව පරසිඳු ග්‍රීක වීරකාව්‍ය ද්විත්වයක්  සහ මහා භාරතය පිළිබඳව කථාකළ යුතුම වේ. සම්භාවනීය මහා සාහිත්‍යධර හෝමර් විසින් රචිත ඉලියඩ් නම් ග්‍රීක වීර කාව්‍යයෙහි ප්‍රධාන වීර චරිතය වන ඇකිලස් විසින්, මරා දමන ලද හෙක්ටර්ගේ මළසිරුරට පවා වදදෙන ඔහු එම මළසිරුර තම රථයෙහි බැඳ නුවර වටා ගමන්කොට අවමන් කර ඇතැයි ඉලියඩ් හි සඳහන් වේ. නමුත්, මෙම ඓතිහාසික සංග්‍රාම සංසිද්ධියේ, දුටුගැමුණු රජු තමන් හා ද්වන්ධ සටනින් වීර මරණයට පත් වූ එළාරයන්ගේ සිරුර රජ කෙනකුට දක්වන ගෞරවය සහිතව මිහිදන් කරවා, පසුව කුඩා චෛත්‍යයක් ද කරවූ බවත්, එළාර සොහොන අසලින් රජ පවුලේ අයකු හෝ ගමන් කරන්නේ නම් තූර්යවාදන නතර කොට ගෞරව කළ යුතු බැව් දුටුගැමුණු රජතුමා ආඥා කළේය. ස්වකීය සතුරාට මෙවැනි ගෞරවයක් ලබාදෙන්නේ නම් දුටුගැමුණු සහ එළාර අතර පැවති සටන ජනවාර්ගික අර්බුදයක් වශයෙන් හුවා දැක්වීම සම්පූර්ණ වශයෙන්ම අශාස්ත්‍රීය බව මෙයින් පැහැදිලි වෙයි.

මහා භාරතයේ කුරු පාණ්ඩවයන් අතර ඇති වූ යුද්ධය වනාහි ජාතිවාදී හෝ ආගම්වාදී, වර්ගවාදී හෝ කුල අරභයා ඇති වූවක් නොවේ. එළාර හා දුටුගැමුණු රජුන් අතර ඇති වූයේ ද එවැන්නකි. එය හුදෙක් රාජ්‍ය බලය උදෙසා කළ මහා සංග්‍රාමයක් විය. ඔවුනොවුන් රාජ්‍ය බලය අත්පත් කරනු වස් සිදුකළ සංග්‍රාමයක්ම විය. මහා භාරතයේ ධර්මරාජ ලෙස විරුදාවලිය ලද යුදිශ්ඨිරයින් ද්‍රෝණයින්ගේ පුත් අශ්වත්ථාමා මරණ ලද්දේ යැයි මුසාවක් පැවසීමෙන් මහවීර ද්‍රෝණයින් මානසික පසුබෑමකට ලක්කොට හෙතෙම යුද වැදීමෙහිලා උකටලී කළ බවත්, බලකාමය වනාහි ධර්මකාමීන් පවා අධාර්මිකයින් කරනා බවක් වේද ව්‍යාසයින් මහා භාරත කාව්‍යයේ පෙන්වාදෙයි. මේ ආකාරයෙන්ම  මහා වංශයෙහි තම පියාණන් වහන්සේට කාන්තා ඇඳුම් ආයිත්තම් සහ ආභරණ යැවීමෙන් ලැජ්ජාවට පත්කළ ගාමිණී අභය වන ඔහු ජනයා අතර දුෂ්ටගාමිණී ලෙස ප්‍රකට වූ වගද මහා වංශය නොපැකිළව සඳහන් කරයි.

මහාවංශයෙහි සඳහන් ඓතිහාසික සංසිද්දීන් තුළ විටෙක රජවරුන්ගේ බිසෝවරුන් දමිළයින් වූහ. සිංහල රජවරුන්ගේ ජීවිතාරක්ෂකයින් දමිළයින් වූහ. එමෙන්ම, දමිළයින් රජවූ කළ ඔවුන්ගේ විශ්වාසයට පාත්‍ර වූයේ සිංහල රාජ්‍ය ආමාත්‍යවරුන් ය. සිංහල බිසෝවරුන්ගේ වල්ලභයින් දමිළයින් වූහ. එමෙන්ම, බෞද්ධ අටුවා ග්‍රන්ථ රචනයෙහි දමිළ භික්ෂූන්ගේ සන්දර්භය අනභිභවනීය වේ. මහාසේන බඳු සිංහල රජවරුන් හට ගුරුහරුකම් කළේ සංඝමිත්‍ර වැනි දෙමළ භික්ෂූන්ය. එකල සිංහල බෞද්ධ භික්ෂූන් හට දමිළයින් පිදූ ලෙන් පූජා පිළිබඳව ලක් පොළවේ ලෙන්ලිපි අදත් සාක්ෂි සපයයි.

<u>මේ සියලු කරුණු විශ්ලේෂණය කිරීමෙන් අපහට කාරණා කිහිපයක් මනාව පසක්කර ගත හැක.</u>

- ➢ මධ්‍යස්ථව, සාවධානව විමසා බලන්නේ නම් මහා වංශය වනාහි මධ්‍යස්ථව ලියවී ඇති වගයි.
- ➢ දෙමළ මූලාශ්‍රයන්හි හෝ සඳහන් නොවන දෙමළ පාලකයින්ගේ තොරතුරු.
- ➢ ඉතිහාසය පුරාවට සිහළ දෙමළ අප කිසි විටෙකත් ජාතිවාද  හෝ ආගම්වාදී යුද නොවැදුන බව.
- ➢ දෙජාතීන් අතර ආවාහ විවාහ සබඳතා බහුලව සිටි මුතුන් මිත්තන්ගෙන් පැවත එන අප එකිනෙකා කුමන හෝ අයුරකින් ඥාතීන් වන වග.

විටෙක යුද වැදීමෙන් ද, විටෙක එක්ව ආවාහ විවාහ සබඳතා පවත්වමින් ද, විටෙක දමිළ රට දමිළ පාණ්ඩ්‍යයන් හට ඔවුන්ගේ රාජ්‍යත්වය රැකගැනීම පිණිස උපකාර කිරීමෙන් ද,  විටෙක දෙමළ රටට ගොස් එහි දේවත්වයෙන් පිදුම් ලද කාන්තා වන්දනාව මෙරටට ගෙනවිත් එම දෙමළ කාන්තාව දේවත්වයෙන් සලකමින් ද, තවත් විටෙක සිහළ මහසෙන් රජු 'මින්නේරිය දෙවියන්' ලෙසත් 'කුලක්කෝට්ටන්' ලෙසත් වන්දනාමාන කරමින් ද, තවත් විටෙක ද්‍රවිඩ සම්භවයන් ඇති පුරෝහිතයන් ලවා තම රාජකීය දරුවන් හට ශිල්ප ශාස්ත්‍ර දීමෙන් ද, විටෙක රජුන්ගේ ජීවිතාරක්ෂකයින් ලෙස ද අප දෙපිරිස ජීවත් වී ඇත්තෙමු. සැබවින්ම මෙය සහෝදර ප්‍රේමය විදහා පාන්නක් නොවේද ? ලොව කෙතරම් රටවල් තිබේද ? එහි කෙතරම් යුද ආදී අර්බුධ තිබුණිද ? එවැනි අර්බුධයන් හේතුවෙන් භේද භින්නත්වයට පත්වූ ඔවුන් නැවත එකට සමගිව සිටිනවා ඔබ දැක ඇත්නම් එය දුර්ලභය. නමුත්, ලාංකික අප ඊට හාත්පසින්ම විරුද්ධ ගති පැවතුම් ඇත්තන් වන්නෙමු. අප අපගේම අතීතය ආවර්ජනය කොට බලමු. අප අතැරදැමූ අත් බැඳ ගැනීමට කාලය පැමිණ ඇත. තවදුරටත් අප අන් අධිරාජ්‍යවාදීන්ගේ රූකඩයින් නොවෙමු. එක්ව නැගෙමු. මෙය අපේ දේශයයි.. එසේය.. මෙය අප සියල්ලන්ගේම මාතෘ භූමියයි. ජාති ආගම් කුල භේදයන් ඉක්මවා ගිය දේශමාමකයින් වෙමු. හදවතින්ම ශ්‍රී ලාංකිකයන් වෙමු.

<u>**මූලාශ්‍ර**</u>


1. *පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ, මහාවංශය ශ්‍රේෂ්ඨ උත්තමයන්ගේ පරම්පරා කථාව.*
2. *ශ්‍රී ලංකා පුරාවිද්‍යාව මෙම් සිටුව, පොළොන්නරුව වේලයික්කාර සෙල්ලිපිය*
3. *රාජාවලි, මහාභාරතය*
4. *Homer. The Iliad. New York: Norton Books.*





# සෙබළ සිතුවිලි

## මගේ අම්මා...

මටම විතරද මගේ අම්මෙ
මෙහෙම ආදරයක් තියෙන්නේ
මටත් ඔබ නැති ලොවක් නැත්තේ
මටම විතරද මගේ අම්මෙ

අනේ... දුක් විඳ ලොවක් තැනුවට
මාව තැනකට අරන් ආවට
එදා මන් ගැන ඔබ හිතූ දේ
මටත් අම්මා ගැන එලෙසම සිටින්නට වී තිබේ
මක් කරන්නද ලොවක් තැනුවට
ණය බරින්වත් නිදහසක් මට තිබුනොතින්

සෙ/381650
ලා/කෝ ප්‍රියංග විචිවන්
12 ශ්‍රීලංසිරෙ



## ජීවිතය...

නිරුවතින් ඉපදී
දහසක් දේ රැස් කර
සුදු වතින් සැරසී
සියල්ල අතහැර යන
නවාතැන් පලකි ජීවිතය.......

ඒ බව නොදත්
දුෂ්ඨ සිත් ඇත්තවුන්
රඟති රඟ මඩල තුල
උඩගු සලු ඇඟලා
බාගෙට ගලවගෙන........

සියල්ල වැටහෙන කල
පමා වැඩි උඩගු නුඹ
හැරී පසුපස නැවත බැලූ විට
දැනෙයි ඔබටත්
එදා අන් සිත් වලට දැනි දුක........

කෝප්‍රල් පින්ශාරිකා ඩබ්ලිවිපී
11 ශ්‍රීලංසංබ



## නුඹ...

නුඹ මා බොහෝ සෙයින් පෙළන්නිය
නුඹ මා මතකෙන් වෙන්ව මගේ ප්‍රේමය
තවතවත් සුඳුවත් කරයි
මෙය කෙසේ සිදුවි දැයි නො අසනු මැන
නුඹ මා සමීපයටම පැමිණෙයි

"චපා" කියන්නෙමි මම
"චපාද" කියා අසන්නිය නුඹ

මෙය මාගේ සිත කුල්මත් කරනුයේ
කිමදැයි කෙසේදැයි නොඅසනු මැන

ලා/කෝ රාධිකා සිවල්
2(සෙව) ශ්‍රීලයුපොදුසේබ




## කුමටද මේ එක් දිනක්...

ලොවක් තනන්නට... සරසන්නට
රහසේම වෙහෙසෙන්නී
සිතුවමක් හැඩ කරන්නාක් මෙන්
ජීවිතවල වර්ණ ගන්වන්නී
ඇයගේ දුක් අපට නොදී
අපේ දුක් කරදර දරාගන්නී
සිනහවෙන් ලොවක් රස ගන්වා
හදවතින් වැලපෙන්නී
ලෝකයටම හුස්ම පිඹින ඇයට
කුමටද මේ එක් දිනක්

සෙ/328577
කෝප්‍රල් හේමචන්ද්‍ර බීජීවන්
19 ශ්‍රීලපාහ

# චිත්ත චිකිත්සාවේ අදත් රජයන ෆ්‍රොයිඩ්



මිනිස් සිත හා මිනිස් හැසිරීම් රටාව පාදක කරගත් අධ්‍යයනයක් වූ සිග්මන් ෆ්‍රොයිඩ්ගේ මානසික විශ්ලේෂණය මීට දශක කිහිපයකට පෙර බොහෝ බුද්ධිමතුන්ගේ අවධානයට හා හැදෑරීමට ලක්වූ විෂයකි. ෆ්‍රොයිඩ් මිනිස් මනස අරභයා ඉදිරිපත් කළ සිද්ධාන්තයන් ගෙන් ඔබ්බට නූතන මනෝචිකිත්සා විශේෂඥයන් ගමන් කිරීමට සමත් නැති සෙයක් දක්වයි.

ආජන්ටිනාවෙහි මිලිටරි ජුන්ටාව රජයන සමයේ එනම් 70 දශකයේදී සිය ගණනින් මිනිසුන් අතුරුදහන් වීම සුලභව සිදුවුනු දෙයක් විය. මෙසේ අතුරුදහන් වුන හෙවත් මරා සඟවා දැමුණු පුද්ගලයන් අතර, මනෝ චිකිත්සකයන් දුසිම් කිහිපයක්ද විය. එපමණකින් නොනැවතුණ දක්ෂිණාංශික හමුදා රජය සිග්මන් ෆ්‍රොයිඩ්ගේ පොත්පත් ප්‍රසිද්ධියේ පුලුස්සාලන ලෙසද අණ කිරීමට තරම් සැහැසි විය. වෙනත් බොහෝ රටවලට වැඩියෙන් ෆ්‍රොයිඩ්වාදය අගය කෙරෙන රටක් බවට පත්ව ඇති ආජන්ටිනාවෙහි අගනගරය වන බුවනෝස් අයර්ස් පුරය අද මනෝචිකිත්සකයන්ගෙන් පිරී ඉතිරී පවතින්නකි.

ෆ්‍රොයිඩ්ගේ මනෝවිද්‍යා සංකල්පයට ආජන්ටිනාවෙහිදී එල්ල වූයේ හමුදා ප්‍රහාරයක් වුවත් අද එයට ලොව පුරා බුද්ධිමතුන්ගෙන් එල්ල වන බුද්ධිමය ප්‍රහාරය ඊට වඩා ප්‍රබලය. මූලික න්‍යායයන් කිහිපයක් මත ගොඩනැගී වර්ධනය වූ මේ සංකල්පය ලොව පුරා ප්‍රබල ලෙස ප්‍රචලිත වූයේ එක් දහස්

නවසිය පනස් ගණන්වලදීය. ඊළඟ දශක තුන තුළදී ධනවතුන්ට පමණක් සේවය කළාවූ මිළ අධික සේවාවක් බවට මනෝචිකිත්සාව පත්විය. ඒ වගේම මනෝචිකිත්සාව මගින් රෝගය නිර්නය කිරීම හා මානසික විකෘතීන්වලට පිළිතුරු සෙවීමේ ඇති ප්‍රතිඵලදායකත්වය පෙර නොවූ විරූ සේ විවාදයට ලක්වූයේ ද මේ දශක තුන ඇතුළතදීය.

එසේම, මේ කාලය තුළදී මනෝචිකිත්සාවේ ආරම්භක කර්තෘවරයාගේ සංකල්පයක් පමණක් නොව ඔහුගේ චරිතය ද බුද්ධිමතුන්ගේ හා ලේඛකයන්ගේ මනෝ විශ්ලේෂණයට ගොදුරු වීම වලක්වාගනු බැරි විය. ප්‍රොයිඩ්ගේ ජීවන චරිතය හා දර්ශනය අළලා ලියැවුණු බොහෝ පොත්පත් අතුරින් සමහරෙක් ඔහු නියුරෝසියාවෙන් හෙවත් කිසියම් මනෝ විකෘතියකින් යුත් අයකු ලෙසට ද හුවා දක්වන ලදී. මෙබඳු කෘතීන් විසින් ඔහු නියුරෝසියාව පිළිබඳව ගොඩනංවන ලද න්‍යායයන් පිළිබඳව ප්‍රශ්න මතුකරනු ලැබුණි.

අවිඥානයට නම්‍ය අරුතක් සපයමින් අවිඥානය අලුතින් සොයා ගැනීමට සමත්වූයේ ප්‍රොයිඩ් විසින්ය. අප සිත් තුළ ඇතිවන විපර්යාසයන් හා සිදුවීම්වලින් බොහෝමයක් සිදුවන්නේ අපට නොදැනුවත්වම බව ඔහු ප්‍රකාශ කළේය. කට වචනයක් වැරදීමේ පටන් ජීවන සහකරුවකු හා එක්වීම තරම් බැරෑරුම් දෙයක් දක්වා වූ සියලු සරල හා සංකීර්ණ සිදුවීම් සිදුවන්නේ අහම්බයකින් නොවේ. මේවා සිදුවන්නේ අපටම නොතේරීම වන අතර, ඊට මූලික වන්නේ මනසේම ඇතිවන හැඩගැසීම හා බලපෑම හේතු කොටගෙනය.


> ප්‍රොයිඩ් පවසන පරිදි වැඩිවියට පැමිණෙන අප විසින් බාලවිය නැවත නැවතත් පුනරුච්චාරණය කරනු ලැබේ. අප මිතුරකු සමඟ ගොඩනගා ගන්නා මිතුදම සහෝදරයකුට අප දැක්වූ ලෙන්ගතුකමෙහි ඡායාවක් වෙයි. එසේම, පෙම්වතාට හෝ පෙම්වතියට අප විසින් දක්වන ආදරයද මවට හෝ පියාට දක්වන ලද ආදරයෙන් බිඳී ආවක් වෙයි.

අප ඉපදී සතරවැනි වසරට පමණ ළංවෙද්දී අප සෑමකෙනකුම ඊඩිපස් සංකල්පය තුළ සිරවී සිටින බව ප්‍රොයිඩ් නිගමනය කළේය. (ඊඩිපස් යනු ඒ බව නොදැන සිය පියා ඝාතනය කොට තමන්ගේම මව් විවාහ කරගත් බැව් කියැවෙන මිථ්‍යා චරිතයකි). මව්පිය දෙදෙනාගෙන් සම ලිංගිකයාට ආදරය කිරීමටත් විරුද්ධ ලිංගිකයා කෙරෙහි බිය හා සිත්හි සැඟවුණු කෝපය දැක්වීමටත් අප පෙළඹෙන බව ඊඩිපස් සංකල්පයෙන් ප්‍රොයිඩ් පෙන්වා දුන්නේය. ලිංගිකාශාව පාදක කරගත් මේ හැඟීමෙහි ඇත්තාවූ දැඩි අස්වාභාවිකත්වය වටහා ගැනීමට සමත්වන අප විසින් අවිඥානකවම එය යටපත් කරනු ලැබේ.

අප තුළ ඇතිවන සෑම වර්ගයකම නියුරෝසියා තත්ත්වයකටම මුල් වන්නේ මානසිකයෙහි ඇත්තාවූ මෙකී ඝට්ටනය බව ප්‍රොයිඩ් නිගමනය කළේය. ප්‍රොයිඩ් පවසන පරිදි වැඩිවියට පැමිණෙන අප විසින් බාලවිය නැවත නැවතත් පුනරුච්චාරණය කරනු ලැබේ. අප මිතුරකු සමඟ ගොඩනගා ගන්නා මිතුදම සහෝදරයකුට අප දැක්වූ ලෙන්ගතුකමෙහි ඡායාවක් වෙයි. එසේම, පෙම්වතාට හෝ පෙම්වතියට අප විසින් දක්වන ආදරයද මවට හෝ පියාට දක්වන ලද ආදරයෙන් බිඳී ආවක් වෙයි.

1939 දී මියගිය ප්‍රොයිඩ් සෑම දෙයක්ම කාලානුරූපව පැවතීමෙන් අනතුරුව අතීතයෙහි වැළලී යයි. අප විසින් පළකරන අදහස් උදහස් ද අවුරුදු 20-30 ඇවෑමෙන් මෙලෙස අතීතය තුළ සැඟවෙනු ඇතැයි තම ජීවිතයෙහි අග භාගයෙහි ලියූ හසුනක සටහන් කළේය. එහෙත් ආජන්ටිනාවේ චිත්ත චිකිත්සා සංගමයේ ඉහළ සාමාජිකයකු වන දොස්තර තියඩෝර් ශාපිරෝ ප්‍රොයිඩ්ගේ තර්කනයට එකඟ නොවෙයි. භෞතික විද්‍යාව අයින්ස්ටයින්ට හරි නිව්ටන්ට හරි අයිති වුණා වගේ චිත්ත චිකිත්සාවත් තනි මිනිහෙක් ගොඩනගපු විද්‍යාවන්ගෙන් එකක් යැයි ඔහු පවසයි.

- 1998 wf .daia;=-ukyr¨ iÕrdj weiBls -


## ඔබේ ලිපි/නිර්මාණ අප වෙත එවන්න...

විශේෂාංග රාශියකින් සමන්විත නව මුහුණුවරකින් එළිදක්වන රණවිරුවාහි ඔබගේ ලිපි, නිර්මාණ වෙනුවෙන් වැඩි ඉඩකඩක් වෙන් කෙරේ. ඔබ ඇසූ දුටු අත්විඳි ඕනෑම දෙයක් නිර්මාණශීලීව අප වෙත ලියා එවන්න. එසේ එවනු ලබන කවි, නිසඳැස්, කෙටිකතා, ලිපි හා ඡායාරූප ආදිය (සුදුසු ඒවා) අප්‍රමාදව රණවිරුවාහි පලකිරීමට කටයුතු යොදා ඇත. ඔබේ නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක "රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර,
ranaviruwa@yahoo.com



1990 මාන්කුලම් කඳවුර ඉදිරිපිට A - 9 මාර්ගයේදී (සූරියබණ්ඩාර ජීප් රථයේ පිටුපස දකුණේ)

(පසුගිය සතියේ ඉතිරි කොටස)

## මාන්කුලම් සටනේ මතක...

# කවුරු ගියත් මම මේක අතාරින්නෙ නෑ






■ ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ


**සැරයන්** සූරියබණ්ඩාර විසින් මා වෙත ලබාදී තිබූ සේයාපටල සුද්ද කරගැනීම පිණිස මා හට ඉමහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවිය. ඩිජිටල් තාක්ෂණය පැමිණීමත් සමඟම ජායාරූප ගැනීම සඳහා එවැනි ෆිල්ම්රෝල් භාවිතා නොකිරීම ඊට හේතුව විය. කෙසේ හෝ අමතර වියදමක් ද දරමින් ගම්පහ නගරයේ එක්තරා තැනකින් එලෙස සුද්ද කරගත් එම සේයාපටල තුළ මාන්කුලම් ප්‍රහාරයට අදාළ අතිදුර්ලභ අවස්ථා දැක්වෙන ජායාරූප රැසක් මා හට ලබාගත හැකිවිය. සැරයන් මේජර් උදේපාලට ද කොකාවිල්හි සිට ජීවිත බේරාගෙන පැමිණි සැරයන් මේජර් නිමල් සිරිවර්ධනට ද පෙන්වන ලද්දේ එහිදී ලබාගත් ජායාරූපය.

එසේම, මාන්කුලමේ උදේපාලගේ කැමරාවේ සටහන් වූ තවත් දුර්ලභ ජායාරූපයක් ද තිබිණ. එහි වූයේ එම කඳවුරෙහි සැරයන් මේජර් ලෙස කටයුතු කළ සැරයන් මේජර් වීරසුන්දරගේ රුවය. මාන්කුලම් ප්‍රහාරයට පසු අවස්ථාවක ඔහු තවත් දෙදෙනෙක් ද සමඟ කතාබස් කරන අයුරු දැක්වෙන එම දුලබ ජායාරූපය ද ගෙන තිබුණේ සෙබළ සූරියබණ්ඩාර විසින්මය. සැරයන් මේජර් වීරසුන්දර කටයුතු කරන ලද්දේ මාන්කුලමෙහි කණ්ඩායම්භාර සැරයන් මේජර් ලෙසය. 1990 ජූනි 15 වන දින මධ්‍යම රාත්‍රියේ සිදුවූ මාන්කුලම් ප්‍රහාරය හමුවේ ඔහුගේ නිර්භීත බව හා නායකත්වය නොවන්නට එහි ප්‍රතිඵලය සහමුලින්ම වෙනස් වන්නට ඉඩ තිබුණි. සැබෑ ලෙසම කියතොත් මාන්කුලම් සටනේ වීරයන් දෙදෙනා සැරයන් මේජර් වීරසුන්දර හා සෙබළ සූරියබණ්ඩාර බැව් පැවසීම අතිශයෝක්තියක් නොවේ. (මා විසින් රචනා කළ අවිඹිමක ගිනියම කෘතියෙහි ඔවුන්ගේ අසමසම භූමිකාව සවිස්තරව දක්වා ඇත)

සැරයන් මේජර් වීරසුන්දර පිළිබඳ ලද හෝඩුවාවක් ඔස්සේ මා ඔහු හමුවීමට ගියේ මාන්කුලම් සිදුවීමෙන් හරියටම වසර 27 ක් ගත වූ පසුවයි. ඒ වනවිට ඔහු ලුතිනන්වරයකු ලෙස යුද හමුදාවෙන් විශ්‍රාම ලැබ පදිංචිව සිටියේ නුවරඑළිය Lover's leap දියඇල්ලට යන මාර්ගයේ



සැරයන් මේජර් වීරසුන්දර (මැද) මාන්කුලම කඳවුරේ දී



සැරයන් මේජර් උදේපාල මාන්කුලම් සිදුවීමෙන් වසර 34 කට පසු



සැරයන් මේජර් වීරසුන්දර 1990 දී



සැරයන් මේජර් සූරියබණ්ඩාර මාන්කුලම් සිදුවීමෙන් වසර 34 කට පසු

කන්දක් මුදුනේ පිහිටි නිවසකය. එහිදී, ඔහුද එම අනපේක්ෂිත ප්‍රථම හමුවේදී වික්ෂිප්ත වූයේ මාන්කුලමේදී ලබාගත් ඔහුගේ රුව ඇතුලත් ඡායාරූපයක් මා ඔහුට පෙන්වූ අවස්ථාවේදීය. සැරයන් මේජර් වීරසුන්දර පිළිබඳව ද සොබාසිරිගේ පොතෙහි තබා ඇති සටහන පුදුම සහගතය. එහි මෙසේද සඳහන් වේ.

"එක්තරා දිනක සවස්වරුවේ මාන්කුලම්හි හට පිරිස් කඳවුර මධ්‍යයේ වූ හට නිවාසයක් අසලට රැස්වූයේ සැරයන් මේජර් වීරසුන්දරගේ නියෝගයකට අනුවටය. ඇඳිරි වැටෙමින් තිබූ මූසල සැඳෑවක එදින ඔහු අප හමුවේ කෑගසා පැවසූ දෙයින් සැවොම බෙහෙවින් භීතියට පත්වූහ. එහිදී, ඔහු කියා සිටියේ එදින සවස එම කඳවුරට නිසැකවම ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ලවන බවය.

"ඉර හඳ පායන එක විශ්වාසයි නම් අද රෑට ෂුවර් එකටම අපේ කෑම්ප් එකට කොටි ගහනවා. සමන් දෙයියන්ගෙ අඩවියෙ ඉඳලා ආපු වීරසුන්දර මම, කවුරු ගියත් මම මේක අතාරින්නෙ නෑ. උඹලා හැමෝම පන වගේ උදව් කරන්න ඕනෙ මට. ඔහු දැඩි ස්වරයෙන් යුතුව අප හමුවේ පැවසුයේ දැත් මිටි මොලවමිනි."

සොබාසිරිගේ පොතෙහි ඉහත සැරයන් මේජර්වරයා පිළිබඳ වූ සටහන තුළින්ම මාන්කුලම්හි ඔහුගේ භූමිකාව කෙසේ වීදැයි වටහා ගැනීම අපහසු නොවේ.

මේ සියල්ල අතරේ පෙරදිනක සූරියබණ්ඩාර මා හමුවට ආ පරිද්දෙන්ම තවත් සැරයන්වරයකු ද මා හමුවට ආවේය. රත්නපුර ප්‍රදේශයේ පදිංචිකරුවකු වූ ඔහු අන් කිසිවකු නොව සැරයන් සොබාසිරිය. ඔහුද දුරකථන ඇමතුමක් හරහා මා සොයා පැමිණ තිබුණේ ඒ වනවිට මා රචනා කරමින් තිබූ මාන්කුලම් කොකාවිල් ග්‍රන්ථයට අදාල තොරතුරු ලබාදීමටය. එහිදී ඔහුගේ හමුවීම මා හට සුවිශේෂත්වයක් වූයේ සූරියබණ්ඩාර විසින් මා වෙත ලබා දී තිබූ CR පොතෙහි රචකයා ඔහු වීම නිසාය. එහිදී, එම ප්‍රහාරය හා සම්බන්ධව ඔහු හා කතාබස් කිරීමේදී දැනගන්නට හැකි වූයේ වැදගත් හා රසවත් තොරතුරු සමූදායකි. එම හමුවේදී වූ තවත් විශේෂත්වයක් වූයේ ආධුනික සෙබළකු ලෙස 1990 වසරේ මැදභාගයේ මාන්කුලම් කඳවුරේ බංකරයකට වී එහි ක්‍රියාන්විත තොරතුරු සටහන් කළ එම දින පොත ඔහු නැවත දකිනු ලැබුවේ 27 වසකට පසුව වීමය. එදවස මාන්කුලමෙන් නික්මෙන දවසේ එය රැගෙන ගොස් තිබුණේ සූරියබණ්ඩාර විසිනි. එතැන් පටන් එම CR පොත මා අතට පත්වන මොහොත තුරුම එය පැවතියේ ඔහු අතය. මා විසින් සොබාසිරිට එම පොත පෙන්වද්දී ඔහු ඒ දෙස බලා සිටින්නට වූයේ පුදුමයෙනි. එහි වූ ඇතැම් සටහන් සැලකිය යුතු වේලාවක් කියවූ ඔහුගේ මුහුණින් දිස්වූයේ එකී මතක ඔස්සේ ඔහු බොහෝ දුරක් ගිය බවකි. අකුරු රචනයේදී සොබාසිරි තුල පැවති සංයමය ක්‍රියාන්විත පරිසරයේදී වුව එලෙසින්ම පවතින්නට ඇති බැව් එහිදී මා හට සක්සුදක් සේ පැහැදිලි විය.

සොබාසිරිගේ සටහන් එකතුවේ අවසාන පිටුව් ලියා තිබුණේ උතුරා ගිය බලාපොරොත්තු සමූදායක් ද සමගිනි. රණවිරුවකු ලෙස ගිනි අවි අත දරා යුද වැදුණ ද ඔවුන් තුළ පොදු සමාජයේ සෑම අයකුට සේම ආදරය හා සාමය වෙනුවෙන් ඇති අධික ඕනෑකම එලෙසින්මය. සොබාසිරි එම CR පොතෙහි පහත අයුරින් ලියා තිබූ එකී සටහන් ඒ බැව් අපට යළි යළිත් පසක් කරවයි.

"ඉර හඳ පායන එක විශ්වාසයි නම් අද රෑට ෂුවර් එකටම අපේ කෑම්ප් එකට කොටි ගහනවා. සමන් දෙයියන්ගෙ අඩවියෙ ඉඳලා ආපු වීරසුන්දර මම, කවුරු ගියත් මම මේක අතාරින්නෙ නෑ. උඹලා හැමෝම පන වගේ උදව් කරන්න ඕනෙ මට." ඔහු දැඩි ස්වරයෙන් යුතුව අප හමුවේ පැවසුයේ දෑත් මිටි මොලවමිනි

"ගුවන් හමුදාවේ හෙලිකොප්ටර් යානා තුනක් ඝන වනාන්තරයේ ත්‍රස්ත වෙඩි නොතකා පහත් කරද්දී පතොරම් සහ ආහාර ද්‍රව්‍ය හෙලීමෙන් අනතුරුව තුවාල ලැබූ හා අනෙකුත් සෙබළුන් කණ්ඩායම් වශයෙන් ඉවත් කරගන්නා ලදී. එසේම, දෙවන අදියර යටතේත් ආහාර ද්‍රව්‍ය ගොඩබාන ලදී. දැඩි හිරු දාඩිය නිමා කරමින් අකල් වැස්සක් උතුරට වැටිණි. අප සෙබළු එම වැසි නොතකා කඳවුරට කරමතින් ආහාර ගෙන ආහ. එය ඔවුන්ගේ සිත් තුළට තාවකාලිකව හෝ සැනසීමක් ලැබුණ දිනයක් වූයේ පාලුව, කාන්සිය නිවා ගන්නට සිගරැට්ටුවක් ලැබුණ අවස්ථාව එය වූ නිසාය. මවගෙන්, මිතුරන්ගෙන්, පෙම්වතියගෙන් ලද හසුනකින් සිත සැනසිණ. නිවසට ගොස් දෙමාපියන් බැලීමේ සිහිනය දැන් දැන් සිත්තුළ ලියලා වැඩී ඇත. ඒ දේ සැබෑවන පෙරනිමිති පහළ වී ඇත. දින, සති නොව මාස ගණන් සිත වෙහෙස කරවූ ඒ සිහිනය දැන් සැබෑ විය. දෙවියන් අභියස උදේ සවස මා ගැයූ යාතිකාව සපථ විය.

**ඉහත සටහනට අමතරව සොබාසිරිගේ දිනපොතෙහි තම ආදරණීය මව වෙනුවෙන් ද දයාබර පෙම්වතිය වෙනුවෙන් ද ඉඩක් වෙන්කොට තිබුණේ සටන් බිමෙහි රැඳි සියලු රණවිරුවන්ගේ හදගැස්ම නියෝජනය කරන්නාක් මෙනි. එහි ඔහු පබැඳි අකුරු මෙසේ විය.**


සැරයන් සොබාසිරි

**රත්තරන් අම්මේ...**

**මා ඔබේ අභියස දෙදණ තබා රණ පිටියට පැමිණියෙමි. ඒ වරමින් රුදුරු වූ සතුරා වනසාලමි. රන්කිරි ලේ උරා අභිමානවත් සටනක් නිම කළෙමි. මා දැන් ඔබ පෙවූ කිරි කළ හතට ණය නැත. ඒ කිරි නැවත ලේ වෙමින් උපන් දේශයේ වැගිරී ඇත. නොහඬන් අම්මේ. ඔබේ පුංචි පුතා වීර ගැමුණු කුමරුවෙකි. එස වූ අවිය සතුරා හිසෙහි මිස නිකරුණේ පහත නොහෙලන්නෙමි. ඔබේ කඳුල සිනහවක් කරන්න මා එන දිනයට. දෙවි බුදුන් පවා අපට ආශිර්වාද කරන්නේය. ඔබ පාමුල දෙදණ නමන්නට මා එනවා මතු දිනයක.**

**දයාබර ප්‍රියාදරියේ...**

**ඔබේ ආදරේ සේම මා උපන් බිමටද ආදරය කරන්නෙමි. ඔබ සෙවණේ රැඳෙන්නට රුපුන් නසා හෙට දිනකදී මා එන්නෙමි. දයාබරව ලියනා මට ඔබ යුද පිටියේද අමතක නොවුනි. සිනාසෙන්න ඔබ. ඔබේ පෙම්වතා උතුරේ උපන්බිම රකින්නේය. සටන දිනා එන දිනයට පිළිගන්න මා සෙනෙහසින්. රටක් දිනූ මට හැගේ ලොවක් දිනුවා සේ...**

**දෙවියනි, ඔබට මගේ ජීවය තුළින් ප්‍රණාමය පුද කරන්නෙමි.**

**හිරු සැඟවෙන විට හිරුගේ අගේ දැනේ**
**සඳු සැඟවෙන විට සඳුගේ අගේ දැනේ**
**තරු සැඟවෙන විට තරුගේ අගේ දැනේ**
**මා තනිවෙන විට ඔබගේ අගේ දැනේ**

**පුරා මාස එකහමාරක් තිස්සේ මා ලියූ සටහන අදින් මෙසේ අවසන් කරන්නෙමි. ආරම්භයේ පටන් අවසන දක්වා ලියූ මේ කටුක වේදනා තුළින් ඔබේ සිත් රිදවන්නට මා නොසිතුවෙමි. අප විඳි දුක්, අප කළ සටන පිළිබඳ සත්‍යතාවය ඔබට මෙනෙහි කරන්නට පමණි මා වෙහෙසවූයේ. උතුරු ඉමෙන් නික්මෙන්නේ මතු දිනයක යළිත් සටනට අවතීර්ණ වන බලාපොරොත්තුවෙනි".**

මේ සියල්ල අතරේ 1990 මාන්කුලම් මතක ඔස්සේ මා පුද්ගලයින් සොයා ගිය ගමනේදී එම කඳවුරේ සිටි වෛද්‍ය සහායකයකු පිළිබඳවද තොරතුරක් කනවැකුණි. ඔහු නමින් වෛද්‍ය බලකායට අයත් සෙබළ මොහොට්ටිය. මුලින්ම දකින විට ඔහු ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ විද්‍යාගාරයෙහි සේවයේ නියුතුව සිටි අතර ඒ වනවිට එහු බලලත් නිලධාරිවරයකු ලෙස යුද හමුදාවෙන් විශ්‍රාම ලැබ පදිංචිව සිටියේ පිටකෝට්ටේ පිහිටි නිවසකය.

පසු දිනක ඔහුගේ නිවසේදී වූ අපගේ හමුව තුල මාන්කුලමට අදාල බොහෝ මතක ඇවිස්සිණ. එහිදී, ඔහු අපූරු කථාවක් කීවේය. තමන් වෛද්‍ය සෙබළකු ලෙස මාන්කුලම්හි සිටි අවධියේ ඊට ප්‍රහාර එල්ල වන්නට පෙර දින සවස සැරයන් මේජර් වීරසුන්දර විසින් ඔවුන් කණ්ඩායමක් ලෙස පෙළගස්වා එදින රාත්‍රියේ කඳවුරට ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ල වන බවට සපථකර ප්‍රකාශ කරන ලද බවයි. ඔහු සිදුකල ගාම්භීර ප්‍රකාශයද බලලත් නිලධාරී මොහොට්ටි සිහිපත් කළේය.

"හෙට උදේ ඉර පායන එක විශ්වාසයි නම් අද රෑට ෂුවර් එකටම අපේ කෑම්ප් එකට කොටි ගහනවා. සමන් දෙයියන්ගේ අඩවියේ ඉඳලා ආපු වීරසුන්දර මම, කවුරු ගියත් මම මේක අතාරින්නෙ නෑ. උඹලා හැමෝම පන වගේ උදව් කරන්න ඕනෙ මට"

මෙහි ඇති විශ්මය නම් ඒ වනවිට වෛද්‍ය සෙබළ මොහොට්ටි වසර 28 කින් සැරයන් මේජර් වීරසුන්දර දැක කතා කොට නොතිබීමයි. 1990 දී සොබාසිරි විසින් මාන්කුලමේ සිට ලියූ එම CR පොතෙහි වීරසුන්දර පිළිබඳ සටහන කොතරම් සත්‍යදැයි තේරුම් ගැනීමට එහිදී මා හට තව දුරටත් අටුවාටීකා අවශය නොවිය.

කාලය අපූරු සැනින් ගෙවී ගොසිනි. භෞතික පරිසරය සේම ස්වාභාවික පරිසරයේ බොහෝ තැන්ද එකී කාලසීමාව තුළ වෙනස් වී ඇත්තේ පුදුමාකාර ලෙසය. එදවස දුටු මාන්කුලම් කඳවුර අද එහි නැත. සෙබළ සූරියබණ්ඩාර විසින් එහි අතැර දැමූ උදේපාලගේ කැමරාවද එම කාලවකවානුවේම වෙනත් කිසිවකු විසින් රැගෙන ගොස් හෝ නොඑසේනම් තවමත් එහි කොහේ හෝ තැනක පස් අතර දිරාපත් වෙමින් තිබිය හැක. අරනායක නිවසේ විශ්‍රාම දිවිය ගෙවන සැරයන් මේජර් උදේපාලට සිය කැමරාව අහිමි වූවද සටන් බිමෙහි පෙර මතක නම් පින්තූරවලට වඩා සුපැහැදිළි ලෙස ඔහුගේ මනසේ ඇඳී ඇතුවාට සැක නැත. සැරයන් මේජර් වීරසුන්දර ලුතිනන්වරයකු ලෙස හමුදාවෙන් ඉවත්ව බොහෝ කල්ය. නුවරඑළියේ සුන්දර වටපිටාවක ඔහු සැඳෑ සුවය විඳිනුයේ එදවස විඳි අඳුරු මතක වූව වර්තමානයේ හිඳ සොඳුරු ලෙස සිහිගන්වමිනි. සැරයන් සොභාසිරි ද විශ්‍රාමිකය. එදවස මාන්කුලමෙහි ඔහු ලියූ දිනපොත දැන් ඔහු ලඟ නැත. එය ඇත්තේ මා සතුවය. එදවස මාන්කුලම් සිටි වුන්ගේ මතක අවුස්සන්නට මම 34 වසකට පසුවද ඉඳහිට මෙලෙස ඒ පිටු හෙමි හෙමින් පෙරලමි.

\- නිමි -

පසුගිය කලාපයේ ඉතිරි කොටස...

# දිනෙන් දින සමාජයෙන් නාය යන

# අපේ සිංහල ජන කවිය



සිංහල ගැමියාගේ දැණුම පතපොතට පමණක් සීමා වූ එකක් නොවේ. ඔවුන් දැණුම මෙන්ම රසය හා විනෝදාස්වාදය ලබාගැනීමේ අරමුණින් විශේෂ සාහිත්‍යාංග යක් බිහිකරගනු ලැබීය. ඒවා නම් තේරවිලිය. බුද්ධිමය රසාස්වාදයකට මේ තෙරවිලි හේතු සාධක වුණි. ගැමි ජනතාව පාසල්වලට ගොස් උසස් විභාග සමත් නොවුවද, බුද්ධියේ අඩුවක් නොතිබුණ බව මෙම තේරවිලිවලින් හා ඊට ඔවුන් විසින්ම සකසාගත් පිළිතුරුවලින් පෙනේ.

තේරවිල්ල - උඩින් දුවන වී තෝරා එවාපන්
බිමින් දුවන වී තෝරා එවාපන්
රටින් ගෙනෙන වී තෝරා එවාපන්
රජුට ඔබින වී තෝරා එවාපන්

පිළිතුර - උඩින් දුවන වී ගිරවී නොවේදෝ
බිමින් දුවන වී හාවී නොවේදෝ
රටින් ගෙනෙන වී මාවී නොවේදෝ
රජුට ඔබින වී දේවී නොවේදෝ

අදහස් ප්‍රකාශ කිරීමටත් යම් පණිවුඩයක් දැනුම්දීමටත් දුර ප්‍රමාණය තීරණය කිරීමටත්, ප්‍රධාන සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ගැමියා භාවිතා කළේ "හූවයි". මෙයද ජනකවියේ එක්තරා අංගයකි. දඩයම් සඳහා කැලයට වැදුනු මිනිසුන් තමන් හිඳින ඉසව්ව අනෙකාට දැන්වීමටත්, හේනකට ගිණි තියනවිට එය අන් අයට දැන ගැනීම සඳහාත් සතුන් පලවා හැරීමටත් යම් ආපදාවක්, කරදරයක් වූ විට ආරක්ෂාවක් පිහිටක් බලාපොරොත්තුවෙන් මේ හූව භාවිතා කරන ලදී. මෙය සැබැවින්ම සන්නිවේදන මාධ්‍යයක් බවට පත්වූයේ ඒ ඒ අවස්ථාවන් සඳහා විවිධාකාර වූ "හූ හඬවල්" භාවිතා කිරීමටත් ඒ හඬවල් තුළින් පැවැසෙන අරුත තේරුම් ගැනීමට ඔවුන් හුරුපුරුදුව සිටි නිසාත් ය. එහෙත්, වත්මන් සමාජය විසින් එකී හූව එක්තරා විසුළු ස්වරූපයකින් භාවිතා කරන අයුරු දක්නට ලැබේ. විශේෂයෙන්ම විවිධ ක්‍රීඩා උත්සව ප්‍රිය සම්භාෂණ යන අවස්ථාවන් ඊට නිදසුන් වේ.

සිංහල ගැමි සමාජය තුළ පැවතුන තවත් සන්නිවේදන ක්‍රමයක් වශයෙන් පන්සලේ ඝන්ඨාරය හැඬවීම හඳුන්වාදිය හැකිය. එහෙත්, අද පොහොය දිනකදීවත් ඝන්ඨාර හඬ ඇසීම දුලබය. ගැමි ජනතාව බුද්ධ පූජාව තබන වේලාවත්, පන්සලේ හිමි නමකට හෝ පන්සලට යම්කිසි සතුරු උපද්‍රවයක් හෝ වෙනයම් කරදරයක් සිදුව ඇත්නම් ඒ බැව් ගැමියන්ට දැනුම් දීමටත්, පන්සලේ ස්වාමීන් වහන්සේලාට නියමිත දානවේල නොලැබුනේ නම් ඒ බැව් දැනුම් දීමටත්, බෝධි පූජාව පැවැත්වෙන වේලාව දැනුම් දීමටත් යනාදී මෙකී නොකී කරුණු රැසක් සඳහා ගමේ පිරිසගේ දායකත්වය ලබාගැනීමේ අරමුණින් මේ ඝන්ඨාරය හැඬවීම

සිදුකරනු ලැබීය. ගැමි ජනතාව අතර පැවතුනා වූ භූව මෙන්ම මෙම ඝන්ඨාරය හැඬවීමද ඒ ඒ පණිවුඩය දැනුම්දීම සඳහා ඊටම ආවේනික නාද රටාවකට අනුව හැඬවුනි. ඊට හුරුව තිබූ ගැමි සිත් ඒ අනුව කටයුතු කිරීමට ද යුහුසුළු වුනි. නමුත්, වර්තමානයේ එලෙස හැඬවෙන ඝන්ඨාර ශබ්දයක් කලාතුරකිනිදු නොඇසේ. එමෙන්ම ඒ ඒ ශබ්දය තේරුම් ගනු තියා පන්සලක ඝන්ඨාරයක් ඇත්තේ කුමකට ද යන්න පවා තේරුම් ඇති අය ඇත්තේ අතලොස්සකි.

ඒ බැව් පසක් කරන එක් උදාහරණයක් වශයෙන් මේ සිදුවීම හඳුන්වාදිය හැකිය. එනම්, බොහෝ සැදැහැවතුන් ශ්‍රී පාදය කරුණා කළ පසු උඩමළුවේ දී ඝන්ඨාර පූජාව සිදුකිරීම එක්තරා පූජා විධියකි. සැබැවින්ම එයින් අදහස් කරනුයේ තමන් සිරිපතුල වැඳපුදාගත් වාර ගණන සිහිපත්කොට ඝන්ඨාරය හැඬවීම සිදුකිරීමය. ඒ අනුව එක් වරක් පැමිණියේ නම් එක් වරක් ද, දෙවරක් පැමිණියේ නම් දෙවරක් ද ආදී වශයෙන් එය හඬවනු ලබයි. නමුත්, අද හිතුමනාපේ තමන්ට රිසි ලෙස එය භාවිතා කරන අයුරු මෙන්ම ඇතැම්විට ක්‍රීඩාවක් බවට ද පත් වී ඇති අයුරු දැකගත හැකිය. මේ තත්ත්වයම විශාල වශයෙන් සැදැහැවතුන් එක්වන වෙසක්, පොසොන් වැනි විශේෂ පොහොය දිනවල දී පන්සලේ දී වුවද දැකගත හැකිය.

සැබැවින්ම අප සිංහලයන් වශයෙන් මේ තත්ත්වය පිළිබඳ කණගාටු විය යුතු වේ. මන්දයත් හින්දු භක්තිකයන් ඇතුළු සෙසු ආගමිකයන්ගේ සංස්කෘතියට ආවේනික වූ, උරුම වූ මේ ඝන්ඨාරය ඔවුන් සලකනුයේ පූජා භාණ්ඩයක් වශයෙනි. ඇතැම්විට හින්දු ආගමික චතාවත්වල දී ඝන්ඨාර ආකෘතියට නිමැවුනු කුඩා සීනු විශේෂයක් හඬවා දෙවි දේවතාවුන්ට පුද පූජා පවත්වනු දැකගත හැකිය. කොටසකගේ පුද පූජාවටත් තව කොටසකගේ විනෝදයටත් පාත්‍ර වී ඇති මේ සංස්කෘතිකාංගය එකී තත්වයන්ට පත්වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ වෙසෙසින්ම වැඩිහිටියන්ගේ ඇසුර තරුණ කොටස්වලට නොලැබීම නොවේද? හරි වැරදි වැටහාදීමට සැබැවින්ම වැඩිහිටි මඟ පෙන්වීම අත්‍යවශ්‍ය බව මේ තුළින් මනාව පිළිබිඹු වේ. අපේ ජනකවිය තුළ පවත්නා තවත් අංගයක් නම් ප්‍රස්ථා පිරුලය. එදිනෙදා පිවිතයේ දී ස්වකීය අදහස් හා සිතුම් පැතුම් ප්‍රකාශ කිරීම සඳහා සිංහල ගැමියෝ ගැඹුරු භාෂා යෙදුම් යොදා නොගත්තහ. එහෙත්, ගැඹුරු අදහසක් කියා පෑමටත්, වඩාත් ව්‍යක්ත ලෙස සිය අදහස් ප්‍රකාශ කිරීමටත්, ඔවුන් යොදාගත් තියුණු අවියක් වූයේ ප්‍රස්ථා පිරුළය. ප්‍රකාශන ශක්තියෙන් පරිපෝෂිත භාෂා ප්‍රයෝගයක්ම වූ මේ පිරුළු චිරන්තන සම්ප්‍රදායකට උරුමකම් කියති.

රසවත් ලෙස අවස්ථානුකූලව විධිමත් සංක්ෂිප්ත භාවයකින් යුතුව ඉලක්කයට යම් අදහසක් ප්‍රකාශ කරන්නට තරම් මේ පිරුළු සමත් විය. එමෙන්ම, ඒවා විවිධ ප්‍රදේශවලට ද සීමා වී තිබේ.

"තොටගමුවේ ඉපදිලත් බණ බැරි වුනා සේ"
"මඩකලපු ගිහිල්ලත් සරමක් නොගෙනාවා සේ"

ආදී වශයෙනි. එමෙන්ම, ඇදහිලි ක්‍රම අනාවරණය කරන පිරුළු අතර "පෝයට වාරකන් දවස අරින්නා සේ", "පින්වන්තයා යන යන තැන මල් වැහිලා" ආදී වශයෙන් ගෙතුණු පිරුළු වේ. ගැමි වහරේ එන සිත් ඇදගන්නා සුළු පිරුළු රාශියක්ම වේ. ඒවා අතර,

"කොහොඹ ගහේ බැන්දත් මීය මිහිරිය"
"පණ්ඩිතයාට ඒදණ්ඩ මැදින් යන්නට බැරි සේ"
"හොරාගෙ අම්මාගෙන් පේන අහන්නා සේ"
"වඳින්න ගිය දේවාලේ හිසේ කඩන් වැටුනා වගේ"

යනා දී කියුම්. එදා මෙන්ම අදත් භාවිතයට ගැනේ. සිංහල ගැමියාගේ ජීවනෝපාය වූ ගොවිතැන මුල්කරගෙන ද රසවත් පිරුළු රාශියක් ගොඩනැඟී ඇත. ඒවා අතර,

"තමන්ගේ වක්කඩ කඩද්දී බලාහිටි මිනිහා කාගේවත් කක්කුටු හිල් වහයි ද"

"තණකොල කපන්නට කිතුලට ගිය මිනිහාටත් උත්තර තිබුණා වගේ"

ආදී පිරුළු අදත් විචාරක පැසසුමට ලක්වේ. මේ පිරුළු තුළින් බලාපොරොත්තු වූයේ මිනිස් වර්ගයා සතු අනුවනකම්, දුර්වලතා, කපටිකම් උපහාසයෙන් යුතුව කියා පෑමයි.

එහෙත්, අද ව්‍යවහාර භාෂාවේ කෙසේ වෙතත් ලේඛන භාෂාවේදීවත් මේ පිරුළු දැකගත නොහැකිය. එදවස ගැමි ජනතාව නිතර දෙවේලේ කටපුරා කියූ මේ පිරුළු වෙනුවට අද ඇත්තේ කිසිදු තේරුමක් නැති (අණ්ඩර දෙමළ) වචන වට්ටෝරු ගණනකි. නිදසුනක් වශයෙන් නිරන්තර සවණට යොමුවන නෝන්ගී, චමිලා, චමින්ද, රැ ද දවල් ද, එළ, ආසයි නේ ආදී වශයෙන් භාවිතා වන වචන හඳුන්වාදිය හැකිය. මේ තුළින් දිස්වනුයේ සැබවින්ම සමාජය පිරිහී ඇති බවක් නොවේ ද ?

පාසලේදීවත් දරුවන්ට ප්‍රස්ථා පිරුළු පිළිබඳ නියමිත වැටහීමක්, අවබෝධයක් ලබානොදේ. පිරුළු දන්නා වැඩිහිටියන් සිටිය ද, ඒවා ව්‍යවහාරයට නොගැනීම හේතු කොටගෙන භාවිතයෙන් දුරස්ව තිබේ. ජනකවි යටතේ හමුවන මේ පිරුළු තුළින් ඉගෙන ගන්නට ඇතිදේ ඉමහත් ය. එමෙන්ම, ඒවා කාලාත්‍රයටම පොදුය. එහෙත්, සියල්ල තාක්ෂණික දියුණුව නම් වූ රකුසා විසින් ගිලගනිමින් පවතී. ජනකවිය තුළ තේරුම්ගත නොහැකි ප්‍රහේලිකා නැත. එය සරළය. සංගීතමය මෙන්ම කාව්‍යමය ගුණයෙන් ද පෝෂිතය. රස නිර්මාණය කෙසේ වුවද, වෘත්තීමය අරමුණු ඔස්සේ බිහිවුණු ජනකවිය එතරම් විශාල වපසරියක් වෙත නොගොස් සරල උපමා භාවිත කළ නිසාත්, බසෙහි සැකැස්ම නිසාත් ජනකවිය අද සංගීතවේදීන්ගේ කයෝර සංගීතමය උගුලට ගොදුරු වී ඇත. නිදසුනක් වශයෙන් ගුවන් විදුලියේ ඇසෙන මේ ගීතය හඳුන්වාදිය හැකිය.

"රංපොට තෙලඹුව මැණිකෙට වරම් ලැබෙන දා"
"අරංගලේ දී මැණිකෙට වරම ලැබුණ දා"

මෙය ජනකවි වහරේ දී අපට හමුවන්නේ ප්‍රේමයෙන් ප්‍රමුදිතන හදවතක උපන් සිතුවිල්ලක් පුද්ගලානුභූති

අත්දැකීමකට පත්ව ඇති අයුරුයි. එමෙන්ම, ඒ තුළ පවත්නා වූ සංයමය නොබිඳෙන අයුරින් ගායනා කිරීමට ද ඔවුහු වගබලා ගත්හ. එහෙත්, මේ සියල්ල ගීතයට පරිවර්තනය වීමත් සමගම ඒ ගුණාංගයන් ගිලිහී තිබෙන අයුරු ගයන විලාසයෙන්ම දැකගත හැකිය.

ගම නමැති සංකල්පය රට හැදීම දක්වා ව්‍යාප්තව ඇති බැවින් ගම නාගරීකරණය වී ඇත. මේ හේතුවෙන් ගමේ පැවති සෞන්දර්‍යය, සංස්කෘතික දායාද, මානුෂික ගුණාංග අන්‍යෝන්‍ය සුහදතාවය, අව්‍යාජ බව ගමෙන් සමුගෙන ඇත. ජනකවියත් ඒ හා මුසුවූ සෙසු අංගත් ඇතැම් පිටිසර ගම් පියැසි තුළ තාමත් පැවතෙනුයේ එහි වෙසෙන පැරැන්නන් නිසාම විය යුතුය. ඔවුන්ගේ අභාවයත් සමඟ අපේ හෙළ සංස්කෘතික දායාදයන් ද, උරුමයන් ද වියපත් වනු නිසැකය.

ලිඛිත කාව්‍යයන් බිහිවන්නටත් පෙර උපත ලද මේ ජනකවි පරපුරෙන් පරපුරට උරුමකර දියයුතු නොවේද ? මේවාට ආවේනික වූ යම් දේශයක් වී නම් ඒ අපේ සිංහල දේශයම නොවේ ද ? පාසල් විෂය ක්ෂේත්‍රය තුළට සාහිත්‍ය නම් විෂයක් එක්කර ඇතත්, ඊට මුහුව පවතින්නේ ජාතක කථාවක්, කවි පංතියක් ගත් කතුවරයකුගේ නවකථාවක හෝ කෙටි කථාවක කොටසක්, නාට්‍යයක කොටසක් යනාදි වශයෙන් වූ ඉතාම සරළ විෂය මාලාවක් පමණි. නමුත්, සිංහළ සාහිත්‍ය වූ කලී "මහා සාගරය" මෙනැයි පුරාණ ජන වහරේ එන කියමනක් ද වේ. ඉන් දෝතක් හෝ රටේ ජීවනාලිය බඳු තරුණ පුරපුරට දායාද කළයුතු නොවන්නේ ද. එසේ නොවුනහොත් මතු පරපුර සැබැවින්ම චන්ද්‍රිකා යුගයක ජීවත්වන රොබෝවරු වනු නියතය.

ජනකවිය යනු කුමක්දැයි නිර්වනය කරන්නට තරම් පොහොසත් වූවන් ඇත්තේ ඉතාමත් අල්ප වශයෙනි. එයද පතපොතින් උකහාගත් දැණුම තුළින් පමණි. ඔවුන්ගේ ප්‍රායෝගික දැණුම ඉතාම පහත් තලයක ඇත. එමෙන්ම විවිධ තරගවල දී උත්සවවල දී ජනකවි හඬනගා කියන, ඉන් ජයග්‍රහණය ලබන අය ද වෙති. එහෙත්, මෙහි ආරම්භය පැවැත්ම ගැන ඔවුන්ගේ දැනුමක් නැති තරම්ය. කණගාටු විය යුත්තේ මේ තත්ත්වයට පත් වූ ආචාර්ය මහාචාර්යවරු ද දුසිම් ගණන් ඇති බැවිනි.

සැබවින්ම සාහිත්‍ය රුචියට, එය ඇගයුමට මනස හුරු කර විය යුත්තේ කලා  රසඥතාව ඇතිකර ලිය යුත්තේ කුඩා අවධියේ දීමය. එහෙයින් සාහිත්‍ය විෂය ඉගැන්වීම කළ යුත්තේ පළමුවන ශ්‍රේණිය ආරම්භයේ දීමය.

සාහිත්‍ය කලාව පරිශීලනයෙන් භෞතික වශයෙන් ලැබෙන ප්‍රයෝජනයක් නම් නොවේ. ලැබෙනුයේ අධ්‍යාත්මික සංවර්ධනයක් හා නිරාමිස රසාස්වාදයක් විඳින්නට මනැස කීකරුවීමක් පමණි. වර්තමානයේ අපේ පැවැත්ම නිර්මාණය වී ඇත්තේ භාහිර සමාජයට අවැසි පරිදිය. එහෙත්, මෙහිදී සනිටුහන් කළයුතු වැදගත් දෙයක් වේ. එනම්, ඕනෑම ගෝත්‍රයකට හෝ ජාතියකට ඔවුන්හට උරුම වූ ජනකවි සම්ප්‍රදායක් එම ගෝත්‍රයේ හෝ ජාතියේ ප්‍රභවයත් සමගම බිහිවේ. එය එම ජාතියේ හෝ ගෝත්‍රයේ අනන්‍යතාවය පිළිබිඹු කරන්නක් ද වන බව අප වටහා ගතයුතු බවයි. එකී කරුණ ඔස්සේ සිතන කළ ජාතියක අනන්‍යතාවය රඳා පවතිනුයේ පුනර්ජීවනයත් සමඟ සම්ප්‍රදායික ලක්ෂණ සුරැකී තිබෙනතුරු බව අප සිහියේ තබාගත යුතු වෙමු.

*වරුණි කෝකිලා ද සිල්වා විසින් රචිත "අස්වැන්න" කෘතියෙනි.*

# "රණවිරු ඇපරල් මාවත" විවෘත කෙරේ






නෙලුන්දෙණිය අලව්ව ප්‍රධාන මාර්ගයේ සිට රණවිරු ඇපරල් අලව්ව කර්මාන්තශාලාව වෙත ඇති පිවිසුම් මාර්ගය නැවත පිළිසකර කොට "රණවිරු ඇපරල් මාවත" ලෙස නම් කර ඉකුත් ජූලි මස 12 වන දින එහි සේනාවිධායක බ්‍රිගේඩියර් එම්ජීඑන්බී මහතුවක්කාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ සුරතින් විවෘත කෙරිණ.

සේනාවිධායක ගේ මගපෙන්වීම යටතේ අලව්ව කර්මාන්තශාලා කළමනාකරු කර්නල් පීඩබ්ලිව්එස්පීබී ගලගම ආර්එස්පී ගේ අධීක්ෂණයෙන් හා එහි සියලු නිලයන්ගේ සහයෝගයෙන් මෙම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදුවිය. මෙම අවස්ථාවට එම ආයතනයේ නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් ඒසීජේ වාසගේ, රණවිරු ඇපරල් යක්කල හා අලව්ව කර්මාන්ත ශාලාවන්හි නිලධාරීන්, සෙසුනිලයින් රැසක් ද සහභාගී වූහ.



# සවි නොසිඳි විරුවකුගේ අත් නොහළ මෙහෙවර




■ ලුතිනන් දුමින්ද සෙනරත්

2 ශ්‍රීලංකාපාබලසේනා - මාධ්‍යවේදී

ජනමාධ්‍ය හා සිවිල් අංශ

යුද්ධ හමුදා මූලස්ථානය


ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ රණසේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ වත්මන් අධ්‍යක්ෂකවරයා වන බ්‍රිගේඩියර් ඩබ්ලිව්ජේඑස්ආර් විජේදාස ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වසර 34 ක දීර්ඝ සේවා කාලයක් සපිරූ රණකාමී නිලධාරියෙකි. තෝලංගමුව ඩඩ්ලි සේනානායක මධ්‍ය මහා විද්‍යාලයේ දීප්තිමත් ආදි සිසුවකු වන හෙතෙම 1990 වසරේදී නිත්‍ය පාඨමාලා අංක 33 යටතේ යුද්ධ හමුදාවට එක්ව අධිකාරි ලැබ අද වනවිට යුද්ධ හමුදාවේ විවිධ මට්ටමේ තනතුරු රැසක් දරා ඇති අත්දැකීම් සපිරි දක්ෂ නිලධාරියෙකි.




මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී සිය හමුදා දිවිය තුළ මෙරට මෙන්ම විදේශ පුහුණුවීම් සහ සංචාර රැසකට ද සහභාගි වී අත්දැකීම් සම්භාරයක් ලබා ඇති අයෙකි. තවද, පාකිස්ථානයේ තරුණ නිලධාරී පාඨමාලාව, ඉන්දියාවේ උපදේශක සහ සටන් කණ්ඩායම් අණදෙන පාඨමාලාව ද සාර්ථකව හදාරා ඇති ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි දෙකක් සහ ස්විට්සර්ලන්තයේ ජිනීවා විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර හා යුරෝපීය ආරක්ෂාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද හිමිකර ගෙන ඇත. එසේම, ඔහු ස්විට්සර්ලන්තයේ ජිනීවා හි ආරක්ෂක ප්‍රතිපත්ති සඳහා වූ ජිනීවා මධ්‍යස්ථානයෙන් නායකත්ව ජාත්‍යන්තර ආරක්ෂක පාඨමාලාව ද හදාරා ඇත. මෙයට අමතරව "මිහිදන් නොවූ මිනිසා" සහ "Be an Officer and Gentleman" යන පොත් 02 ක්ද ඔහු විසින් පළකර ඇත. විශේෂයෙන්ම කුරිරු ත්‍රස්තවාදීන්ට එරෙහිව සිදුකරන ලද නිර්භීත ක්‍රියා වෙනුවෙන් "වීර වික්‍රම විභූෂණ", "රණ ශූර" සහ "දේශපුත්‍ර" පදක්කම්වලින්ද පිදුම්

> "දෙවන ටැංකිය ආර්පීජී (RPG) ප්‍රහාරයකට ගොදුරු වූ විට, අපගේ සටන් කාර්යක්ෂමතාව සැලකිය යුතු මට්ටමකින් අඩුවුණා. දුෂ්කරතා මධ්‍යයේ වුවද, අපි අපගේ සීමිත සම්පත් එක්රැස් කර සතුරාගේ ප්‍රහාරවලට නොබියව මුහුණ දුන්නා. පවතින ගැටුම මධ්‍යයේ තවත් ඛේදවාචකයක් සිදු වූයේ මට එල්ලවූ ආර්පීජී ප්‍රහාරයකින් මගේ වම් අත වැලමිටට ඉහළින්ම අහිමිවීමයි."

ලබා ඇති ඔහු සිය නොකැළැල් යුද්ධ හමුදා සේවාව වෙනුවෙන් "උත්තම සේවා පදක්කම" ද හිමිකරගෙන ඇත. මෙවර "රණවිරුවා" හි සාකච්ඡා සටහන ඔහු සමඟය.

**ප්‍රශ්නය :-** ඔබ දෙවැනි පරම්පරාවේ යුද හමුදා නිලධාරියෙක්, තවත් විදිහකින් කියනවා නම්, ඔබේ පියාත් හමුදා නිලධාරියෙක්. ඔබේ ජීවන වෘත්තීය තෝරා ගැනීමට පෙළඹුනේ පියාගෙන් ලද එම ආභාෂය නිසාද?

**පිළිතුර :-** ඇත්තෙන්ම ඔව්. මගේ පියා අන් කිසිවකුත් නොව ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකායේ සාමාජිකයකු වූ කපිතාන් ඩබ්ලිව් ඒ විජේදාස මහතාය. මාගේ පියා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙනුවෙන් සිදුකරන ලද සේවාව නිසාම කුඩා කල සිටම මා යුද්ධ හමුදා නිලධාරියකු වීමට ප්‍රබල සාධකයක් උනා.

මගේ සහෝදර සහෝදරියන් සහ මා සමඟ අපේ පියා නිරන්තරයෙන් පවසන ලද හමුදා සේවයේ රසමුසු කතා සහ අත්දැකීම්වලට මා වඩාත් ආකර්ෂණය උනා. එමෙන්ම, අපේ පාසල් නිවාඩුව හමුදා කඳවුරුවල ඉතා උද්යෝගිමත් අයුරින් ගතකළා. ඒ වගේම මගේ පියාගේ මිතුරන්ගේ මඟපෙන්වීම යටතේ අපගේ කුසලතා ඔප් නංවා ගැනීමට හමුදා සේවය තුළින් මිලකළ නොහැකි ඉඩ ප්‍රස්ථාවන් ලැබෙන බව මා වටහාගත් නිසාවෙන් මාගේ පියාගේ අඩිපාරේ ගමන් කිරීමටත්, ත්‍රිවිධ හමුදාවේ නිලධාරියකු වීම සහ අපගේ ආදරණීය මාතෘ භූමියට මුළු හදවතින්ම සේවය කිරීමට ලැබෙන අවස්ථාවක් බවද මට වැටහී ගියා. ඒ අනුව දැඩි අධිෂ්ඨානය සහ නොපසුබට උත්සාහය තුළින් මම මෙම අභිලාෂය සාක්ෂාත් කරගැනීම සඳහා ගත් උත්සාහය මල්ඵල ගන්වමින් හමුදා නිලධාරියකු වීමේ මාගේ ඉලක්කය සපුරා ගැනීමටත් හැකිවුණා.

**ප්‍රශ්නය :-** ශ්‍රී ලංකාවේ පැවැති යුද්ධය තුළ ඔබ යුද ටැංකියකට අණ දෙන අවස්ථාවේදී අනපේක්ෂිත අයුරින් බරපතළ තුවාල ලැබුවා. ඔබට ඒ මොහොත සිහිපත් කළ හැකිද?

**පිළිතුර :-** මම යුද බිමේ සේවය කරන අතරතුර යුද ටැංකි සමඟ ක්‍රියා කිරීමේදී අවස්ථා තුනකදී තුවාල ලැබුවා. පළමු අවස්ථාව 1992 "බලවේගය" මෙහෙයුමේදී මට ත්‍රස්තවාදී ආර්පීජී (RPG) ප්‍රහාරයක් එල්ලවුවා. මෙම ප්‍රහාරය තුළින් මගේ දත් දහයක් අහිමි උනා. ඒ වගේම "සත්ජය" මෙහෙයුමේදී ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මගේ වම් අතට තුවාල සිදුවුනා. කෙසේ වෙතත්, වඩාත්ම බරපතල ප්‍රහාරයක් සිදුවූයේ 1997 "ජය සිකුරු" මෙහෙයුමේදීය.

"ජය සිකුරු" මෙහෙයුම යාපනයට ප්‍රධාන සැපයුම් මාර්ගයක් ස්ථාපිත කිරීම අරමුණු කරගෙන වෙන් වෙන් අක්ෂ ඔස්සේ කොට්ඨාශ දෙකක සම්බන්ධීකරණ ඉදිරි ගමනක් ඇතුළත් වුනා. එහි ප්‍රාථමික පෙරමුණේ ස්ථානගත කර තිබූ ටී-55 ප්‍රධාන යුද ටැංකි බලසෙණියක අණදීම මා සිදුකළා. අපට පැවරුණු කාර්යය වූයේ පුලියන්කුලම නමින් හැඳින්වෙන ප්‍රදේශය සම්බන්ධ කර ගැනීමයි. ඉදිරි මෙහෙයුම සඳහා සූදානම් සහතික කිරීම සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිවලට අනුගත වෙමින් පෙරහුරු සහ ඔත්තු බැලීම ඇතුළු දැඩි සූදානමකින් සිටීමටත් අපට සිදුවුණා.

තීරණාත්මක දිනයේදී, මම මගේ යුද ටැංකි දොළහකින් යුත් බලගණය රැස්කර අපට ටැංකි එකොළහක් අහිමි වුවත්, අවසාන යුද ටැංකියෙන් හෝ අපේ ඉලක්කය කරා ළඟා විය යුතු බව මගේ භටපිරිසට දැනුම් දුන්නා. අපි සතුරාගේ ස්ථානයට ළඟා වන විට, එම යුද ටැංකිය ටැංකි නාශක බෝම්බයකට හසුවී කැබලිවලට කැඩීගොස් විනාශ වුණා. ක්ෂණික තීරණයක් ගත් මම, නායකයා ලෙස, මෙහෙයුම අත්හැරීමට වඩා ඉදිරියට යාමට තීරණය කළා. සටන දිගටම පැවති අතර, වේගවත් හා ගණනය කළ උපමාරු හරහා අපි සාර්ථකව සතුරු භූමියට රිංගා ගැනීමට සමත්වුණා.

දෙවන යුද ටැංකිය ආර්පීජී (RPG) ප්‍රහාරයකට ගොදුරු වූ විට, අපගේ සටන් කාර්යක්ෂමතාව සැලකිය



යුතු මට්ටමකින් අඩුවුණා. දුෂ්කරතා මධ්‍යයේ වුවද, අපි අපගේ සීමිත සම්පත් එක්රැස් කර සතුරාගේ ප්‍රහාරවලට නොබියව මුහුණ දුන්නා. පවතින ගැටුම මධ්‍යයේ සිදුවූ ඛේදවාචකය නම් මට එල්ලවූ ආර්පීජී ප්‍රහාරයකින් මගේ වම් අත වැලමිටට ඉහළින්ම අහිමිවීමයි. මෙම දරුණු තුවාලය යුද බිමෙන් මා ඉවත් කිරීමටත් ඉතිරි බලසෙණිය ආරක්ෂිත කලාපයකට හරවා යැවීමටත් හේතුවක් වුනා. ඉක්මනින්ම වෛද්‍ය ප්‍රතිකාර මා වෙත ලබාදුන් අතර, අත්‍යාවශ්‍ය ප්‍රතිකාර සඳහා මාව ඉක්මනින්ම වෙනත් ස්ථානයක් කරා රැගෙන යනු ලැබුවා.

**ප්‍රශ්නය :-** පාබල හමුදාවන් ඇතුළත් යුද චිත්‍රපට සිය ගණනක් නිෂ්පාදනය කර ඇතත්, ටැංකි ඇතුළත් චිත්‍රපට නිර්මාණය වී ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයකි. උදාහරණයක් ලෙස, 2014 දී නිකුත් වූ "Fury" නම් ඉංග්‍රීසි චිත්‍රපටය යුද ටැංකි අණදෙන නිලධාරියකුගේ ඉදිරි දැක්ම හා යුද්ධය ගැන සැබවින්ම අවධානය යොමුකළ හොඳම සහ විශිෂ්ට



ගණයේ චිත්‍රපටවලින් එකක් ලෙස අවිවාදිතයි. කෙසේ වෙතත්, යුද ටැංකි අණදෙන නිලධාරියකු ලෙස යුද බිමේ ඔබ ලැබූ අතීත අත්දැකීම් අනුව, චිත්‍රපට නිෂ්පාදකයකුට එයින් විශිෂ්ට සිනමා නිර්මාණයක් කිරීමට හොඳ අවස්ථාවක් සහ හැකියාවක් තිබෙන බව මට පැහැදිලිව පෙනෙනවා. ඉතින්, යම් නිෂ්පාදකයකු හෝ චිත්‍රපට අධ්‍යක්ෂකවරයෙක් එවැනි අදහසක් ගෙන එන්නේ නම්, ඔහුගේ සිහිනය සාර්ථක කර ගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් එම නිර්මාණකරුවාට ලබාදිය හැකි පහසුකම් මොනවාද?

**පිළිතුර** :- නියත වශයෙන්ම, ටැංකි ඇතුළත් තවත් යුද චිත්‍රපට නිර්මාණය කිරීමේ අදහස සැබවින්ම කුතුහලය දනවන අතර සිත් ඇදගන්නා සුළු කථා පුවතක් ප්‍රේක්ෂකයා හමුවේ තැබීමේ හැකියාවක් එය සතුයි. "Fury" වැනි සාර්ථක චිත්‍රපටවලින් ආභාෂය ලබාගැනීම අපූරු ආරම්භක ලක්ෂණයකි. යුද ටැංකි අණදෙන නිලධාරියකු ලෙස මට පෞද්ගලික අත්දැකීම් ඇති අතර, ග්‍රහණය කර ගන්නා සහ අව්‍යාජ යුද ටැංකි කේන්ද්‍ර කරගත් යුද චිත්‍රපටයක් නිර්මාණය කිරීමට අපේක්ෂා කරන චිත්‍රපට නිෂ්පාදකයෙකුට හෝ අධ්‍යක්ෂකවරයකුට ශ්‍රී ලංකා හමුදාවට සහාය විය හැකි ක්‍රම කිහිපයක් මට නිසැකවම යෝජනා කළ හැකිය.

**ප්‍රවීණත්වයට ප්‍රවේශය:** යුද ටැංකි සම්බන්ධ උපක්‍රම, උපාය මාර්ග සහ මෙහෙයුම් පිළිබඳ අවබෝධයක් ලබා දිය හැකි පළපුරුදු යුද ටැංකි අණදෙන නිලධාරීන්ට සහ හමුදා උපදේශකයන්ට ශ්‍රී ලංකා යුද හමුදාවට ප්‍රවේශය ලබා දිය හැකිය. මෙම ප්‍රවීණත්වයට ටැංකි යුද්ධයේ චිත්‍රපටයේ සත්‍යතාව සැලකිය යුතු ලෙස වැඩි කළ හැකිය.

**ඓතිහාසික පර්යේෂණ:** යුද ටැංකි සම්බන්ධ ඓතිහාසික සිදුවීම් හෝ සටන් පිළිබඳ පර්යේෂණ සඳහා සම්පත් සහ මාර්ගෝපදේශ ලබා දිය හැකිය. මෙය චිත්‍රපට නිෂ්පාදකයින්ට සිත් ඇදගන්නාසුළු පමණක් නොව සැබෑ ලෝකයේ සිදුවීම්වල මුල් බැසගත් කථා වස්තුවක් නිර්මාණය කිරීමට උපකාරී වේ.

**ස්ථාන සහ පහසුකම්:** යුද කාලීන භූ දර්ශන අනුකරණය කරන පුහුණු භූමි හෝ පුලියන්කුලම් වැනි ප්‍රදේශ වැනි සුදුසු රූගත කිරීම් ස්ථාන වෙත ප්‍රවේශ වීමට හමුදාවට පහසුකම් සැලසිය



හැක. මීට අමතරව, ටැංකි ආශ්‍රිත දර්ශන වේදිකාගත කිරීම සහ රූගත කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයිය හැකිය.

**ප්‍රශ්නය** :- යුද්ධයේ ප්‍රවීණයකු සහ දක්ෂ නිලධාරියකු ලෙස, කනිෂ්ඨ නිලධාරීන්ට ඔවුන්ගේ හමුදා ජීවිතය වැඩිදියුණු කරගැනීමට ඔබ යෝජනා කරන්නේ කුමක්ද?

**පිළිතුර** :- නියත වශයෙන්ම, ඔවුන්ගේ හමුදා වෘත්තීන් වැඩිදියුණු කිරීමට සහ දැනුම, නායකත්වය, කැපවීම, අඛණ්ඩතාව සහ පක්ෂපාතීත්වය යන වටිනාකම් මූර්තිමත් කිරීමට උනන්දු වන අපගේ කනිෂ්ඨ නිලධාරීන්ට මග පෙන්වීම ලබා දීමට හැකිවීම පිළිබඳව මම සතුටු වෙමි. ප්‍රවීණයකු සහ නිලධාරියකු ලෙස මගේ අත්දැකීම් ඇසුරෙන්, පහත සඳහන් යෝජනා ඉදිරිපත් කිරීමටද මා කැමැත්තෙමි.

**අඛණ්ඩ ඉගෙනීම:** ඉගෙනීම සහ ස්වයං-වැඩිදියුණු කිරීම සඳහා ජීවිත කාලය පුරාම කැපවීමෙන් කටයුතු කළ යුතුය. යුද්ධ හමුදා උපාය මාර්ග, තාක්ෂණික දියුණුව සහ ගෝලීය කටයුතු පිළිබඳ ඔබේ දැනුම පුළුල් කිරීමට අවස්ථා සොයන්න. ඵලදායී සේවාවක් ලබාදීම වෙනුවෙන් ඔබගේ ක්ෂේත්‍රයේ නවතම වර්ධනයන් පිළිබඳව යාවත්කාලීනව සිටිය යුතු වේ.

**වෘත්තීය සංවර්ධනය:** හමුදාව විසින් පිරිනමනු ලබන පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ පාඨමාලාවලින් ප්‍රයෝජන ගත යුතුයි. මෙම අවස්ථා ඔබට නව නිපුණතා වර්ධනය කර ගැනීමට, දැනට පවතින කුසලතාවයන් වඩාත් වර්ධනය කරගැනීමට ඉවහල් වනවා.

**උපදේශනය සහ ජාලකරණය:** පළපුරුදු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග සම්බන්ධතා ඇති කරගැනීම සහ උපදේශකත්වය ලබාගැනීම. ඔබ ඔබේ හමුදා ජීවිතයට ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ මගපෙන්වීම ඔස්සේ වඩාත් සාර්ථක අඩිතාලමක් දමාගත හැකි වෙනවා.






දියතලාව යුද්ධ හමුදා විද්‍යාපීඨයේදී එහි සේනාවිධායකගේ ප්‍රධානත්වයෙන් කෙඩෙට් නිලධාරීන් සඳහා පැවති දේශනය.

# රණවිරු අභිප්‍රේරණය වෙනුවෙන් දේශන මාලාවක්

**පවතින ආර්ථික, සමාජීය, දේශපාලනික වටපිටාව හමුවේ රණවිරුවන් තුළ සිය වෘත්තීය පිළිබඳ අවධානය නොවෙනස්ව පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය සාධකයකි. එබැවින් යුද හමුදාවේ අභිමානය රැකෙන පරිදි එම කටයුතු මෙහෙයවීමටනම් රණවිරුවන් තුළ තම වෘත්තිය පිළිබඳ අභිමානයක් හා වටිනාකමක් ඇතිකළ යුතුමය. ඒ සඳහා ඉතිහාසයේ මතක හා අත්දැකීම් මතින් උකහාගත හැකි දෑ බොහෝය. එසේම, නව තාක්ෂණය හා සමාජමාධ්‍ය භාවිතය තුළින්ද ඒ වෙනුවෙන් එල්ලකළ හැකි බලපෑම අතිමහත්ය. ඉහත සියල්ල සංකලනය කොට රණවිරු අභිප්‍රේරණය වෙනුවෙන් සිදුකෙරෙන මෙම දේශන මාලාව වෙනුවෙන් අද වනවිට යුද හමුදාව තුළ ඇත්තේ ඉමහත් ඉල්ලුමක් හා ඇගයුමකි.**

යුද්ධ හමුදා ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ ජෙනරාල් ගේ උපදෙස් හා මගපෙන්වීම මත රණවිරු අභිප්‍රේරණය වෙනුවෙන් වූ දේශන මාලාවේ නවත් අදියර කිහිපයක් පසුගියදා පැවැත්විණ. ඒ යටතේ ඉකුත් අගෝස්තු මස 10 වන දින දියතලාව යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සේනාවිධායක මේජර් ජෙනරාල් යූඑල්ජේඑස් පෙරේරා ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් කෙඩෙට් නිලධාරීන්, උපදේශකයින්, කාර්ය මණ්ඩලය ඇතුළු 700 කට වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන් "යුද සාහිත්‍යය" පිළිබඳ දේශනයක් පැවැත්විණ. එසේම, ඉකුත් අගෝස්තු 16 වන දින මින්නේරියේ කාලතුවක්කු හමුදා පුහුණු පාසලේදී ද, ඉකුත් අගෝස්තු 20 වන දින සිට 23 වන දින දක්වා ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි), 21, 54, 59 වන පාබල සේනාංක, සහ බලඇණි පුහුණු පාසල - තුනුක්කායි හිදී ද දේශන පැවැත්විණ.

එහිදී, යුදබිමේ මතක හා අත්දැකීම් ඇසුරින් රණවිරුවන්ගේ ඉවසීම, දරාගැනීම, කැපකිරීම මෙන්ම 30 වසරක යුද්ධයේ සන්ධිස්ථාන පිළිබඳ නව පරපුර දැනුම්වත් කෙරෙන "යුද සාහිත්‍යය" පිළිබඳ දේශනය ජනමාධ්‍ය සහ මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් සිදුකරන ලදී. තවද, හමුදා සාමාජිකයින්ගේ සමාජමාධ්‍ය භාවිතය, ආර්ථික කලමනාකරණය, නීතිවිරෝධී ක්‍රියාවලට සම්බන්ධවීම ආදී කරුණු අලලා "පවුල, මම සහ රැකියාව" යන මැයෙන් වූ දේශනය ජනමාධ්‍ය සහ මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු මේජර් එම්එච්එම්එස් බණ්ඩාර විසින් ද සිදුකරන ලදී.




54 සහ 59 වන පාබල සේනාංකයන්හි නිලධාරීන් සෙසුනිලයන්ගේ සහභාගීත්වයෙන් පැවති දේශන.

# මාලි මෙහෙවර අවසන් කළ යුද්ධ හමුදා භට පිරිස් යළි දිවයිනට







**එක්සත්** ජාතීන්ගේ සාමසාධක රාජකාරිවල නිරතවීමට හැකිවීම රාජ්‍යයකට ජාත්‍යන්තර වශයෙන් ලැබිය හැකි ඉහළම ගෞරවයකි. ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමසාධක මෙහෙයුම්වලට සහභාගී වී සිදුකරන සුවිශේෂී කාර්යභාරය නිසාවෙන් ජාත්‍යන්තරයේ කීර්තිනාමයක් අත්පත්කර ගෙන ඇත. එමෙන්ම හමුදා සෙබළකුට එක්සත් ජාතීන්ගේ සාම හමුදාවේ සේවයේ යෙදීම අභිමානයක් මෙන්ම තම සේවා කාලය තුළ ලබාගත හැකි සුවිශේෂී වෘත්තීමය අවස්ථාවකි. ශ්‍රී ලංකාව මේ වනවිට සාමසාධක රාජකාරීන්හි අභිමානවත් ලෙසත් මහත් ගෞරවයක් ලබමින් රටට කීර්තියක් ලෙස ජාත්‍යන්තරයේ සේවයේ යෙදෙමින් සිටී.

ශ්‍රී ලංකා හමුදාව ත්‍රස්තවාදය පරාජය කිරීමේදී ලබාගත් පන්නරය එක්සත්



▪ ලුතිනන්
දිලංක
ගුණතිලක
මාධ්‍යවේදී
ජනමාධ්‍ය හා මිවීමේ අම

ජාතීන්ගේ සාමසාධක රාජකාරී ඉටුකිරීමේදී උපයෝගී කරගනිමින් සිටී. එහිදී යුද්ධ හමුදාව පමණක් එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී ආරම්භ කළ දින සිට මේ දක්වා හයිටි, ලෙබනන්, බටහිර සහරා, දකුණු සුඩානය, චැඩ් ජනරජය සහ මාලි රාජ්‍යය වෙත නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල ප්‍රමාණයක් එම රාජකාරී සඳහා යොදවා ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමසාධක රාජකාරී බලතල යටතේ ඇති හයවන සහ හත්වන පරිච්ඡේදයට අනුව මෙලෙස ශ්‍රී ලාංකීය භටපිරිස් එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා යෙදවෙයි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සන්නාහ සන්නද්ධ බලකාය, කාලතුවක්කු

රෙජිමේන්තුව, ඉංජිනේරු බලකාය, සංඥා බලකාය, පාබල හමුදාව, සිංහ රෙජිමේන්තුව, ගැමුණු හේවා බලකාය, ගජබා රෙජිමේන්තුව, විජයබාහු පාබල රෙජිමේන්තුව, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව, කමාන්ඩෝ රෙජිමේන්තුව, විශේෂ බලකාය, සන්නද්ධ බුද්ධි බලකාය, ඉංජිනේරු සේවා රෙජිමේන්තුව, සේවා බලකාය, වෛද්‍ය බලකාය, යුද්ධෝපකරණ බලකාය, විදුලි හා යාන්ත්‍රික ඉන්ජිනේරු බලකාය, පොලිස් හේවා බලකාය, පොදු සේවා බලකාය, කාන්තා බලකාය සහ ජාතික ආරක්ෂක බලමුළුව නියෝජනය කරමින් නිලධාරීන් සහ සෙසු නිලයින් එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරි සඳහා මේ වනවිට යොදවා ඇත.



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සාමාජිකයින් හයිටි, ලෙබනන්, දකුණු සුඩානය සහ මාලි ආශ්‍රිතව එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා සහභාගී වී රාජකාරි කරනු ලබයි. ඒ අතරින් වඩාත් අභියෝගාත්මක රාජකාරීන් සඳහා ස්ථානගත වී ඇත්තේ මාලි රාජ්‍යයේ ස්ථාපිත සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායමයි. දකුණු සුඩානයේ බෝර් හි ස්ථාපිත දෙවන මට්ටමේ රෝහල, මූලස්ථාන ආරක්ෂක භට කණ්ඩායම - ලෙබනන් සහ බටහිර සහරාහි එක්සත් ජාතීන්ගේ හමුදා නිරීක්ෂණ නිලධාරිනියක් ද රාජකාරි සිදුකරනු ලබයි.

මාලි රාජ්‍යයේ බහුවිධ ඒකාබද්ධ ස්ථායීතාවය ඇති කිරීමේ මෙහෙයුම් මූලස්ථානය යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සංග්‍රාමික ප්‍රවාහන රථ රාජකාරි සඳහා යොදවා තිබූ අතර, එකවර ප්‍රවාහන රථ ඛණ්ඩ දෙකකට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ආරක්ෂාව සපයන ලදී. එහිදී, ඔවුන්ට එම ප්‍රවාහන රථ ඛණ්ඩ හැසිරවීම, ආරක්ෂාව සැපයීම ආදී සියලුව වගකීම් ඉටු කරමින් එක්වරකට කිලෝමීටර් 1000 ක පමණ දුරක් ගමන් කිරීමට සිදුවේ. විවිධ වූ කැරලිකාර කණ්ඩායම් සිදුකරනු ලබන වැඩිදියුණු කරන ලද ස්වංක්‍රීය බෝම්බ සහ පීඩන බෝම්බවල බලපෑම්වලින් ප්‍රවාහන රථ ඛණ්ඩය ආරක්ෂා කරගනිමින් ගමනාන්තය දක්වා ළඟාවීම අතිශයින්ම අභියෝගාත්මකය. මේ අභියෝගයන්ට මුහුණ දෙමින් ඉටුකළ මෙහෙවර වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව MINUSMA SECTOR EAST FOR EXCELLENT පදක්කමෙන් පවා පිදුම් ලැබීය. ඔවුන් ශ්‍රී ලංකාවට උපයාදුන් විදෙස් විනිමය ප්‍රමාණය රුපියල් මිලියන 14524කට අධිකය.

කිඩාල්, ඇග්ලෝහොක් සහ ටෙසාලිට් යන කලාපවල පිහිටා ඇති මාලි රාජ්‍යයේ බහුවිධ ඒකාබද්ධ ස්ථායීතාවය ඇති කිරීමේ මෙහෙයුම් මූලස්ථාන (MINUSMA) කඳවුරුවල සංග්‍රාමික ආරක්ෂක රථ මෙහෙයුම් සිදුකරන එකම විදේශීය සාමසාධක හමුදාව ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංග්‍රාමික රථ ආරක්ෂක භට ඛණ්ඩය විශිෂ්ට කැපවීමකින් සහ මනා වෘත්තීයභාවයෙන් යුතුව තම රාජකාරිය ඉටුකරමින් ජීවිත අවදානම් මධ්‍යයේ වුවද භටකාර්ය සම්පාදන ප්‍රවාහන රථ සඳහා ආරක්ෂාව සැපයීමේ කටයුතුවල නිරතව සිටියහ.

මේ සියලු ඇගයීම් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ලබද්දී මාලි රාජ්‍යයේ සාමසාධක මෙහෙයුම් අතරතුරදී ශ්‍රී ලංකා පාබල හමුදාවේ කපිතාන් එච්ඩබ්ඩී ජයවික්‍රම, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ කෝප්‍රල් විජේකුමාර එස්එස් කැරලිකරුවන් විසින් ශ්‍රී ලංකා සංග්‍රාමික රථ ඛණ්ඩය ඉලක්ක කරමින් වැඩිදියුණු කළ පුපුරණ ද්‍රව්‍යය අටවා පුපුරුවා හැරීම නිසාවෙන් සිය ජීවිතය පුදකළහ. එසේම, යුද්ධ හමුදා නිලධාරීන් පස්දෙනකු සහ සෙසු නිලයින් 29 දෙනකු මාලි රාජ්‍යයේ දී තුවාල ලැබූහ.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මාලි රාජ්‍යයේ සාම සාධක මෙහෙයුම් අවසන් කිරීමත් සමඟ සාම සාධක රාජකාරි සඳහා මාලි රාජ්‍යයට යොදවා සිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා භට පිරිස් යළි මෙරටට ගෙන්වා ගැනීම සිදුවිය. එලෙස, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන් සහ සෙසුනිලයින් 1099ක් සහ මාණ්ඩලික නිලධාරීන් 14ක ප්‍රමාණයක් මාලි රාජ්‍යයේ සාමසාධක රාජකාරි සඳහා යොදවා තිබුණි.

මෙහි සුවිශේෂී කාරණය වන්නේ මාලි රාජ්‍යයේ එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් අවසන් කරන තෙක්ම රැඳී සිටි එකම විදේශීය හමුදාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව පමණක්ම වීමයි. ඒ අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පැවරී තිබූ සංග්‍රාමික ප්‍රවාහන රථ රාජකාරි අවසන් වූ පසුව මාලි රාජ්‍යයේ බහුවිධ ඒකාබද්ධ ස්ථායීතාවය ඇති කිරීමේ මෙහෙයුම් මූලස්ථානයේ ආරක්ෂාව වෙනුවෙන් අවසන් මොහොත දක්වාම රාජකාරි ඉටුකරනු ලැබුවේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවයි.

තිස්වසරක් පුරා පැතිරුණු කුරිරු යුද්ධය මානුෂීය ස්වරූපයකින් නිමාකරමින් ලොව විශාලතම ප්‍රාණ ඇපකරුවන් මුදාගැනීමේ මෙහෙයුම සිදුකළ ශ්‍රී ලංකාව මේ ඉටුකරමින් සිටින්නේ අන්තර්ජාතික සබඳතා පවත්වාගෙන යාම වෙනුවෙන් පැවරී ඇති භාරදූර වගකීමකි. එහිදී, ශ්‍රී ලංකාවේ හමුදාවන් ලොව මානුෂීයම හමුදාවන් වශයෙන් තමන් ලද විරුදාවලිය ඒලෙසින්ම ආරක්ෂා කරගනිමින් විදේශයකදී වුවද තම රණකාමීත්වය ප්‍රදර්ශනය කරමින් ජාත්‍යන්තර සාමය ස්ථාපනය කිරීම වෙනුවෙන් සිදුකරනු ලබන මෙහෙවර අගය කළ යුතුමය.



විද්‍යාපීඨය (ඇකඩමිය) යනුවෙන් සාමාන්‍ය ව්‍යවහාරයේ ප්‍රචලිත ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය යනු රටේ ස්වෛරීභාවය අරක්ෂා කිරීමට කැපවෙන යුද්ධ හමුදාවේ සියලු නිලධාරීන්ගේ ජන්ම භූමියයි. විද්‍යාපීඨය පිහිටි දියතලාව සිසිල් දේශගුණයකින් හෙබි මනස්කාන්ත භූමිභාගයක් වන අතර, දියතලාව නාමය "දිය සහිත තැනිතලාව" යන්නෙන් බිඳී ආවෙකි.

# රට රකින නියමුවන් තනන අභිමානයේ තෝතැන්න

20 වන සියවසේ මුල් අවධියේ දී දකුණු අප්‍රිකාවේ සිට බොයර් යුධ සිරකරුවන් පැමිණීමත් සමග දියතලාව ආරක්ෂක ප්‍රදේශයක් බවට පත්වූ අතර, පසුව සංචාරයට සුදුසු ගමනාන්තයක් ලෙස ප්‍රසිද්ධියට පත්විය. කෙසේ වෙතත් 1949 ඔක්තෝබර් 10 වන දින ශ්‍රී ලාංකීය හමුදාවක් පිහිටුවීම මෙම ප්‍රදේශයේ ඉතිහාසයේ ප්‍රධාන සන්ධිස්ථානයක් විය. එනම්, ශ්‍රී ලංකාව වෙනුවෙන් වෙනම හමුදාවක් පිහිටුවීමේදී නිලධාරීන් පුහුණු කිරීමේ අවශ්‍යතාවයක් මතුවූ බැවින් එහිදී බඳවාගත් නිලධාරීන් එංගලන්තයේ සැන්ඩර්ස්ට් (Sandhurst) වෙත පුහුණුව සඳහා පිටත් කරන ලද අතර සොල්දාදුවන් දේශීයව පුහුණු කරන ලදී. මෙහිදී, නාවික හමුදාව පුහුණු කිරීමේ ආරම්භක පුහුණු භූමියක් වූයේ වර්තමාන විද්‍යාපීඨය පිහිටි දියතලාවයි. මේ අනුව මෙම ගෞරවනීය ආයතනයේ ඉතිහාසය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව පිහිටුවීම සමග බැඳී ඇත.







වසර ගණනාවක් පුරා සොල්දාදුවන් පුහුණු කිරීමේ සිට නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනයක් දක්වා මෙම විද්‍යාපීඨය ක්‍රමිකව විකාශනය වී ඇති අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය ලෙස නිල වශයෙන් 1991 වර්ෂයේ නාමකරණය වීමට පෙර මෙම විද්‍යාපීඨය සඳහා විවිධ නම් භාවිතා විය.


විද්‍යාපීඨය සිය 32 වන සංවත්සරය 38 වන සේනාවිධායක, ගැමුණු හේවා බලකායේ කීර්තිමත් නිලධාරියකු වන මේජර් ජෙනරාල් යූඑල්ජේඑස් පෙරේරා ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් 2024 අගෝස්තු මස 20 වන දින සමරන ලදී. මෙම සැමරුම සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනාවක්, බෞද්ධ භික්ෂූන් වහන්සේලා සඳහා දානමය පිංකමක්, රණවිරු අනුස්මරණ පෙළපාලියක්, සංවත්සර පෙළපාලියක් සහ සියලු නිල දිවාභෝජන සංග්‍රහයක් යනාදී ලෙස උත්සව මාලාවකින් සමන්විත විය.

විද්‍යාපීඨය යනු අප රටේ අසමසම වෘත්තියක් අපේක්ෂා කරන තරුණ ප්‍රජාවට සුදුසුම ආරම්භක ස්ථානයකි. බඳවා ගැනීමෙන් පසු කෙඩෙට් නිලධාරීන්ට පුළුල් සහ දැඩි පුහුණුවක් ලබාදෙන අතර, කනිෂ්ඨ කෙඩෙට් නිලධාරීන් වන ඔවුන් හට ක්‍රම ක්‍රමයෙන් ජ්‍යෙෂ්ඨත්වයට සරිලන ලෙස අණ සහ පාලනය පිළිබඳ වගකීම් ලබාදෙනු ලබයි. වර්තමානය වනවිට ශ්‍රීමත් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය විසින් පිරිනමන "රණ අධ්‍යයන උපාධිය" විද්‍යාපීඨ කෙඩෙට් නිලධාරීන්ට ලබාගැනීමට හැකිවීම විද්‍යාපීඨ ඉතිහාසයේ කැපීපෙනෙන සංවර්ධනයක් ලෙසකර ගැනීමකි.

අශ්වාරෝහක, ගොල්ෆ්, ටෙනිස්, පාපන්දු සහ ක්‍රිකට් ඇතුළු ක්‍රියාකාරකම් සඳහා විද්‍යාපීඨය පහසුකම් සපයනු ලබයි. තවද, ක්‍රීඩාගාර, පුස්තකාල, ශ්‍රවණාගාර සහ කෙඩෙට් නිලධාරීන්ට ඉහල පහසුකම් සපයන භෝජනාගාර ආදී අතිනවීන පහසුකම්ද මීට අමතරව කෙඩෙට් නිලධාරීන්ගේ විනෝදාශ්වාදය සහ පැවැතුම් වැඩි දියුණු කිරීමෙහිලා විනෝදාත්මක ක්‍රියාකාරකම් රැසක්ද විද්‍යාපීඨය විසින් පිරිනමනු ලබයි.

විද්‍යාපීඨයේ අරමුණු ප්‍රකාරව යුද හමුදාවේ විශේෂිත අවශ්‍යතා සපුරාලීම සඳහා කෙඩෙට් නිලධාරීන් පුහුණු කරන අතර, පුහුණු විෂයමාලා යුද්ධ හමුදාවේ අවශ්‍යතා සපුරාලීම සඳහා නිර්මාණය කර ඇත. ඒ අනුව කෙඩෙට් නිලධාරීන් අධිකාරිලත් නිලධාරීන් ලෙස සමත් වනවිට බොහෝ ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය ලබන අතර භාෂා කුසලතා, යුද හමුදා ප්‍රවීණතා, පිරිසක් අතර ප්‍රසිද්ධියේ කතා කිරීම, තීරණ ගැනීම, විධානය සහ පාලනය, ශාරීරික යෝග්‍යතාවය, පෞරුෂ සංවර්ධනය ඉන් කිහිපයකි.

විද්‍යාපීඨයේ ආදර්ශ පාඨය "සේවයෙන් නායකත්වය" වන අතර, එහි අරුත වනුයේ සැබෑ නායකත්වය පැමිණෙන්නේ තම හටපිරිස් වෙත සේවය කිරීමෙන්ය යන මූලධර්මය එහි පදනමයි. ඉන් පෙන්වා දෙන්නේ නායකයකුගේ මූලික කාර්යභාරය වන්නේ සහායදීම, මගපෙන්වීම, නායකයින් නගාසිටුවීම සහ තමන්ගේ කාර්යයට වඩා තම හටයින්ගේ කාර්ය ප්‍රධාන කොට ගෙන සිදුකිරීමයි. තම හටයින් හට සේවය කිරීමෙන් නායකයකු ගෞරවය, පක්ෂපාතීත්වය සහ නායකත්වය සඳහා අවශ්‍ය අධිකාරිය ඵලදායී ලෙස ලබාගනු ලබයි.





# යුද බිමේ සොඳුරු හමුවක මතක



බනි II සිරිවර්ධන




▪ මේජර් ධම්මික කාංචන
3 විජාරෙ


**ඔහු ගැන මතකයන් ඇත්තෙන්ම බොහෝය. ඒවා ලිවීමට කාලය කළමනාකරණය කරගැනීම සේවයේ යෙදී සිටින්නකු ලෙස අපහසුය. ඉතා ඉක්මනින් සේවයෙන් ඉසිඹු ලෑමට බලාපොරොත්තුව සිටින බැවින් ඒ සඳහා ඉදිරියේදී කාලය ලැබෙනු ඇතැයි සිතමි. හමුත්, පවතින තත්ත්වයන් මත මතකයන් අකුරු කිරීමට පරිකල්පන ශක්තියක් ඉදිරියේදී ඉතිරිවේ දැයි සැක සහිතය. අවිනිශ්චිතය. එබැවින් ලැබෙන කාලය තුළ සයිබර් අවකාශයේ හෝ මේ අයුරින් අද අප අතර නොමැති එදා එක්ව සටන් බිමේ සිටි ආදරණීය සහෘදයන් වෙත උපහාරයක් කිරීම සුදුසු යැයි සිතමි.**

ස්ථානය වවුනියා නගරයේ සිට කිෘමිෘ 25 ක් පමණ දුරින් පිහිටි ඒකක ක්‍රියාන්විත මූලස්ථානය. දිනය 1994.06.15 දින අලුයම කාලය. දියතලාව ස්වේච්ඡා පුහුණු පාසලේ අංක 27 දරණ ආධුනික පුහුණු පාඨමාලාව හදාරා විසිරගිය ආධුනික සෙනින් 400 ක් අතරින් අප ඒකකයට ඇතුළත් කරන ලද සෙබළුන් 150 දෙනෙක් ඒකක නියෝජිතයින් සමඟ බස් රථ 05 කින් පමණ ඒකක ක්‍රියාන්විත මූලස්ථානය වෙත රපෝර්තු කළ මොහොතයි. උදෑසන දියතලාවෙන් ගමන් ආරම්භ කළ අප දහවල් ආහාරය ලබාගත්තේ එවකට ඒකක රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් කටයුතු කළ බලලත් නිලධාරී I කරුණාරත්න මහතාගේ බුත්තල ප්‍රදේශයේ පිහිටි නිවසෙනි. අප ඒකකය වෙත රැගෙන යාමට පැමිනි නියෝජිත පිරිස 2/ලුතිතන් ජේඑස්යූ සතුරුසිංහ, බනි I කරුණාරත්න, මා/සැරයන් විජේබණ්ඩාර, සැරයන් ගාමිණී පුනාන්දු, කෝප්‍රල් රුක්මාල්ගෙන් සමන්විත වූහ. නම් ගම් දැනගත්තේ පසුවය. දහවල් ආහාරය සඳහා වේලාව ලඟා වූ විගස වහාම ක්‍රියාත්මක වූ රෙජිමේන්තු සැරයන් මේජර් ගමන් මාර්ගයේ පිහිටි තම නිවස වෙත සියලුදෙනා රැගෙන ගොස් දිවා ආහාරය කඩිනමින් සකස් කර සැපයුවේ එවකට යුද්ධ හමුදාවේ සිටි සොඳුරු මිනිසුන්ගේ විශිෂ්ට චරිත ලක්ෂණ මනාව විදහා පාමිනි. ජංගම දුරකතන හෝ රැහැන් දුරකතන අතිශයින් දුර්ලභ එම කාලයේ 150 ක පමණ පිරිසක් නිවසට දහවල් කෑමට කඩා වැදුන අවස්ථාවේ නිවැසියන් හැසිරුන කඩිනම් විලාසය අද ද සිහියට නැගේ. කෙසේ හෝ විනාඩි 45 ක් පමණ ඇතුළත උණු උණුවේ පරිප්පු සැමන් පොල් සම්බල් හා අල බැදුමක් සමඟ රතු කැකුලු හාලේ බතක් කලකට අමතක නොවන රසවත් ආහාර වේලක් ලෙස භුක්ති විඳීමට අවස්ථාව ලැබුණ අතර, නිවසේ ගෘහපතිනිය හා රෙජිමේන්තු සැරයන් මේජර්ගේ සොහොයුරන් ගම්වාසීන් රොද බැඳ එක්ව් අප හට ආහාර සකස් කිරීමට දුව පැන කටයුතු කළ අයුරු මතකයේ සදාතනිකව තැන්පත්ව ඇත්තේ අප ගම්බද ජීවිතයේ ආගන්තුක සත්කාර පිලිබඳ උසස් හැඟීම් සමඟය. එම ආහාර

වේල ලබාගත් පසු අපගේ නැවතුම කෙලින්ම වාරිකෝට්ටෝරුව ක්‍රියාන්විත මූලස්ථානය වූ අතර, මඟ නැවතීම් නොමැත. කෙසේ හෝ ගමනාන්තයට පැමිණෙන විට අද මෙන් කාපට් සහිත මාර්ග පද්ධතියක් නොමැති මාර්ගවල ගමන් ගෙන අප සැම අධික ලෙස වෙහෙසට පත්වී සිටියහ. අප මූලස්ථානයට පැමිණි පසු පිලිගත්තේ ක්‍රියාන්විත මූලස්ථානයේ බලලත් නිලධාරී II බොනී සිල්වා විසිනි. ඉතා දක්ෂ උපදේශකයෙක් හා කාර්යක්ෂම පුද්ගලයකු වූ හෙතෙම තද විනය නීති පවත්වා ගෙන ගිය අයෙක් සේ එවකට ප්‍රකට වී තිබිණි. කෙසේ නමුත් ඔහු අප 150 දෙනා සඳහා ආහාර පිළියෙල කර තිබූ  අතර, ඉතා කඩිනමින් ගත් ආහාරයත් සමඟ ගුවුන්ඩ් ෂීට් එලාගෙන වැටුන වැටුන තැන්වල නින්දට වැටුණේ හෙට දිනයේ කුමක් සිදුවේදැයි අනපේක්ෂිත හැඟීමෙනි.

පසුදින උදෑසන වටින් ගොඩින් එලිය වැටුන විට අපි අවදි වී පිරිසිදුවීම සිදුකර අවට බැලීමේදී පෙනී ගියේ මාස 06 කට ආසන්න කාලයක් දියතලාව සුන්දර මනස්කාන්ත භූමි දර්ශනවලින් අනූන හිම මීදෙන ශීතල සැපදායක පරිසරයේ සිට අප වැටී ඇත්තේ ඉතා කටුක ශුෂ්ක පරිසරයකට බවයි. ඉමක් නොපෙන පයිනස් වනාන්තර සූර්යාලෝකයෙන් දිලිසෙන හරිත වර්ණ කඳුමුදුන් වෙනුවට කාෂ්ටක දූවිලි බරිත පොළව කටුපඳුරු බිම දුටුවිට සිතට නැඟුන හැඟීම පුහුණුවීම් කාලයේ කවදා මෙයින් බේරී යන්නේදැයි කල්පනා කළ දියතලාව වෙත දුවගෙන යාමට හැකියාවක් ඇත්නම් යාමට නොපැකිලෙන බවයි. සියලු දෙනාගේ මුහුණුවල ප්‍රශ්නාර්ථ රාශියකි. ඉතා නුදුරින් වෙඩිහඬද අඛණ්ඩව ඇසීම තවමත් රණබිමේ අත්දැකීම් ලබා නොමැති අප හට ගෙන දුන්නේ තරමක බියජනක හැඟුමකි. කෙසේ වෙතත් ලබා ඇති පුහුණුව ගැන තදබල විශ්වාසයක් ඇත. උදා ආහාරයෙන් පසු අණදෙන නිලධාරී අප ඇමතීමට බලාපොරොත්තුව සිටින බව දැනුම් දෙන ලදී. ඒ අනුව කඩිනමින් ආධුනිකයකුට හිමි හොඳම ඇඳුම් කට්ටලයෙන් සැරසුනු අතර මනස ව්‍යාකූලය. හේතුව ලැබැදියන්ගෙන් වෙන්වී මාස 07 ක් පමණ වී ඇති අතර, එක් දිනක්වත්  නිවසට යාමට අවස්ථාව ලැබී නොමැත. එම කාලයේ හැටි එහෙමය. ශාරීරිකව මෙන්ම මානසිකව ද සෙබළකු ශක්තිමත් කිරීම උපරිම මට්ටමින් කිරීම හොඳින් හෝ නරකින් සිදුවිය. කෙසේ වෙතත් ක්‍රියාන්විත මූලයේ නිලධාරී අණදෙන ලුතිනන් බ්‍රිජ් රණසිංහ ගේ ප්‍රියජනක හිනාව කථා විලාසය මෙන්ම කඩවසම් පෙනුම අප සැමගේ සිත පහන් කිරීමට සමත් වූහ. අප රාජකාරී කළ යුත්තේ එවැනි නිලධාරීන් සමඟ නම් කිසිදු ගැටලුවක් නොමැති බවට මානසික සහනයක් සිතට දැනුණි. අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් විජේබී වීරකෝන් අප සාදරයෙන් බළඇණිය වෙත පිළිගත් අතර, ඒකක රාජකාරී පිලිබඳ කෙටියෙන් විස්තර කර අප නුදුරේදීම සටන්කාමී කණ්ඩායම් වෙත යවන බවත් භූමිය හුරුපුරුදු වන තෙක් දින කිපයක් මෙම කඳවුරේ නැවතී සිටින ලෙසත් දැනුම් දී අපෙන් සමුගත්තේය. එහිදී, අමතක නොවන සිදුවීම වූයේ අප බඳවාගැනීමේ කණ්ඩායමට අයත් සෙනින් කිහිපදෙනෙක්ම නිවාඩු ඉල්ලා අණදෙන නිලධාරී ඉදිරියේ මහා හඬින් හඬා වැටීමයි. දැනට පවතින ක්‍රියාන්විත අවසන් වන තෙක් නිවාඩු ලබාදිය නොහැකි බව අණදෙන නිලධාරී එහිදී පවසා සිටියේය. හඬා වැටුන අය කිහිපදෙනෙක් පසුව අපගේ හා ජ්‍යෙෂ්ඨයින්ගේ උපහාසයට ලක්වූ අතර, තමා එසේ අණදෙන නිලධාරී ඉදිරියේ හඬා නොවැටුන බවත් නිවාඩු ඉල්ලීම පමණක් සිදුකළ බවත් එහිදී ඔවුන් පැවසීමට හුරුවූයේ උපහාස දරාගැනීමට නොහැකිවය. ඇතැමුන් හඬා වැටුන ආකාරය රඟදක්වා පෙන්වීමට මිතුරන් ඉදිරිපත් වීම ඉතා හාස්‍යජනක විය.

දින දෙක තුනක් ආරක්ෂක වළල්ලේ රාජකාරී සඳහා යාම සිදුකළ පසු අප බෙදා වෙන්කර කණ්ඩායම්වලට රපෝර්තු කරවන දිනය උදාවිය. එය තරමක අඳුරු සවස් කාලයක් විය. මූලස්ථාන ගොඩනැගිල්ල ඉදිරිපිට පෙළ ගස්වා ඒ ඒ කණ්ඩායම්වලට වෙන් කළ අය එදිනම අදාළ කඳවුරු සඳහා රැගෙන ගිය අතර, අණ හා පාලන කණ්ඩායමට වෙන් කරන ලද සෙනින් පසුදින වවුනියාව නගරාසන්නයේ පිහිටි ඊරට්ටපෙරියකුලම කඳවුර වෙත රැගෙන යනු ලැබූහ. සටන්කාමී කණ්ඩායම්වලට අමතරව අණ හා පාලන කණ්ඩායමට ඇතුළත් වූයේ ලිපිකරු, රියදුරු හා වෙනත් වෘත්තීන් සඳහා පුහුණුවීමට සුදුසුකම් සහිත සෙනින්ය. මාද ලිපිකරුවකු වශයෙන් පුහුණුවීමට අපේක්ෂා කළත් මා ඇතුළත් වූයේ ඩෙල්ටා කණ්ඩායමටය. එය මාගේ හමුදා ජීවිතයේ බලාපොරත්තු කඩවූ පළමු අවස්ථාවයි. මගේ අධ්‍යාපන සුදුසුකම් ඒ සඳහා ප්‍රමාණවත් යැයි සිතුවද තෝරාගැනීම් කළ ජ්‍යෙෂ්ඨයින් මා තෝරාගැනීම පසුවට කල්දමන ලදී. මා හට එම අවස්ථාව ලැබීමට තවත් වසර ගණනාවක් කල් බැලීමට සිදුවිය.

කෙසේ වෙතත් මාස ගණනාවක් එක කුසේ වන් සොහොයුරු කැලක් මෙන් ජීවිතයේ අතිශය කටුක දුක්ඛිත අවස්ථාවන් සමසේ බෙදාගත් අය වෙනත් ස්ථාන වෙත වෙන්ව යාම හැඟුම්බර අවස්ථාවක් විය. ඇතැමුන්ගේ වෙන්වීම ඇත්ත වශයෙන්ම සදාකාලික විය. එය ජීවිතයේ හැටිය. අප හා තවත් හට කණ්ඩායමක් එකම ලොරි රථයක නැගී පුවරස්කුලම මාර්ගයේ ගමන් ගත් අතර, අඳුරු වැටී එද්දී, එය ස්ථානයක නවත්වා ඩෙල්ටා කණ්ඩායමේ අය බසින ලෙස උපදෙස් ලැබුණි. අප විසිපස්දෙනා ලොරියෙන් බැස ඒ වනවිට ලොරියේ සිටි අප සගයන්ගෙන් අත් වනා සමුගත් අතර, මාර්ගය අසලට අප පිළිගැනීම සඳහා පිරිසක් පැමින තිබුණි. ඒ අපගේ ඉදිරි යුද හමුදා ජීවිතය හැඩගස්වා ගතයුතු අප අයත් සටන්කාමී කණ්ඩාමේ ජ්‍යෙෂ්ඨයින් කිහිපදෙනෙකි. ඒ මගේ පළමු කණ්ඩායම් සැරයන් මේජර් වූ සැරයන් මේජර් සිරිවර්ධන ය. අනෙක් අය නම් වැටුප් අංශයේ කොප්‍රල් සුභසිංහ, විනයශාලා ලිපිකරු කෝප්‍රල් සෝමරත්න, සාසෙ අනුරුද්ධ සාසෙ අනිල් ය. අප සියලු දෙනා අපගේ බඩුබාහිරාදිය ද රැගෙන ඔවුන් පිටිපසින් ගමනාරම්භ කළේ දැනට දශක තුනක් ගෙවා අවසන් කළ හමුදා ජීවිතයයි.

අපගේ කණ්ඩායම්භාර සැරයන් මේජර් අතිශය කාරුණික පුද්ගලයකු විය. ඔහුගේ කථා ස්වරූපය අතිශය ගැමි ව්‍යවහාරය වූ අතර, දඹුල්ල ප්‍රදේශයේ පදිංචි අයෙකි. එවකට පැවති ස්වේච්ඡා සන්නාහ සන්නද්ධ බලකායට ඇතුළත්ව රාජකාරී කළ එතුමා එම බලකාය විසුරුවා හැරීමෙන් පසු පාබල හමුදාවට එක් වී රාජකාරී කරමින් සිටියදී විජයබාහු රෙජිමේන්තු ආරම්භ කිරීමේදී පුමුඛ සාමාජිකයකු වශයෙන් පැමිණ ඒකකය ස්ථාපනය කිරීමට දරේදිය ඇදි අයෙක් විය. මොහුගේ තිබූ මානුෂික ගුණාංග හා පහල සෙබළුන් හට පැවති ආදර කරුණාව ඔහු හට රාජකාරී වශයෙන් හිතවාදී නොවුන අවස්ථා තිබුණ ද ඔහුගේ ගති ගුණ වෙනස් වූ බවක් මා අසා නැත. එය මා පළමු දිනයේදීම අවබෝධ කරගත්තේ එදින රාත්‍රී සිදුවූ සිදුවීමකිනි. සාමාන්‍යයෙන් ආධුනික සෙනින් කඳවුරට පැමිණි පසු සෙබළුන් වාසය කරන භටනිවාස වෙත යවා කොනොනින් හා ජ්‍යෙෂ්ඨ සෙබළුන්ට භාරදිය යුතු වුවත් මොහු

අප සියලුදෙනාම ඔහු ස්ථානගත වී සිටින නිවස්නය පිහිටි පෙදෙස වෙත රැගෙන ගොස් අසල පිහිටි වනගත කොටසේ ස්ථානගත වන ලෙස දන්වන ලදී. කිසිදු සයනෝපකරණයක් නොමැතිව අප සතු පැක් එක හිසට තබාගෙන ග්‍රවුන්ඩ් ෂීට් බිම එලාගෙන රැය පහන් කිරීමට සැරසෙද්දී මොහු පැමිණ ඉටි පන්දම් කිහිපයක් ලබාදුන්නේ සර්පයින්ගේ තර්ජනය දැනුවත් කරමිනි. අප ද වැඩි දුර සිතා බැලීමක් නොකර ඉටි පන්දම් දැල්වූයේ පලාතම ඒකාලෝක කරමිනි. ටික වේලාවක් යද්දී නිලධාරී අණදෙන කපිතාන් යූජීඑස් කුමාරසිංහ අප සිටින ස්ථානයට පැමිණියේ අපගේ පැමිණීම සැලවී අප ගැන සොයා බැලීමටයි. එහිදී, ඔහු අපගේ ඉටිපන්දම් ආලෝක පහන් පූජාව දුටු විගස ඉතා තදින් බැන වදින්නට විය. "කවුද ඉටිපන්දම් ගහන්න කීවේ" අසන විට දුන් පුද්ගලයා ගැන නොපවසා සිටීමට තරම් පරිණත නොවූ අප දුන් පිළිතුර නිසා නිලධාරී අණදෙන අප ඉදිරියේදීම බනි II සිරිවර්ධනට බැන වදින්නට විය. ඔහු කෝපාවිෂ්ඨව අපෙන් ද විමසා සිටියේ දියතලාවේ මාස ගණනක් පුහුණු කලේ කැලේ ඉටිපන්දම් ගහන්න ද යනුවෙනි. සියලුදෙනා නිහඬව ඔහුගේ අණ පිළිගත් අතර, ආලෝක පූජාව වහාම නිවා දැමිණි. ටික වේලාවකින් කෝපය නිවුණු පසු ඔහු තොරතුරු විමසා උදෑසන හමුවන බව පවසා ඔහු අපගෙන් සමුගත්තේය. පසුදින බනි II සිරිවර්ධන අපව නිලධාරී අණදෙන වෙත රපෝර්තු කරවන ලද අතර, එහිදී අවැසි උපදෙස් ලබාදී අප කණ්ඩායම යටතේ ස්ථාපිත ඛණ්ඩ වෙත අපව යවන ලෙස උපදෙස් ලබාදුනි. බනි II සිරිවර්ධන මා හට විශේෂ සැලකිල්ලක් දක්වන බව හැඟී ගියේ මාගේ මව කුඩා කාලයේ මියයාමත් බාල සෙහොයුරන් තිදෙනකුගේ වගකීම මා වෙත පැවරී තිබීම නිසා බව මම ඉතා හොඳින් දැන සිටියෙමි. ඔහුගේ වාග් විලාසයේ හමුදා නිලතල නොමැති අතර ඔහුට කනිෂ්ඨ සැමට නම හෝ ඔහුට කැමති කොටසකින් ඇමතීම ආවේනිකය. ජයකොඩියා, කාංචනයා, ලෙස්ලියා ඒ ඔහුගේ ඇමතුම් විලාසයන්ය. මා ඛණ්ඩයට ඇතුළත් වුවද කණ්ඩායම් මූලස්ථානයට ගිය සැමවිටම ඔහු දුක සැප විමසීම පුරුද්දක් කරගෙන තිබිණි. ඔහු හා බැඳි හාස්‍යජනක සිද්ධීන් රැසක් වුවද කතාව දිග වන බැවින් එකක් පවසමි. අප ඒකකය වවුනියාවේ රාජකාරී අවසන් කර යාපනය රාජකාරී සඳහා කැඳවා තිබුණේ රිවිරැස මෙහෙයුම සඳහාය. අප අපගේ ආරක්ෂක වළල්ල ජාතික ආරක්ෂක බළමුළුව වෙත භාරදී යාපනය වෙත ගුවන් මඟින් යාමට අනුරාධපුර ගුවන් තොටුපලට පැමිණෙන ලදී. ගුවන් යානා වෙන් කිරීමේදී ඔහු සහ මා එකම ගුවන් යානාවේ උදෑසන කාලයේ ගමන් ගැනීමට නියමිතව තිබූ අතර, පලාලි ගුවන් තොටුපලට මෝටාර් ප්‍රහාර එල්ලවන බවට ඒ වෙද්දී තොරතුරු ලැබී තිබිණි. කෙසේ නමුත් අප වෙනුවෙන් වෙන් කර තිබූ ගුවන් යානය උදෑසන 10.00 ට පමණ ගුවන් ගත විය. අනුරාධපුරයේ සිට පලාලි ගුවන් කාලය සාමාන්‍යයෙන් පැයකට මඳක් අඩුවෙන්ය. අප බහුතරයක් පළමු ගුවන් අත්දැකීම විඳිමින් සිටි අතර, බනි II සිරිවර්ධන අසුන් ගෙන සිටියේ මා හොඳින් පෙනෙන ස්ථානයක වූ අතර, ඔහුගේ මුහුණේ යම් කලබලයක් මම දුටිමි. අපි සැවොම ගුවන් යානයේ ඉතා සීමිත කවුළුවලින් පිටත බැලීමට උත්සාහ කරමින් සිටියෙමු. යම් අසාමාන්‍ය තත්ත්වයක් වර්ධනය වන බව පෙනුනේ ගුවන් හමුදා කාර්ය මණ්ඩලය යානය තුළ ඔබ මොබ සැරි සැරීම වැඩිවීම හේතුවෙනි. ගුවන් කාලය පැය එකහමාරක් පමණ වීම අප සැමට ප්‍රහේලිකාවක් විය. කෙසේ නමුත් ගොඩ බෑම හොඳින් සිදුවුවද යම් ප්‍රශ්නාර්ථයක් විය. ගුවන් යානයෙන් බිමට බැසි පළමු කිහිපදෙනා අතර, බනි II සිරිවර්ධන ද වූ අතර, බිමට බැස ඔහු පවසා ඇත්තේ උඹලා බොරුවට බයවෙන්න එපා යාපනෙන් අනුරාධපුරය වගේම තමා ඔය පොල්ගසුත් තියෙන්නේ යනුවෙනි. අසල සිටි සහායක සෙනී හට පවසා ඇත්තේ ගනින් මට බුලත් විටක් යනුවෙනි. සිදුව ඇති මහා වැරැද්ම නිවැරදි වීමට ගියේ තත්පර කිහිපයක් පමණි. සිදුව ඇත්තේ පලාලි ගුවන් තොටුපලට අඛණ්ඩව එල්ල වූ ප්‍රහාර හේතුවෙන් ගුවන් සංඥා මඟින් නියමුවන්ට ලැබුණ අණ විධාන මත ඔවුන් ගුවන් යානය ගුවනේදීම මාර්ගය වෙනස් කර නැවත අනුරාධපුර ගුවන් තොටුපලටම ගොඩ බා ඇත. ගුවන් යානයෙන් බිමට බට බනි II සිරිවර්ධන හට කලබලකාරී තත්ත්වය මත පරිසරයේ වෙනස්වීම අඳුනාගත නොහැකිව යාපනය හා අනුරාධපුරය එක වගේ දර්ශණය වී ඇත. මෙය ඇත්තෙන්ම කාලයක් යනතුරු ඒකකයේ සියලු නිල අතරේ පැතිරී ගිය හාස්‍යජනක කතා රාශියක උපත වූ අතර, එම අවස්තාවේ සිටි අප සැබෑ සිද්ධිය දකින ලදී. ඇතැම් විට නිලධාරීන් පවා ඔහුට විහිලුවක් කර කෝප ගැන්වීම සඳහා "සාජන් මේජර් එහෙයි මෙහෙයි කියලා ලොකු වෙනසක් නැහැ නේද?" ඇසූවිට ලැබුණ පිලිතුරු සිතාගත නොහැකි විය.


මහත් වූ මානුෂික ගති ඇති මේ සොඳුරු මිනිසා මා සාමාන්‍ය සෙබළකු වශයෙන් සිටියෙදී "කාංචනයා කවදා හරි කොමිෂන් ඔෆිසර් කෙනෙක් වෙනවා. මම හිටියොත් මටත් මූට සැලියුට් ගහන්න වෙනවා" යැයි අනාවැකි පැවසීය. එසමයේ මා අධිකාරියට පත්වීමේ කිසිදු අදහසක නොවීය. එසේම, අප කණ්ඩායම් භාර නිලධාරී වූ ඉහත සඳහන් අලෝක පූජාව පවත්වා අප බැනුම් අසාගත් කපිතාන් යූජීඑස් කුමාරසිංහ ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මියගිය බව ආරංචි වී ඔහු ශෝකය දරාගත නොහැකිව මහ හඬින් හඬා වැලපුන බව පැවසුවේ අප කණ්ඩායමේ සෙනියකු විසිනි. එසේම, රාජකාරී තත්ත්වයන් මත කලකදී මා කණ්ඩායම් රාජකාරියෙන් මිදී වෙනත් මූලස්ථානවල රාජකාරී කළද සෑම අවස්ථාවකදීම මා ගැන තොරතුරු විමසා "කාංචනයා ඉහලටම යනවා ඒක නවත්වන්න කාටවත් බැහැ" යනුවෙන් බොහෝ අවසථාවන්හිදී පවසා ඇති බව මා හට දැනගැනීමට ලැබිණි. වර්තමානයේ මෙන් ජංගම දූරකථන නොමැතිකම හේතුවෙන් එම සබැඳියාවන් හදවත්වල පමණක් සදාකාලිකව තැන්පත් වී ඇත. මා හට අවසන් වශයෙන් ඔහු ගැන දැන ගැනීමට ලැබූ පුවත නම් විශ්‍රාම ගොස් සිටියදී විශ්‍රාම වැටුප් හිමිකම් ලැබීමට පළමු ජීවිත සටනින් පැරදී ඇති බවයි. මෙය අසන්නට ලැබීම මාගේ ජීවිතයේ ඉතාමත් සංවේදී අවස්ථාවක් වූ අතර, මේ සොඳුරු මිනිසාට රට වෙනුවෙන් සේවය කර අවම වශයෙන් වසර 05 10 ක් විශ්‍රාම ලබා නිදහසේ ජීවිතය ගෙවීමට ඉඩ ලබා නොදීමට තරම් සොබාදහම කුරිරු වූයේ මන්දැයි සිතාගත නොහැක. මගේ පළමු කණ්ඩායම් සැරයන් මේජර් තුමනි ඔබ නොමැති වුවද ඔබගේ අනුගාමිකයකු වශයෙන් ඔබ පැවසූ අයුරින්ම මම මා හට හැකි ඉහලම නිලයකට පත්වී රටට ජාතියට සේවය කරමි. මෙලොවට වඩා සුන්දර ස්ථානයකදී යළි ඔබ මා නැවත හමුවීමට ප්‍රාර්ථනා කරමි.






## 4 වැනි CISM Military World Cadet

# ක්‍රීඩා උළෙලේ දස්කම්




4 වන *CISM Military World Cadet* ක්‍රීඩා උළෙල ඉකුත් අගෝස්තු මස 19 වන දින සිට 24 වන දින දක්වා වෙනිසියුලාවේ කැරකාස් හිදී පැවැත්විණ. එම තරගාවලියට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් කාන්තා කෙඩෙට් නිලධාරිනී ටීකේජ්ඩබ්ලිව් චතුරංගනී සහභාගී වූ අතර, එහිදී දුර පැනීමේ ඉසව්වෙන් මීටර් 5.24 ක දුරක් වාර්තා කරමින් එම ඉසව්වේ ජයග්‍රහණය හිමිකරගැනීමට ඇය සමත් වූවාය. ජාත්‍යන්තර තරගයකදී කැපී පෙනෙන දස්කම් ඉදිරිපත් කරමින් ශ්‍රී ලංකා කණ්ඩායම වෙනුවෙන් ඇය ලබාගත් ජයග්‍රහණය ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයට මෙන්ම මුළු මහත් හමුදාවටම අභිමානයකි.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කෙඩෙට් නිලධාරි අංක 93 බී යටතේ දියතලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයෙන් මූලික යුද පුහුණුව ලබමින් තරගයට සහභාගී වීමට ඇයට අවස්ථාව හිමි විය.

4 වන *CISM Military World Cadet* ක්‍රීඩා තරගයේ රන් පදක්කමක් සහ ලෝකඩ පදක්කම් දෙකක් දිනාගනිමින් 6 වන ස්ථානය දිනා ගැනීමට ශ්‍රී ලංකා කෙඩෙට් කණ්ඩායම සමත් විය.

# අන්තර් රෙජිමේන්තු කරාතේ ශූරතාවලිය 2024



යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු කරාතේ ශූරතාවලියේ අවසන් තරග පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති, ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ බලකාධිපති සහ යුද්ධ හමුදා කරාතේ කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්එම් ප්‍රනාන්දු ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූලි මස 23 දින පැවැත්විණි. 2024 ජූලි මස 19 වන දින සිට 22 දින දක්වා පැවති මෙම තරගාවලියේ අවසන් උණුසුම් තරග වට කිහිපයකින් අනතුරුව ශ්‍රී ලංකා පාබල හමුදාව පරදවා ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් සමස්ත ශූරතාවය හිමි කරගැනීමට සමත් විය. එසේම කාන්තා සමස්ත ශූරතාවය ශ්‍රී ලංකා සංඥා බලකායට ද අනුශූරතාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය ද හිමිකර ගැනීමට ද සමත්විය. එහිදී හොඳම ක්‍රීඩකයා ලෙස ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් කෝප්‍රල් කුමාර එස්ජ්එම්ඩීපී ද හොඳම ක්‍රීඩිකාව ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායට අයත් කෝප්‍රල් ප්‍රේමචන්ද්‍ර ඩීඑම්ආර් ද සම්මාන හිමිකරගත්හ.

# ඔරු පැදීමේ තරඟාවලියක්





56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ එම සේනාංකය සහ 562 වන පාබල බලසේනාවේ හටපිරිස් සංවිධානය කළ ඔරු පැදීමේ තරඟාවලියක් ඉකුත් ජූලි මස 24 වන දින කොක්එලිය ජේයාඩිකුලම් වැවේදී පවත්වනු ලැබූහ. තනි, ද්විත්ව සහ ත්‍රිත්ව ඉසව් ලෙස කාණ්ඩ තුනක් යටතේ පැවති මෙම තරඟාවලිය එම සේනාංකයේ සේනාංකාධිපතිගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. ආරම්භයේ සිටම අතිශය තියුණු මුහුණුවරක් ගනු ලැබූ මෙම තරඟාවලිය සාර්ථක කරගැනීම සඳහා රඹවැව්ටි නන්නිර් ග්‍රාමීය ධීවර සමිතිය විසින් බෝට්ටු සහ හබල් ලබාදෙමින් සහයෝගය දැක්වීම විශේෂත්වයකි. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා සාමාජිකයෝ සහ සිවිල් වැසියෝ විශාල පිරිසක් ද එක්වූහ.

# ජල පිහිනුම් ශූරතාවය යුද්ධ හමුදාවට



කිලෝමීටර් 5 සහ 10 විවෘත ජල පිහිනුම් ජාතික ශූරතාවලිය - 2024 ත්‍රිකුණාමලය නැව් තටාංගණයේදී ඉකුත් ජූලි මස 20 සහ 21 දිනවල පැවැත්විණ. මෙම තරඟයට පාසල් සහ ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පිහිනුම් ක්‍රීඩකයෝ 40 දෙනෙක් සහ ක්‍රීඩිකාවෝ 10 දෙනෙක් සහභාගී වූහ. එහිදී යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් තම සුවිශේෂී දක්ෂතා සහ කැපවීම ප්‍රදර්ශනය කරමින් එහි ශූරතාව හිමිකරගැනීමට සමත්වූහ.

# රණවිරු ඇපරල් වාර්ෂික නෙට්බෝල් තරඟාවලිය




රණවිරු ඇපරල් ආයතනය විසින් සංවිධානය කළ වාර්ෂික නෙට්බෝල් තරඟාවලිය ඉකුත් ජූලි මස 12 වන දින අලව්ව කර්මාන්තශාලා ක්‍රීඩාංගණයේ දී පැවැත්විණ. එහිදී, උණුසුම් තරඟයකින් අනතුරුව අලව්ව කර්මාන්තශාලා කණ්ඩායම පරාජය කරමින් යක්කල කර්මාන්තශාලා කණ්ඩායම ජයග්‍රහණය අත්පත් කරගනු ලැබීය. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස එක්වූ එහි සේනාවිධායක බ්‍රිගේඩියර් එම්ජීඑන්බී මහතුවක්කාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ජයග්‍රාහකයින් වෙත කුසලාන සහ සහතිකපත් ප්‍රදානය සිදුකළ අතර, නියෝජ්‍ය සේනාවිධායක සහ කර්මාන්තශාලා දෙකෙහිම කළමණාකරුවන් ද ඊට එක්වූහ. තවද, 4ever skin naturals (PVT) Ltd අලෙවි ප්‍රවර්ධන ප්‍රධානී බුද්ධික වික්‍රමගේ මහතා ද ත්‍යාග බෙදාදීම සඳහා සහභාගී විය.

# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අන්තර් බලඇණි කැරම් ශූරතාවලිය



ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් සංවිධානය කරනු ලැබූ අන්තර් බලඇණි කැරම් ශූරතාවලිය - 2024 ඉකුත් ජූලි මස 18 සහ 19 යන දෙදින තුළ අඹේපුස්ස සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පැවැත්විණ. එම රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් සීඑස් තිබ්බොටුවගේ ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම තරඟාවලියට නිලධාරීන්, සෙබළ විශාල පිරිසක් ද සහභාගී වූහ. එහිදී තරඟාවලියේ ශූරතාවය 4 සිංහ රෙජිමේන්තුව දිනාගත් අතර, අනුශූරතාවය 1 සිංහ රෙජිමේන්තුවට හිමිවිය.

# අන්තර් රෙජිමේන්තු පාපැදි ශූරතාවය දිනා





යුද්ධ හමුදා පාපැදි කමිටුව විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකා යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු පාපැදි තරගාවලිය" ඉකුත් ජූලි මස 24 හා 25 දිනවල උඩවලව ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපලේ දී පැවැත්විණි. මෙම තරගාවලිය සඳහා රෙජිමේන්තු 11 කින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 140 දෙනෙක් සහභාගී වූ අතර, එහිදී ඔවුහු විවිධ කාණ්ඩ යටතේ තරග වදිනු ලැබූහ. ඒ අනුව මෙවර තරගාවලිය කේවල කාලය මැනීමේ ස්ටෑන්ඩඩ්/රේසින් තරගයකින් ද ස්ටෑන්ඩඩ්/රේසින් තරගයකින් ද කාන්තා ස්ටෑන්ඩඩ් පාපැදි තරගයකින් ද වයස අවුරුදු 50 ට වැඩි අයවලුන්ගේ තරගයකින් ද සමන්විත විය.

මෙහි ශූරතාවය ලකුණු 118 ලබාගනිමින් ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය විසින් දිනාගත් අතර, ලකුණු 28 ක් ලබාගනිමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා සිංහ රෙජිමේන්තුව විසින් එහි අනුශූරතාවය දිනාගන්නා ලදී. රේසින් පාපැදි තරගයේ ප්‍රථම ස්ථානය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ කාරක සෙබළ පෙරේරා ඒඩීඑස් ද, ස්ටෑන්ඩඩ් පාපැදි තරගයේ ප්‍රථම ස්ථානය විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ ලාන්ස් කෝප්‍රල් මාරප්පෙරුම ඒඩී ද දිනාගනු ලැබූහ. කාන්තා ස්ටෑන්ඩට් පාපැදි තරගයේ ප්‍රථම ස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ ලාන්ස් කෝප්‍රල් ප්‍රනාන්දු ඩබ්ලිව්ආර්එම් ක්‍රීඩිකාව විසින් හිමිකරගන්නා ලදී. මෙම අවස්ථාවට යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී සහභාගී විය.

# අන්තර් රෙජිමේන්තු වොලිබෝල් ශූරතාවලිය - 2024

අන්තර් රෙජිමේන්තු වොලිබෝල් ශූරතාවලිය - 2024 ආරක්‍ෂක සේනා ආඥාපති (වන්නි) සහ විශේෂ බලකායේ බලකාධිපති මෙන්ම යුද්ධ හමුදා වොලිබෝල් කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ මගපෙන්වීම යටතේ ඉකුත් ජූලි මස 25වන  දින පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගනයේ දී පැවැත්විණ.

එහිදී, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය අතර පැවති සුපර් ලීග් අවසන් මහා තරගය නැරඹීමට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එස්ආර්බී අළුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී සහභාගී විය. ඉකුත් ජූනි මස 25 වන දින සිට ජූලි මස 02 වන දින දක්වා පැවති මෙම තරගාවලිය සඳහා විවිධ රෙජිමේන්තු නියෝජනය කරමින් පිරිමි කණ්ඩායම් 19 ක් සහ කාන්තා කණ්ඩායම් 04 ක් සහභාගී වූහ.

එහිදී, උණුසුම් තරගයකින් පසු තම ප්‍රතිවාදියා පරදවමින් ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා කණ්ඩායම සුපර් ලීග් ශූරතාව දිනාගත් අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය දෙවන ස්ථානය සහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව තෙවන ස්ථානය හිමිකරගනු ලැබීය. තරගාවලියට විශේෂ අත්දැකීමක් එක්කරමින් අවසන් මහා තරගයට පෙර "ඒ" කාණ්ඩයේ පිරිමි සහ කාන්තා ආධිපත්‍යය හිමිකර ගැනීම වෙනුවෙන් තරග දෙකක් පැවැත්විණ. එහි "ඒ" කාණ්ඩයේ පිරිමි තරගය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය සමගින් ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුව තරග වැදි අතර, එහිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය ශූරතාවය හිමිකරගැනීමට සමත්විය. එසේම, "ඒ" කාණ්ඩයේ කාන්තා අවසන් වටය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය සමගින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා



කාන්තා බලකාය තරග වැදි අතර, එහිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායට ශූරතාවය හිමිවිය.

මෙම අවස්ථාවට ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති සහ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී, ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති සහ විශේෂ බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, වොලිබෝල් කමිටුවේ උප සභාපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඩබ්ලිව්කේ රොහාන් ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන්, සෙසුනිලයන් සහ ප්‍රේක්ෂකයින් විශාල පිරිසක් තරගය නැරඹීමට සහභාගී වූහ. තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා ලෙස ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවට අයත් ලා/බො කැළුම්රත්න පීඑම්සී ද දක්ෂතම ප්‍රහාරකයා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායයේ කෝප්‍රල් කලෙෙයි වෙල්වම් ද සම්මාන හිමිකර ගත්හ.

රණවිරුවා

# නාගරික සටන් පාඨමාලා
## අංක 03 සාර්ථකව අවසන්










විශේෂ බලකා පුහුණු පාසල මගින් පවත්වනු ලැබූ නාගරික සටන් පාඨමාලා - අංක 03 සහතිකපත් ප්‍රදානෝත්සවය මන්කි බ්‍රිජ් (*Monkey Bridge*) හි පිහිටි 4 විශේෂ බලකා රෙජිමේන්තු පරිශ්‍රයේදී ඉකුත් අගෝස්තු මස 12 වන දින පැවැත්විණි. නිලධාරීන් දෙදෙනකු සහ සෙසුනිලයන් 59 දෙනකුගේ සහභාගීත්වයෙන් පැවති මෙම පාඨමාලාවේ අවසන් උත්සවයට ප්‍රධාන අමුත්තා ලෙස ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති සහ විශේෂ බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී සහභාගී විය. තවද, 53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්ටීඅයි මහලේකම් ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් ද මෙම අවස්ථාවට එක්වූහ.


# රණවිරුවා









**අධීක්ෂණය**

මේජර් ජෙනරාල්
කේවීඑන් රසික කුමාර
එන්ඩීසී පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
එම්ආර්එස් චන්ද්‍රකුමාර
යූඑස්පී පීඑස්සී අයිජී



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්පීජේ පවන්ති

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 බනි II සේනාරත්න ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීජීඑම් - 11 ඉසේරෙ

**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**
"රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර.


**ඊමේල්**
dtemedia&psyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**
011 2993076

**ගුත දිගුව**
51445 / 51446 / 51447

**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය



# යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු
# සංග්‍රාමික වෙඩි තැබීමේ තරඟාවලිය - 2024







යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු සංග්‍රාමික වෙඩි තැබීමේ තරඟාවලිය - 2024 හි ජයග්‍රාහකයින් වෙනුවෙන් සහතිකපත් සහ කුසලාන ප්‍රදානය කිරීමේ උත්සවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨ ගෘහස්ථ ක්‍රීඩාංගණයේ දී යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එස්ආර්බී අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අගෝස්තු මස 30 වන දින පැවැත්විණි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා සුළු අවි සංගමය, ප්‍රගුණ වෙඩික්කරු පුහුණු පාසල සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලද මෙම තරඟාවලිය ඉකුත් අගෝස්තු මස 16 වන දින සිට 25 වන දින දක්වා දියතලාව වෙඩි පිටියේ දී පැවැත්විණි. විවෘත, ආධුනික හා සේවා රෙජිමේන්තු කාණ්ඩ ඔස්සේ තරග වැදුණු මෙම තරඟාවලිය සඳහා යුද්ධ හමුදාවේ රෙජිමේන්තු 23 ක් නියෝජනය කරමින් කණ්ඩායම් 37 ක් සහභාගී වූහ. මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එස්පීජීඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී මෙන්ම තවත් නිලධාරීන් සෙසු නිලයන් රැසක් ද සහභාගී වූහ.

මෙම වෙඩි තැබීමේ තරඟාවලියේ විවෘත කණ්ඩායම් ශූරතාවය විශේෂ බලකාය ද අනුශූරතාවය ගජබා රෙජිමේන්තුව ද හිමිකරගත්තේය. තවද, එහි නවක කණ්ඩායම් ශූරතාවය විශේෂ බලකායට ද අනුශූරතාවය කමාන්ඩෝ රෙජිමේන්තුවට ද හිමිවූ අතර, සේවා රෙජිමේන්තු ශූරතාවය යුද්ධ හමුදා පොලිස් බලකාය ද අනුශූරතාවය යුද්ධ හමුදා සේවා බලකාය ද හිමිකරගත්තේය. තරඟාවලියේ තුන් ඉරියව් දක්ෂතම වෙඩික්කරු ලෙස 3 විශේෂ බලකායේ ලාන්ස් කෝප්‍රල් සඳකැලුම් එච්ඒටී ද ධජ නිලධාරී අංශයේ දක්ෂතම වෙඩික්කරු ලෙස බ්‍රිගේඩියර් එච්ජීජීඑන්සී ප්‍රභාත් ආර්එස්පී යූඑස්පී ද දක්ෂතම ජ්‍යෙෂ්ඨ නිලධාරී ලෙස කර්නල් ඩීසීඑස්කේ අතුකෝරල ආර්එස්පී ද දක්ෂතම කාන්තා වෙඩික්කරු ලෙස යුද්ධ හමුදා කාන්තා බලකායේ කෝප්‍රල් දිසානායක කේඩීඑම්ඩී සහ ආධුනික අංශයේ දක්ෂතම වෙඩික්කරු ලෙස විජබාහු පාබල රෙජිමේන්තුවේ ලුතිනන් පීඩබ්ලිව්එස්එන් ජයසිංහ විසින් තරඟාවලියේ විශිෂ්ට දක්ෂතා දැක්වූහ.



රණබිමේ මතක

# "ලක ලැස්තිය"

දුර ගමනක් ගියත් ළඟ ගමනක් ගියත් හැමදේටම සූදානමින් යන එක රණවිරුවන්ගෙ හැටියක්. එහෙම යන යන තැන්වලින් අඩුමකුඩුම ආම්පන්න හොයන්නෙ නැතිව හැමදෙයක්ම කල්වේලා ඇතිව සූදානම් කරගන්න එකත් ඔවුන්ගෙ සිරිතක්. අතට පයට කොයිතරම් බර වැඩි උනත් අවශ්‍ය කිසිදෙයක් අහක නොදාන්නත් ඔවුන් වගබලා ගත්තා. තිස් අවුරුද්දක් තිස්සෙ ඒ පෙර සූදානම හරියට තිබුණ නිසයි රණවිරුවෝ තමන්ගෙ ජීවිත පරෙස්සම් කරගත්තෙත්. යුද්ධ භූමිය කොයිතරම් දුෂ්කර උනත් අදටත් සුන්දර මතක හැටියට ඉතිරිවෙලා තියෙන්නෙ ඒ අත්දැකීම් විතරමයි. යුද්දෙ කියන්නෙම එහෙම එකක්.



ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.